කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය
மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சு
Ministry of Women and Child Affairs

# ප්‍රගති වාර්තාව

# முன்னேற்ற அறிக்கை

# Progress Report

2025.01.01 - 2025.09.30

අයවැය කාරක සභා අවස්ථා විවාදය 2025
வரவு செலவுத் திட்டத்தின் குழு நிலை விவாதம் 2025
Committee Stage of the Budget Debate 2025

# ප්‍රගති වාර්තාව 2025

## කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය

# පටුන


| අනු අංකය | විස්තරය | පිටු අංකය |
|---|---|---|
| කාන්තා සහ ළමා කටයුතු ගරු අමාත්‍යතුමියගේ පණිවුඩය | | iv |
| කාන්තා සහ ළමා කටයුතු ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය | | v |
| කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශ ලේකම්තුමියගේ පණිවුඩය | | vi |
| 01 | අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර | 1 |
| 02 | නෛතික හා ප්‍රතිපත්තිමය ප්‍රවේශය | 2 |
| 03 | හැඳින්වීම | 3 |
| 04 | විෂයයන් හා කාර්යයන් - අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව | 4 – 5 |
| 05 | රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයන්හි අන්තර්ගත බැඳීම් | 6 – 8 |
| 06 | සංවිධාන ව්‍යුහය | 9 |
| 07 | අමාත්‍යාංශ ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ සාරාංශය | 10 |
| 08 | අයවැය යෝජනා 2025 ප්‍රගතිය | 11 |
| 09 | ළමා සංවර්ධන මධ්‍යස්ථාන ව්‍යාප්තිය | 12 |
| 10 | අමාත්‍යාංශය හා විෂයපථය යටතට ගැනෙන ආයතන | 13 |
| 10.1 | සංවර්ධන අංශය | 14-22 |
| 10.2 | සැලසුම් හා තොරතුරු තාක්ෂණ අංශය | 23-27 |
| 10.3 | මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය | 28-37 |
| 10.4 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 38-47 |
| 10.5 | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | 48-59 |
| 10.6 | ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය | 60-73 |
| 10.7 | ජාතික කාන්තා කමිටුව | 74-82 |

# වගු හා ප්‍රස්ථාර පටුන

වගු


| වගු අංකය | විස්තරය | පිටු අංකය |
|---|---|---|
| ප්‍රතිපාදන වෙන්වීම | | |
| 1 | සාරාංශ ප්‍රගතිය | 10 |
| 2 | රජයේ සහ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රගතිය | 12 |
| 3 | ළමා සංවර්ධන මධ්‍යස්ථාන ව්‍යාප්තිය - පළාත් අනුව | 12 |
| 4 | මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සතිය | 32 |
| 5 | "සිප් සවිය" ආධාර ලබා දීම | 40 |
| 6 | ලියාපදිංචි ළමා සමාජ සංඛ්‍යාව | 41 |
| 7 | ළමා මූලික අධ්‍යයන සඳහා ප්‍රතිපාදන යොමු කිරීම | 41 |
| 8 | ආන්තික ප්‍රජා දරුවන් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම | 44 |
| 9 | විදේශීය හදාවඩා ගැනීම් | 45 |
| 10 | ව්‍යවසායකත්ව සංවර්ධන ප්‍රතිලාභ සාරාංශය | 61 |
| 11 | ව්‍යවසායක කාන්තාවන් සඳහා වෙළඳපොල ප්‍රවර්ධනය | 62 |
| 12 | දිස්ත්‍රික් මට්ටමින් ව්‍යවසායකත්ව පුහුණු අවශ්‍යතා | 63 |
| 13 | තාවකාලික කාන්තා රැකවරණ නිවාස ව්‍යාප්තිය හා සේවාලාභීන් | 66 |
| 14 | ජාතික කාන්තා සතිය | 67 |
| 15 | ජාතික මානසික සෞඛ්‍ය දින සැමරුම් ප්‍රධාන වැඩසටහන | 68 |
| 16 | ජාතික මානසික සෞඛ්‍ය දින සැමරුම් - දිස්ත්‍රික් වැඩසටහන | 68 |
| 17 | ජාතික මානසික සෞඛ්‍ය දින සැමරුම් - ප්‍රාදේශීය වැඩසටහන | 68 |


ප්‍රස්ථාර


| ප්‍රස්ථාර අංකය | විස්තරය | පිටු අංකය |
|---|---|---|
| 01 | ළමා උපකාරක දුරකතන සේවය සඳහා ලද පැමිණිලි ජනගහනයෙන් 10,000 අනුපාතයට | 52 |
| 02 | කාන්තා උපකාරක දුරකතන සේවය සඳහා ලද පැමිණිලි ජනගහනයෙන් 10,000 අනුපාතයට | 79 |



## කාන්තා සහ ළමා කටයුතු ගරු අමාත්‍යතුමියගේ පණිවුඩය

කාන්තා සහ ළමා කටයුතු විෂය භාර අමාත්‍යවරිය ලෙස 2025 අමාත්‍යාංශ කාර්ය සාධන සහ ප්‍රගති වාර්තාව වෙත පණිවුඩයක් නිකුත් කරනුයේ සතුටිනි.

නව රජය පිහිටුවීමෙන් පසු කාන්තා සහ ළමා කටයුතු විෂය වෙත මින් පෙර නොවූ අවධානයක් සහ ප්‍රමුඛතාවයක් ලබා දෙමින් එය කැබිනට් අමාත්‍යාංශයක් බවට පත් කරන ලද්දේ මම, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමන් සහ අප අමාත්‍යාංශයේ නිලධාරීන් ඇතුලු කණ්ඩායම වෙත විශාල වගකීමක් සහ කාර්යයභාරයක් පවරමිනි.

මෙරට ජනගහනයෙන් වැඩි පිරිසක් නියෝජනය කරනු ලබන්නේ කාන්තාවන් සහ දරුවන් වන බැවින් අප විෂය පථය පුළුල් සහ සංවේදී බවක් උසුළයි. ඒ පිළිබඳව මනා අවබෝධයකින් ඉලක්ක රාශියක් පෙර දැරි කරගෙන අප 2025 වසරට පා තැබුවෙමු. එතැන් පටන් 2025 ජාතික අයවැය මඟින් වෙන් කෙරුණු ප්‍රතිපාදන සැලසුම් සහගත සහ කාර්යක්ෂම ක්‍රමවේද යටතේ සැබෑම ප්‍රතිලාභ අපේක්ෂකයින් වෙත ලබා දීමට අප පියවර ගත්තෙමු.

ඒ අනුව, “ඔබ භාර රටටයි - රට අයිති ඔබටයි” යන සංකල්පය තුළ පිහිටමින් ආයතනික රැකවරණයේ සහ භාරකරත්වයේ සිටින දරුවන් සහ වීදි දරුවන් වෙනුවෙන් ජීවන වියදම් දීමනාවක් ලබා දීම, ආයතනගතව සිට විවාහ වන තරුණ යුවල් සඳහා නිවාස ආධාර ලබා දීම වැනි සංවර්ධන වැඩසටහන් අප ආරම්භ කළෙමු. ළමුන්ගේ රැකවරණය සහ ආරක්ෂණය වෙනුවෙන් ද නෛතික, ප්‍රතිපත්තිමය සහ ව්‍යුහාත්මක වෙනස්කම් පිළිබඳ තීන්දු තීරණ ලබා ගත්තෙමු.

ග්‍රාමීය කාන්තාවන්, නාගරික කාන්තාවන්, වතු ආශ්‍රිත කාන්තාවන්, ධීවර ගම්මාන ආශ්‍රිතව වෙසෙන කාන්තාවන් සහ කාන්තා ගෘහ මූලික පවුල් යන සියලු කාණ්ඩ ආවරණය වන පරිදි ව්‍යවසායකත්ව සංවර්ධන ව්‍යාපෘති බිම් මට්ටම දක්වා රැගෙන ගියෙමු. ස්ත්‍රී - පුරුෂ සමාජභාවී ප්‍රචණ්ඩත්වය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැනි තත්ත්වයන් අවම කරමින් කාන්තාවන්ට ස්වාධීන සහ ගෞරවනීය ජීවිතයක් ගත කළ හැකි සුරක්ෂිත සමාජයක් ගොඩනැගීම වෙනුවෙන් අනෙකුත් අමාත්‍යාංශ සමඟ ද ඒකාබද්ධ වෙමින්, රජයේ සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ ද සහයෝගයෙන් කටයුතු කරමින් සිටින්නෙමු.

ශ්‍රී ලාංකික පුරවැසියන් තුළ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" පිළිබඳ වන බලාපොරොත්තුව යථාවත් කිරීමෙහි ලා ඵලදායී ප්‍රවේශයන් රැසක් ලබාගත් 2025 වසරටත් වඩා තව කිහිප ගුණයකින් ශක්තිමත්ව සහ කැපවීමෙන් යුතුව 2026 වසර ආරම්භ කිරීමට ද අපි අපේක්ෂාවෙන් සිටින්නෙමු.

**සරෝජා සාවිත්‍රි පෝල්රාජ්**
කාන්තා සහ ළමා කටයුතු අමාත්‍ය



## කාන්තා සහ ළමා කටයුතු ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය

අප විසින් නායකත්වය ගෙන ගෙවුන කාලය පිළිබඳ සමාලෝචනය කිරීමේදී රටෙහි ජීවය වන කාන්තා සහ ළමා පරපුර කෙරෙහි දැඩි මානුෂීය හා සමාජයීය වටිනාකමක් සහිත සාධනීය කාර්යභාරයක් ඉටු කර ඇති බව සිහිපත් කරමි. සමාජය තුළ මුල් බැසගෙන තිබූ ඇතැම් වැරදි සහගත ආකල්පයන් හා චර්යාවන් වෙනස් කිරීමේදී සමාජය තුළින්ම මතුව ආ අහේතුක විරෝධයන්ට මුහුණ දීමේදී අප අමාත්‍යාංශයට දැඩි බලපෑමක් එල්ල වූ අවස්ථා ද නොතිබුණා නොවේ.

නමුත් "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" නිර්මාණය කරන්නට විවර කරගත් මාර්ගය තුළ දරුවන්ට හා කාන්තාවන්ට යහපත් ජීවිතයක් නිර්මාණය කිරීමේදී හැරවුම් ලක්ෂ නොමැති බව අපි අවධාරණය කරමු.

ගෙවුන කාලය තුළ සියලුම ආණ්ඩු යටතේ සිදු වූ ගතානුගතික යාන්ත්‍රික තීන්දු තීරණ නැවත සමාලෝචනය කර ගනිමින් ඉදිරි වසර සඳහා සපුරාගත යුතු සාධනීය ඉලක්කයන් අතික්‍රමණය කිරීමට අප සතුව ඉතා හොඳ මානව සම්පතක් පවතින බව සිහිපත් කරමි. ඔවුන්ට නිවැරදි නායකත්වය හා මඟපෙන්වීම ලබා දී කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය අප රට තුළ සුවිශේෂම අමාත්‍යාංශ අතරට ගෙන ඒම ඉදිරි වසර තුළ අප සතුව ඇති ප්‍රධානම ඉලක්කය වේ. ඒ සඳහා අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධාන ආයතනයන් පහ හා ආයතන ප්‍රධානීන් සහ සියලුම මානව සම්පත හොඳින් කළමනාකරණය කර ගත යුතු ය. ඔවුන් අමාත්‍යාංශය සතුව ඇති ඉලක්ක සපුරා ගැනීමට දරන වෙහෙස ප්‍රශස්ත කටයුතු ය. කාන්තා සහ ළමා පරපුර කෙරෙහි ඔවුන් දක්වන සංවේදී බව හා සහකම්පනය අමාත්‍යාංශය ලෙස අපගේ ඉලක්ක සමඟ හොඳින් පැහෙන බැවින්, අප ඉදිරියේ ඇති අභියෝග ජයගැනීම දුෂ්කර නැත. අනෙක් රාජ්‍ය සේවකයන්ට එහා ගිය ගෞරවනීය වෘත්තිකයන් පිරිසක් වන අප ආයතනයේ සියලු නිලධාරී මහත්ම මහත්මීන් රැකියා ස්ථානය වඩා සුවපහසු තැනක් බවට පත් කරමින් ඔවුන්ගේ උපරිම සේවය සමාජ සංවර්ධනයට දායක කරගැනීමේ වගවීම ද අප සතුය.

**වෛද්‍ය නාමල් සුදර්ශන**
කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍ය



## කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශ ලේකම්තුමියගේ පණිවුඩය

2025 වර්ෂයේ කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශ වාර්ෂික ප්‍රගති වාර්තාවට පණිවුඩයක් ලබාදීම මා ලද සුවිශේෂී අවස්ථාවක් බව සලකමි.

කාන්තා සහ ළමා කටයුතු යන විෂය හරහා සමස්ත ශ්‍රී ලංකේය ජනතාව අතරින් වැඩි ප්‍රතිශතයක් නියෝජනය කරන කාන්තාවන් හා ළමුන් වෙත සේවා සැපයීමට මෙම අමාත්‍යාංශයට අවස්ථාව හා හැකියාව පැවති බව මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතුමය.

2025 වර්ෂය තුළ අන් කවර වසරකටත් වඩා ආන්තික, අවදානම් හා නිවාසගත වූ ළමුන්ගේ ආරක්ෂාව, සුබසාධනය හා රැකවරණය වෙනුවෙන් කැපවී ක්‍රියාත්මක කළ කාර්යයන් රාශියක් විය. ඒ අතරින් නිවාසගත රැකවරණය අහිමි දරුවන් සඳහා මාසිකව රු. 5,000/-ක දීමනාව ලබා දීමේ “අර්ථ” වැඩසටහන නව්‍ය හා නිසැකවම සිදුවිය යුතු වැඩසටහනක් බව කිව යුතුය.

එවන් වූ තවත් නව්‍ය වැඩසටහනක් ලෙස ආයතනගතව සිට වයස අවුරුදු 18 සම්පූර්ණ වී සමාජගත වූවන් අතරින් විවාහ වයසේ පසුවන හෝ විවාහවීමට අපේක්ෂිත අඩු ආදායම්ලාභී තරුණ, තරුණියන් සඳහා නිවාස පහසුකම් සපයා ගැනීමට මූල්‍යාධාර ලබාදීමේ “ප්‍රාර්ථනා” වැඩසටහන ද ඉතා කාලෝචිත වූ සංකල්පයකට අවතීර්ණ වීමක් ලෙස හැඳින්වීමට හැකිය.

රජයේ නව ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව ඉලක්කගත ප්‍රවේශයන් 43ක් හරහා කාන්තාවන්ට හා ළමුන්ට ආරක්ෂාව, රැකවරණය, අයිතිවාසිකම් හා සංවර්ධනය තහවුරු කරනු පිණිස විශේෂ වැඩසටහන් රැසක් ඉටු කිරීමට මෙම වර්ෂයේ දී අමාත්‍යාංශයට හැකියාව ලැබුණු බව සතුටින් සඳහන් කරනු කැමැත්තෙමි.

වෙනත් වසරවලට වඩා වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් මත මෙන්ම නව්‍ය වූ වැඩසටහන් රැසක්ද සමඟ අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතනවල කාර්ය මණ්ඩලය ඉටු කළ සේවය පැසසුම් සහගතය.

රජයේ ප්‍රමුඛ අවශ්‍යතාවයක් වන රාජ්‍ය සේවා ඩිජිටල්කරණය හා සමගාමීව කාන්තා සහ ළමා කටයුතු ඩිජිටල්කරණය වෙනුවෙන් ආරම්භක පියවර තැබීමට හැකියාව ලැබීම ද අගය කළ යුතු කාර්යයකි.

සමස්තයක් ලෙස ගත් කළ 2025 වර්ෂය තුළ අමාත්‍යාංශය අත්කරගත් සමස්ත මූල්‍ය හා භෞතික ප්‍රගතිය ඉතා ප්‍රශංසනීය වන අතර, 2026 වර්ෂයේදී ද කාන්තාවන්ට හා ළමුන්ට හිතකර සමාජයක් ඇති කිරීමට අමාත්‍යාංශය අඛණ්ඩ පියවර ගනු ලබන බව සඳහන් කරනු කැමැත්තෙමි.

**තරංගනී වික්‍රමසිංහ**
කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශ ලේකම්

# 1 - අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර

## දැක්ම

කාන්තාවන් හා ළමුන් සංවර්ධනයේ පූර්ණ ප්‍රතිලාභ හා අවස්ථාවන් සාධාරණව හා සමානව භුක්ති විඳින උසස් සමාජයක්.

## මෙහෙවර

ජාතික ප්‍රමුඛතා හා අවශ්‍යතා මෙන්ම ජාත්‍යන්තර ප්‍රමිතීන් ද සැලකිල්ලට ගනිමින් කාන්තාවන් හා ළමුන්ගේ ආර්ථික සවිබලගැන්වීම හා සමාජ ආරක්ෂණය සඳහා අවශ්‍ය නෛතික, ප්‍රතිපත්තිමය, ආයතනික හා මානව සම්පත් වැඩිදියුණු කිරීම සඳහා වූ වැඩසටහන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.

# 2. නෛතික හා ප්‍රතිපත්තිමය ප්‍රවේශය

අංක 2412/08 , 2024 නොවැම්බර් 25- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට්පත්‍රය අනුව

*-විෂයන් හා කාර්යයන් - 22*

- කාන්තා ප්‍රඥප්තිය - 1993
- ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ පනත 2005 අංක 34
- කාන්තා සවිබලගැන්වීමේ පනත 2024 අංක 37
- ස්ත්‍රී - පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය හා කාන්තා සවිබල ගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය
- ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත 1998 අංක 50
- ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය
- ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය
- මුල් ළමාවිය සංවර්ධන ජාතික ප්‍රතිපත්තිය
- විකල්ප රැකවරණ ජාතික ප්‍රතිපත්තිය
- ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

කාන්තා සහ ළමා විෂයට අදාළව එකඟ වී ඇති/ සම්බන්ධිත ජාත්‍යන්තර ගිවිසුම්, බැඳීම් හා සම්මුතීන්

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයෙහි අන්තර්ගත බැඳීම් - 43

ආයතනික ප්‍රතිඵල රාමුව -ප්‍රධාන නිමැවුම් 6 ක් හා ප්‍රතිඵල-22



# 3 - හැඳින්වීම

නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුගත වෙමින් කාන්තා හා ළමා විෂය ක්ෂේත්‍රය තුළ සුවිශේෂී කර්තව්‍යයන් රැසක් ඉටු කර ජයග්‍රහණයන් අත් කර ගැනීමට මෙම වසරේ දී අමාත්‍යාංශයට හැකි විය.

රටේ ජනගහනයෙන් 65%කට වැඩි ප්‍රතිශතයක් නියෝජනය කරන ළමුන් සහ කාන්තාවන් වෙනුවෙන් අත්‍යාවශ්‍ය සේවා හා පහසුකම් රාශියක් නව්‍ය ක්‍රියාකාරකම් හරහා ළඟා කර ගැනීමට හැකි වූ වසරක් ලෙස 2025 වර්ෂය හැඳින්විය හැකිය. එසේම අමාත්‍යාංශයේ සියලු ආයතන හා දෙපාර්තමේන්තු බාහිර පාර්ශ්ව ආයතන සමඟ එක්ව නීති, ප්‍රතිපත්ති, දීර්ඝ කාලීන සැලසුම් හා වැඩසටහන් සකස් කර ක්‍රියාවට නැංවීමට කටයුතු කර ඇත. සෘජුවම අමාත්‍යාංශය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය හා ජාතික කාන්තා කමිටුව හරහා එම කාර්යයන් සිදු විය.

ජාතික ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය පිළිබඳ පස් අවුරුදු සැලැස්ම 2025-2029 සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු අතර, එහි ඉදිරි ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට ද මෙම වසර තුළ හැකිවීම ජයග්‍රහණයක් සේ සැලකිය හැකිය.

ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මඟින් කාන්තාවන්ගේ ආර්ථික උන්නතිය සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්වය වෙනුවෙන් නව්‍ය වූ වැඩසටහනක් සමස්ත දිවයිනම ආවරණය වන සේ ඇරඹීම ද සුවිශේෂී කර්තව්‍යයකි. සමස්ත කාන්තාවන්ගේ ආරක්ෂාව, රැකවරණය සම්බන්ධයෙන් සංවේදීව හා ඉලක්කගතව ක්‍රියාත්මක වීමට සුදුසු වටපිටාවක් නිර්මාණය කරමින් කාන්තා රැකවරණ නිවාස, උපදේශන මධ්‍යස්ථාන ඇතුළු උපදේශන සේවා මෙන්ම උපකාරක දුරකථන සේවාවන් ද නිසි මඟ පෙන්වීම මත අන් කවර වසරකටත් වඩා වූ ප්‍රතිපාදන වෙන් කිරීම් මත අඛණ්ඩ හා ගුණාත්මකව පවත්වාගෙන යාමේ පියවර රැසක් මෙම වසර තුළ ගැනීමට අමාත්‍යාංශයට හැකි විය.

තවද 2025 සමස්ත අයවැය යෝජනා මඟින් සෘජුව ප්‍රතිපාදන වෙන් වූ මෙන්ම එසේ වෙන් නොවූ කාර්යයන් හරහා ද අනාථ, අසරණ, අත්හල හා ඇස නොගැටෙන දරුවන්ගේ ජීවිත සුරක්ෂිත කිරීමට සුවිශාල වපසරියක් තුළ ක්‍රියාත්මක වීමටද මෙම අමාත්‍යාංශයට හැකිවිය. දීර්ඝ කාලීනව දැඩි අවශ්‍යතාවයක්ව පැවති වින්දිත දරුවන් ප්‍රවාහනයේ දී ඇතිවන ගැටළු විසඳීම සඳහා අදාළ කාර්යයටම යෙදවෙන පරිදි දරුවන්ට සුවිශේෂී ප්‍රවාහන සේවාවක් ලබා දීමට පළාත් මට්ටමේ ආයතන වෙත වාහන පහසුකම් සැලසීමට හැකිවීම ද සාධනීය පියවරක් සේ සැලකිය හැකිය.

එමෙන්ම ඒකාබද්ධ අරමුදලෙන් ලබා දෙන අයවැය ප්‍රතිපාදනවලට අමතරව, විදේශීය නියෝජිතායතන හා පාර්ශ්ව ආයතනවල මැදිහත් වීම මත, දරුවන්ගේ හා කාන්තාවන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් ඉටුකළ කාර්යභාර්යන් තුළින් ලද ජයග්‍රහණ ද රැසකි.

ළමුන්ගේ ආරක්ෂාව, රැකවරණය වෙනුවෙන් ක්‍රියාත්මක වන බහුපාර්ශ්වීය ඒකාබද්ධ ප්‍රවේශයෙන් යුතු යාන්ත්‍රණයක් සකස් කිරීම හා ඒ ඔස්සේ විවිධ දිශානතීන් හරහා දරුවන්ට හා දෙමාපියන්ට ධනාත්මක ප්‍රතිඵල රැසක් ළඟා කර දීමට ද අමාත්‍යාංශයට හැකිවිය.

2025 වසර අවසන් වන විට සමස්ත භෞතික හා මූල්‍ය ඉලක්කයන් අපේක්ෂිත මට්ටමින් ඉටුකර ගැනීමට හැකිවන බව පුරෝකථනය කළ හැකි අතර, 2026 වසරේදී ද ඉලක්කගත කාර්යයන් නව්‍ය මුහුණුවරකින් ඉටුකිරීමට අපේක්ෂා කරන බව ද සඳහන් කරමු.

# 4 - විෂයයන් හා කාර්යයන්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2412/08 හා 2024.11.25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය ස්ථාපිත විය. අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් හා කර්තව්‍යයන් පහත පරිදි වේ.

1. රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා කාන්තා හා ළමා කටයුතු විෂයයන්ට අයත් දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම.
3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
4. කාන්තා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.
5. රාජ්‍ය කටයුතුවලදි තීරණ ගැනීම සහ දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ගේ සහභාගිත්වය සහ නියෝජනය වැඩි කිරීම සඳහා ක්‍රමෝපායන් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම.
6. ගැටුම්වලින් හා දරිද්‍රතාවයෙන් විපතට පත් කාන්තාවන් සවිබලගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
7. කාන්තා හා ළමා හිංසනය වැළැක්වීම සඳහා වන නීති හා ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
8. ලිංගිකත්වය හා ස්ත්‍රී - පුරුෂ සමාජභාවය මත කාන්තාවන්ට වෙනස් කොට සැලකීම වළක්වාලීම සඳහා පවත්නා නීති සංශෝධනය කර නව නීති හා ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම.
9. කාන්තා මූලික ගෘහ ඒකක සවිබලගැන්වීම සඳහා ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම.
10. කාන්තා හා ළමා කටයුතුවලට අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටු කර ගැනීම.
11. දේශපාලන ව්‍යුහයන් තුළ ස්ත්‍රීන්ගේ නියෝජනය අවම වශයෙන් 50%ක් දක්වා ගෙන ඒමට අවශ්‍ය නීති සහ ප්‍රතිපත්ති ක්‍රමිකව හඳුන්වා දීම.
12. ආර්ථව දරිද්‍රතාව අවසන් කිරීම වෙනුවෙන් අවශ්‍ය බදු සහන, මූල්‍ය සහ අනෙකුත් පහසුකම් ලබා දීම.
13. ස්ත්‍රීන්ගේ වැටුප් නොලබන සුරැකුම් ශ්‍රමයේ බර අඩු කිරීම.
14. ශාරීරික හා මානසික වශයෙන් නිරෝගී දරුවන් ඇති කරලීමේ අභිප්‍රායෙන් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කිරීම.
15. අනාරක්ෂිත තත්ත්වයේ සිටින දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ජාත්‍යන්තර සම්මතයන්ට ගැළපෙන සේ වැඩසටහන් හා ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීම.
16. ළමා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.
17. ළමා සුරැකුම් මධ්‍යස්ථාන නියාමනය කිරීම.
18. සෙවන සරණ කැපකරු මව්පිය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
19. සුවිශේෂී කුසලතා ඇති දරුවන්ගේ එම කුසලතා ඔප්නංවා ගැනීම සඳහා මූල්‍යාධාර සැපයීම.
20. ස්ත්‍රීන්ට සහ දරුවන්ට වෙනස්කොට සලකන හා පීඩාවට ලක්කරන විශේෂ නීති සංශෝධනය කිරීම.

21. පහත දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු.
22. එම ආයතනයන් අධීක්ෂණය කිරීම.

වගකීම් පැවරෙන අංශ/ දෙපාර්තමේන්තු

i. මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය
ii. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
iii. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
iv. ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය
v. ජාතික කාන්තා කමිටුව

තවද ඉහත ආයතන සඳහා අවශ්‍ය පරිපාලන හා මෙහෙයුම් සහාය ලබා දීමට ආයතන අංශය, අභ්‍යන්තර විගණන අංශය, සංවර්ධන අංශය, ගිණුම් සහ සැලසුම් හා තොරතුරු තාක්ෂණ අංශය ක්‍රියාත්මක වේ.

මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක දෙපාර්තමේන්තු, ආයතන හා අංශ පිළිබඳවත් 2025 වර්ෂයට අදාළව අනුමත වී ඇති ප්‍රතිපාදන පිළිබඳවත් 2025.09.30 දක්වා ලබා ගෙන ඇති මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිබඳ තොරතුරු මෙම වාර්තාව තුළ අන්තර්ගත වේ.


## 5. රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයෙහි අන්තර්ගත බැදීම්

1. අවුරුදු 03 සිට 05 දක්වා වන සියලු දරුවන් සඳහා විධිමත් මුල් ළමාවිය සංවර්ධන අධ්‍යාපනයක්.
2. සෑම දරුවෙකුටම සිය නිවසේ සිට හෝ දෙමාපියන්ගේ සේවා ස්ථානයේ සිට කි.මී. 02ක් ඇතුළත මුල් ළමාවිය සංවර්ධන අධ්‍යාපන මධ්‍යස්ථානයක්.
3. දරුවන්ගේ කායික හා මානසික තත්ත්වයන්ට ගෝචර වන පරිදි හා සමාජ ජීවිතයට පිවිසීමට අවශ්‍ය වන යහපත් පුරුදු, ආකල්ප හා ආචාරධර්ම වර්ධනය කරන ක්‍රියාකාරකම් ඇතුළත්වන වැඩසටහන්.
4. මව් භාෂාවට අමතරව කථන සන්නිවේදන භාෂා ලෙස ඉංග්‍රීසි ඇතුළු අනෙක් ජාතික භාෂා වැඩසටහන්
5. බහුසංස්කෘතික විවිධත්වයට කටයුතු කිරීමට හුරු කරවන වැඩසටහන්.
6. මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන නියාමනය කිරීම සඳහා ජාතික මුල් ළමාවිය සංවර්ධන නියාමන ආයතනයක්.
7. මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පාලක පාලිකාවන් සහ ගුරුවර ගුරුවරියන් සඳහා අවම අධ්‍යාපන සුදුසුකම්, අනිවාර්ය වෘත්තීය පුහුණුව සහ ප්‍රමාණවත් අවම වැටුපක්.
8. මුල් ළමාවිය සංවර්ධන වෘත්තිකයන් පුහුණු කිරීම සඳහා විධිමත් ජාතික ආයතනයක් හා ශාඛා පද්ධතියක්.
9. කාන්තා මූලික පවුල්, තනි මාපිය පවුල් සහ ගෘහස්ථ හිංසනයෙන් පීඩාවට පත් වූ කාන්තාවන් සඳහා ඔවුන් ගේ ආදායම් මට්ටම හා අවශ්‍යතා මත පදනම් වූ මූල්‍ය ආධාර.
10. අවශ්‍යතා සහ ඉල්ලීම් මත පදනම්ව නීති ආධාර සහ උපදේශන සේවා
11. අවශ්‍ය අවස්ථාවන්හිදී විකල්ප නවාතැන් පහසුකම්, රැකියා සහ වෙනත් ආධාර
12. වැන්දඹුභාවය, ගෘහස්ත ප්‍රචණ්ඩත්වය ආදිය නිසා පීඩාවට පත් කාන්තාවන්ට සමාජීය සහ චිත්තවේගීය සහාය සහතික කිරීම සඳහා යාන්ත්‍රණයක්.
13. අඩු ආදායම්ලාභී පවුල්වල ගැබිනි මව්වරුන්ට තම ගර්භනී සමයේ දී සහ දරු ප්‍රසූතියේ පළමු වසර තුළ පෝෂණ ආහාර පැකේජයක් සඳහා මූල්‍යාධාර.
14. රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයේම දායකත්වයෙන් අවශ්‍යතා සහ ඉල්ලීම් මත පදනම්ව ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවීම
15. ළමා රැකවරණය සඳහා දැනට තිබෙන සුදුසුකම් සහිත ආයතන ලියාපදිංචිකර පහසුකම් ලබාදීම.
16. ළමා රැකවරණ ආයතන ඵලදායි කළමණාකරණය සඳහා අදාළ කාර්ය මණ්ඩලය සඳහා පුහුණුව ලබාදීම සහ ඒවා අධීක්ෂණය.
17. ළමා රැකවරණ ආයතන සඳහා වෘත්තීය සේවා සැපයීමට සමාජ සේවා/ සංවර්ධන නිලධාරීන් පත් කිරීම සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ලෙස එවැනි සේවා සපයන පෞද්ගලික ආයතන දිරිමත් කිරීම.
18. කාන්තාවන්ට විධායක හා කළමනාකරණ ක්ෂේත්‍රවල ඵලදායී ලෙස රැකියාවේ නියැලීමට ඇති බාධා ඉවත් කිරීම.
19. රැකියා වෙළඳපොළට ප්‍රවේශ වීමට අපහසුතා ඇති හෝ ඒ සඳහා රුචිකත්වයක් නොදක්වන කාන්තාවන්ට සහ ආබාධ සහිත පුද්ගලයින්ට ඔවුන්ගේ අභිමතය මත නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධවීමට ඉඩප්‍රස්ථා
20. ස්ත්‍රීන්ට ඉඩම් අයිතිය අවාසිදායක ලෙස බලපාන නීතිමය හා ප්‍රායෝගික ගැටලු නිරාකරණය කිරීම.
21. ස්ත්‍රීන්ගේ ව්‍යවසායකත්ව අවස්ථා ඉහළ නැංවීම සඳහා ඔවුන්ට අවශ්‍ය බැංකු හා මූල්‍ය පහසුකම්.
22. ස්ත්‍රීන්ගේ වැටුප් නොලබන සුරැකුම් ශ්‍රමයේ බර අඩු කිරීම.

23. දේශපාලනය තුළ ස්ත්‍රී සහභාගීත්වය ඉහළ නැංවීම සඳහා ස්ත්‍රීන්ට දේශපාලන අධ්‍යාපනය ලබා දීම, ඔවුන් සංවිධානගත කිරීම.
24. දේශපාලන ව්‍යුහයන් තුළ ස්ත්‍රීන්ගේ නියෝජනය අවම වශයෙන් 50% දක්වා ගෙන ඒමට අවශ්‍ය නීති සහ ප්‍රතිපත්ති ක්‍රමිකව හඳුන්වා දීම.
25. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අවශ්‍යතාවලට සංවේදී ලෙස අධ්‍යාපනය, සෞඛ්‍ය, ප්‍රවාහනය ආදී පොදු සේවා ශක්තිමත් කිරීම තුළින් ස්ත්‍රීන් මුහුණ දෙන දුෂ්කරතා අවම කිරීම.
26. ආරක්ෂිතව ගර්භනීභාවය අවසන් කිරීම සම්බන්ධයෙන් 2012 නීති කොමිසම මඟින් ඉදිරිපත් කළ යෝජනා ක්‍රියාත්මක කිරීම.
27. ආර්ථව දරිද්‍රතාව (Period Poverty) අවසන් කිරීම වෙනුවෙන් අවශ්‍ය බදු සහන, මූල්‍ය සහ අනෙකුත් පහසුකම් ලබාදීම.
28. සේවා ස්ථානයේ, පොදු ප්‍රවාහනයේ ඇතුළු සියලු තැන්හි ස්ත්‍රී පුරුෂ සමාජභාවීය පදනමින් සිදුවන ප්‍රචණ්ඩත්වයෙන් හා හිංසනයෙන් තොරව ජීවත් වීමට ඇති අයිතිය තහවුරු කරන ආකාරයට නීති සහ කාර්ය පටිපාටීන් සංශෝධනය කිරීම.
29. ස්ත්‍රීන්ට, දරුවන්ට සහ අනෙකුත් ආන්තික කණ්ඩායම්වලට වෙනස් කොට සලකන හා පීඩාවට පත්කරන දණ්ඩ නීති සංග්‍රහයේ 365 හා 365 (අ) නීති සංශෝධනය කිරීම.
30. ළමා වින්දිතයින්ගේ සාක්ෂි විමසීම සඳහා සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම හා දැනට පවතින විමර්ශන ක්‍රමය වැඩි දියුණු කිරීම මඟින් ඔවුන් නැවත වින්දිතයන් වීම අවම කිරීම.
31. අවදානමට ලක්ව සිටින දරුවන් හඳුනා ගැනීම සහ පවුල්වලින් අනවශ්‍ය ලෙස වෙන්වීම වැළැක්වීම සඳහා පවුල පදනම් කරගත් රැකවරණය සහ සහාය ලබාදීම.
32. නීතිමය කටයුතු සඳහා දරුවන් ප්‍රවාහනයේදී ආරක්ෂිත සහ ගෞරවනීය ප්‍රවාහනය සහතික කිරීම සඳහා ළමා හිතකාමී ප්‍රවාහන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.
33. සම්බන්ධීකරණය විධිමත් කිරීම සහ එම ආයතනවල ධාරිතා සංවර්ධනය.
34. ළමා අපචාර සිද්ධීන් වාර්තා කිරිම සහ නිසි පසු විපරමක් සහතික කිරීම සඳහා කාර්යක්ෂම සහ ප්‍රතිචාරාත්මක සේවාවක් ස්ථාපිත කිරීම.
35. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ළමා කටයුතු සම්බන්ධ ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණු කර දරුවන් අවදානමට ලක්ව ඇති පවුල් වෙත ඍජු සේවා සැපයීම සඳහා යොමු කිරීම.
36. ආබාධ සහිත ළමයින්, වීදි දරුවන් සහ පාසල් නොයන ළමයින් ඇතුළු අවදානම් සහිත දරුවන් කල්තියා හඳුගැනීමට සහ ඔවුන් වෙනුවෙන් මැදිහත් වී කටයුතු කිරීම සඳහා ශක්තිමත් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.
37. විකල්ප රැකවරණයක් අවශ්‍ය සෑම දරුවකුටම පවුල පදනම් වූ පරිසරයන් තුල රැකවරණය සහ ස්ථාවරත්වය ලැබෙන බව සහතික කිරීම සඳහා කැපකරු සත්කාර ක්‍රමයේ පුළුල් ප්‍රතිසංස්කරණ.
38. ළමුන්ගේ මනෝ සමාජීය සහ මානසික සෞඛ්‍ය ගැටළු කල්තියා හඳුනා ගැනීම සහ වැළැක්වීම සඳහා පාසල් සහ ප්‍රජා මූලික වැඩසටහන්.
39. ආබාධ සහිත දරුවන්ට උසස් තත්ත්වයේ, දැරියහැකි, අන්තර්කරණීය සහ පහසු ප්‍රවේශ්‍යතාව සහිත මුල් ළමාවිය අධ්‍යාපනයක් ලබා දීම.

40. විද්‍යුත් ප්‍රසම්පාදනය සහ ශක්තිමත් මහජන අධීක්ෂණ යාන්ත්‍රණයක් ඇතුළුව ඩිජිටල් පාදක පාලනය හරහා රාජ්‍ය මූල්‍ය කාර්යක්ෂමතාව, විනිවිදභාවය, පරිපාලනය සහ වගවීම වැඩිදියුණු කිරීම සහ අනවශ්‍ය රාජ්‍ය වියදම් ඉවත් කිරීම.
41. පුරවැසියන්ට විනිවිදභාවයෙන් යුතු, කාර්යක්ෂම සේවාවන් සපයන ප්‍රතිචාරාත්මක රාජ්‍ය අංශයක් නිර්මාණය කිරීම සඳහා රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය කිරීම.
42. ඩිජිටල්කරණය, කාර්ය සාධන කලමනාකරණය සහ පුරවැසි නියැලීම යන සංකල්පයන් සැලකිල්ලට ගනිමින් වත්මන් රාජ්‍ය කළමනාකරණය නව රාජ්‍ය කලමනාකරණ ක්‍රම දක්වා පරිවර්ථනය කිරීම.
43. කාන්තා රැඳවියන් සමඟ බන්ධනාගාරවල සිටින ඔවුන්ගේ දරුවන් සඳහා අධ්‍යාපනය, සෞඛ්‍ය සහ අනෙකුත් සේවා පුළුල් කිරීම.

# 6. සංවිධාන ව්‍යුහය


කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය
ගරු අමාත්‍ය
ගරු නියෝජ්‍ය අමාත්‍ය
ලේකම්
දෙපාර්තමේන්තු/ව්‍යවස්ථාපිත
අතිරේක ලේකම් (පාලන) (ශ්‍රී ලං.ප.සේ විශේෂ) (1)
අතිරේක ලේකම් (සංවර්ධන) (ශ්‍රී ලං.ප.සේ
ප්‍රධාන මූල්‍ය නිලධාරී (ශ්‍රී ල.ග.සේ විශේෂ) (1)
අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රමසම්පාදන) (ශ්‍රී ල.ක්‍ර.සේ විශේෂ) (1)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ශ්‍රී.ලං.ප.සේ) (1)
අධ්‍යක්ෂ සංවර්ධන (ශ්‍රී.ල.ප.සේ) (1)
අධ්‍යක්ෂ (කාන්තා කාර්යාංශය ) (ශ්‍රී.ල.ප.සේ)
අධ්‍යක්ෂ (මුල්ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්.) (ශ්‍රී.ල.ප.සේ(1)
ප්‍රධානගණකාධිකාරී (ශ්‍රී.ල.ග.සේ I) (1)
අධ්‍යක්ෂ (සැලසුම්) (ශ්‍රී.ල.ක්‍ර.සේ) (1)
ප්‍රධාන අභ්‍යන්තර විගණක (ශ්‍රී.ල.ග.සේ/I) (I)
පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
ජාතික කාන්තා කමිටුව
සහකාර ලේකම් (පාලන) ශ්‍රී ල.ප.සේ (II/III) (2)
නීති නිලධාරී (දෙපාර්ත මේන්තුගත ( /II III)(2)
නි.අධ/ සහකාර අධ්‍යක්ෂ සංවර්ධනශ්‍රී. ල.ප.සේ(II/III ) (1)
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී ලං ප.සේ (II/III) (3)
නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ) (II/III) (4)
ගණකාධිකාරී ( ශ්‍රී ල.ග.සේ (II/III) (2)
නියෝජ්‍ය සහකාර/ අධ්‍යක්ෂ (සැලසුම්) ශ්‍රී ල.ක්‍ර.සේ
නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (තො.තා) (I)
අභ්‍යන්තර විගණක (ශ්‍රී ල.ග.සේ (II/III) (1)
පරිපාලන නිලධාරී (ක.සේ. නි.සේ. අධි පන්තිය) (1)
භාෂා පරිවර්තකක ශ්‍රී ලංකා භාෂා පරිවර්තන සේවය(I/විශේෂ)
උපදේශන නිලධාරී (I/II) දෙපාර්තමේන්තුග
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
සහාය කාර්ය මණ්ඩලය (තොරතුරු තාක්ෂණ නිලධාරී/සංවර්ධන නිලධාරී/ වනිතා සංවර්ධන ක්ෂේත්‍ර සහකාර/පුස්තකාලයාධිපති/ කළමනාකරණ සේවා නිලධාර / තොරතුරු තාක්ෂණ සහකාර/ පිළිගැනීමේ නිලධාරී /නේවාසිකාගාර පාලිකා/ වීඩියෝ කැමරා ශිල්පී/ රියදුරු,කාර්යාල කාර්යය සහායක ඇතුළු

## 7. අමාත්‍යාංශ ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ සාරාංශය

**මෙම අමාත්‍යාංශය සඳහා වැය ශීර්ෂය 171 යටතේ ද, පරිවාස සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සඳහා වැය ශීර්ෂය 217 යටතේ ද ප්‍රතිපාදන වෙන් වී තිබුණි.**

**කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයේ සමස්ත ප්‍රතිපාදන හා 2025.09.30 දක්වා වූ මූල්‍ය ප්‍රගතිය පහත පරිදි වේ.**

වගුව **1 -** ප්‍රතිපාදන වෙන්වීම සාරාංශ ප්‍රගතිය

| වියදම් විස්තරය | 2025 වර්ෂය සඳහා අනුමත ප්‍රතිපාදන (රු.මි.) | 2025.01.01. සිට 2025.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|
| **කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය - වැය ශීර්ෂ 171** | | | |
| ප්‍රාග්ධන | 1,013.000 | 81.387 | 8.03 |
| පුනරාවර්තන | 14,775.000 | 8,554.781 | 57.90 |
| **උප එකතුව** | **15,788.000** | **8,636.168** | **54.70** |
| **පරිවාස සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව - වැය ශීර්ෂ 217** | | | |
| ප්‍රාග්ධන | 79.000 | 26.831 | 33.96 |
| පුනරාවර්තන | 459.000 | 353.837 | 77.09 |
| **උප එකතුව** | **538.000** | **380.668** | **70.76** |
| **මුළු එකතුව** | **16,326.000** | **9,016.836** | **55.23** |

# 8. අයවැය යෝජනා 2025 ප්‍රගතිය

| යෝජනා අංකය | යෝජනාව | 2025 ඇස්තමේන්තුව (රු. මි.) | ප්‍රගතිය/ විස්තරය |
|---|---|---|---|
| 17 | අනාථ, අඩු ආදායම්ලාභී තරුණ විවාහක යුවළයන් සඳහා නිවාස සඳහා මූල්‍ය ආධාර ලබා දීම *(එක් ප්‍රතිලාභියෙක්ට නිවසක් තනා ගැනීමට රුපියල් ලක්ෂ 10.000 ප්‍රමාණවත් නොවීම, හා ප්‍රතිලාභීන්ට ඉඩම් මිලදී ගැනීමට ද මෙම ප්‍රතිපාදන විවෘත වීම අවශ්‍ය වේ -2026 දී සැලකිල්ලට ගැනීමට යෝජිතයි)* | 1000 | ඉල්ලුම්කරුවන්ගේ ඉඩම් ඔප්පු 14ක් සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව නිරවුල් සහතික ලබා දී ඇත. ඒවා නැවත විමර්ශනය කර නිර්දේශ ලබා දීමට පළාත් පරිවාස දෙපාර්තමේන්තු වෙත යොමු කර ඇත. |
| 21 | ආයතනික රැකවරණය, භාරකාරත්වය යටතේ සිටින දරුවන් හා වීදි දරුවන් සඳහා ජීවන දීමනාව | 1000 | 6708ක් ළමුන්ට මෙවන විට ප්‍රතිලාභ හිමිව ඇත.<br>2025 ජනවාරි මස සිටම දීමනා ගෙවීමට හා 2026 වසරට ද වැඩසටහන ක්‍රියාවට නැංවීමට අමාත්‍යමණ්ඩල අනුමැතිය ලැබී ඇත. |
| 28 | සහතික කළ පාසල්/ පුනරුත්තාපන නිවාස හා ළමා සංවර්ධන මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම | 500 | රු. මි. 250.88ක ප්‍රතිපාදන ( උතුරු, උතුරු මැද, ඌව, සබරගමුව හා නැගෙනහිර පළාත් වෙත මුදල් කොමිෂම හරහා නිදහස් කර ඇත. ඉතිරි ප්‍රතිපාදන යොදා ගැනීම පිළිබඳ ඒකාබද්ධ සාකච්ඡාව අනුව ව්‍යාපෘති යෝජනා කඩිනමින් සකස් කෙරේ. |
| 38 | ළමා වැරදිකරුවන් සඳහා ප්‍රවාහන පහසුකම් | 250 | වාහන 9ක් පළාත් වෙත ලබා දීමට කටයුතු කෙරේ. වාහන ආනයන ආයතනයකට ටෙන්ඩර් ප්‍රදානය කර ඇත. |
| 39 | ඔටිසම් දරුවන් සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවීම | 250 | (මු.රෙ. 208 අනුව සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදන මාරු කෙරේ.)<br>දිස්ත්‍රික්ක 8කට හා සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිකිරීම්, අලුත්වැඩියා වෙනුවෙන් රු. මිල. 239.50ක් හා උපකරණ මිලදී ගැනීම සඳහා රු. මි. 10.50ක් ප්‍රතිපාදන නිදහස් කර ඇත. (ත්‍රිකුණාමලය, මාතර, හම්බන්තොට, කෑගල්ල, කළුතර, ගාල්ල, කුරුණෑගල, අනුරාධපුර ය) |
| 45 | ඔටිසම් දරුවන් සඳහා සෞඛ්‍ය, අධ්‍යාපන සහ සේවා පහසුකම් වැඩිදියුණු කිරීම | 200 | (මු.රෙ. 208 අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ප්‍රතිපාදන මාරු කර ඇත.)<br>රිජ්වේ ආර්යා ළමා රෝහල ව්‍යාපෘතිය අමාත්‍යමණ්ඩල අනුමැතිය ට ඉදිරිපත් කර ඇත.<br>පවුල් සෞඛ්‍ය කාර්යාංශ ව්‍යාපෘතිය හරහා ළමා සංවර්ධන හා මැදිහත්කරණ මධ්‍යස්ථාන 25ක් දිස්ත්‍රික් මට්ටමින් ඉදි කිරීම සඳහා උපකරණ මිලදී ගැනීමට ප්‍රසම්පාදන කාර්යය ආරම්භ කර ඇත. |

# 9. ළමා සංවර්ධන මධ්‍යස්ථාන ව්‍යාප්තිය

වගුව - 2 රජයේ සහ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන ව්‍යාප්තිය

| ළමා සංවර්ධන මධ්‍යස්ථාන | | | |
|---|---|---|---|
| අයිතමය | රජයේ නිවාස | ස්වේච්ඡා නිවාස | එකතුව |
| නිවාස | 48 | 308 | 356 |
| ළමුන් | 1186 | 8005 | 9191 |

ළමා ජනගහනය - මිලියන 7.27 (33.34%)

ළමා සභා - 9852

රජයේ පාසල් - 10,126

රජයේ පාසල්වල ළමුන් - මිලියන 3.969

වගුව - 3 ළමා සංවර්ධන මධ්‍යස්ථාන ව්‍යාප්තිය - පළාත් අනුව

| අනු අංකය | පළාත | රජයේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන | | ලියාපදිංචි ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන | | රජයේ හා ස්වේච්ඡා ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථාන එකතුව | | ලියාපදිංචි නොවූ ළමා සංවර්ධන මධ්‍යස්ථාන |
|---|---|---|---|---|---|---|---|---|
| | | මධ්‍යස්ථාන ගණන | දරුවන් ගණන | මධ්‍යස්ථාන ගණන | දරුවන් ගණන | මධ්‍යස්ථාන ගණන | දරුවන් ගණන | |
| **1** | වයඹ | 3 | 122 | 33 | 864 | 36 | 986 | 2 |
| **2** | බස්නාහිර | 5 | 134 | 106 | 2206 | 111 | 2340 | 6 |
| **3** | මධ්‍යම | 3 | 77 | 32 | 849 | 35 | 926 | 3 |
| **4** | දකුණ | 7 | 259 | 19 | 476 | 26 | 735 | 2 |
| **5** | උතුරු මැද | 8 | 187 | 8 | 258 | 16 | 445 | 0 |
| **6** | සබරගමුව | 3 | 58 | 15 | 354 | 18 | 412 | 0 |
| **7** | උතුර | 6 | 66 | 34 | 1475 | 40 | 1541 | 1 |
| **8** | නැගෙනහිර | 6 | 38 | 51 | 1158 | 57 | 1196 | 0 |
| **9** | ඌව | 7 | 245 | 10 | 365 | 17 | 610 | 0 |
| එකතුව | | **48** | **1186** | **308** | **8005** | **356** | **9191** | **14** |

*මූලාශ්‍රය - පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව හා ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

# 10. අමාත්‍යාංශය හා විෂයපථය යටතට ගැනෙන ආයතන

1. **අමාත්‍යාංශය**

- ආයතන අංශය
- සංවර්ධන අංශය
- සැලසුම් හා තොරතුරු තාක්ෂණ අංශය
- ගිණුම් අංශය
- අභ්‍යන්තර විගණන අංශය

2. **ළමා අංශය**

- මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය
- පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
- ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

3. **කාන්තා අංශය**

- ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය
- ජාතික කාන්තා කමිටුව

# 10.1 සංවර්ධන අංශය

## 1.0 ප්‍රධාන කාර්යභාරය

අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති හා නීති සම්පාදනය හා ජාතික මට්ටමේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ මූලික වගකීම දරන සංවර්ධන අංශය අමාත්‍යාංශය යටතේ වන ආයතන ක්‍රියාත්මක කරන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම හා අධීක්ෂණය කිරීම සිදු කරයි. එමෙන්ම කාන්තා හා ළමා විෂයයට අදාල එක්සත් ජාතීන්ගේ අනුබද්ධ ආයතන ඇතුළු අනෙකුත් විදේශීය හා දේශීය ප්‍රදායක ආයතන සම්බන්ධීකරණය කිරීම හා ජාතික මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය කිරීම ද සංවර්ධන අංශයේ ප්‍රධාන කාර්යභාර්යන් වේ.

## 2.0 ක්‍රියාත්මක කළ ප්‍රධාන සංවර්ධන වැඩසටහන්

### 2.1 කාන්තාවන්ට අදාළ ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීම

#### 2.1.1 2024 අංක 37 දරන කාන්තාවන් සවිබලගැන්වීමේ පනතෙහි ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම

මේ වන විට කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවට අදාළ සාමාජිකයින් පත්කර ඇත. ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය උත්ශ්‍රේණිගත කිරීමට අදාළ කැබිනට් පත්‍රිකාව කැබිනට් මණ්ඩලය වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලදුව මහා භාණ්ඩාගාරය ඇතුළු අදාළ අනෙකුත් සියලු පාර්ශ්වයන් සමඟ එක්ව වැඩිදුරටත් අධ්‍යයනය කිරීමට 2025 ජූලි මස 02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/25/1052/819/011 මගින් දන්වා ඇත.

#### 2.1.2 ශ්‍රී ලංකාවේ ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් කරගත් හිංසනය (SGBV) පිටු දැකීම සඳහා වූ බහු-ආංශික ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NAP) 2024–2028

මෙම අමාත්‍යාංශය විසින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සහ එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA) යන ආයතනවල තාක්ෂණික සහාය ඇතිව සකස් කරන ලද මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2024.12.20 දින සිට ජනගත කර ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකාවේ ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය (SGBV) පිටු දැකීම සඳහා වූ බහු-ආංශික ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අදාළව 2025-2026 වර්ෂය සඳහා ක්‍රියාකාරකම් ප්‍රමුඛතාගත කිරීමේ වැඩසටහනක් රේඛීය අමාත්‍යාංශ සම්බන්ධ කර ගනිමින් 2025 වර්ෂයේ දී පවත්වන ලදී.

එසේම, මෙම බහු-ආංශික ජාතික ක්‍රියාකාරී සැලැස්ම, පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා වන වැඩමුළු සියලුම පළාත්වල පැවැත්වීමට සැලසුම් කර ඇත. මේ වන විට අදාළ වැඩමුළු දකුණ, උතුරු මැද, බස්නාහිර, උතුර, සබරගමුව සහ වයඹ පළාත්වල පවත්වන ලද අතර, ඌව, මධ්‍යම, හා නැගෙනහිර පළාත්වල ඉදිරියේ දී පැවැත්වීමට නියමිත වේ.

**2.1.3 ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ උපායමාර්ගික සැලැස්ම**

ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා වන ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මට අදාළ කෙටුම්පත මේ වන විට සකස් කර අවසන්ව ඇත. එහි අවසාන අදියර වශයෙන් ක්‍රියාකාරී සැලැස්මෙහි වලංගුතාවය තහවුරු කර ගැනීම සඳහා වන රැස්වීම 2025 අවසන් කාර්තුව තුළ පැවැත්වීමට සැලසුම් කර ඇත.

**2.1.4 කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම (2023-2027) (UNSCR 1325)**

ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්ති රාමුව තුල එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ කාන්තාව, සාමය සහ ආරක්ෂාව පිළිබඳ යෝජනා 1325 යටතේ හා ජාත්‍යන්තර බැඳීම්වලට ද අනුකූලව මෙම ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇති අතර, 2023 වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව ජාත්‍යන්තර කාන්තා දින උත්සවයේ දී එළිදක්වන ලදී. එමඟින් ශ්‍රී ලංකාවේ ගැටුම්වලින් පීඩාවට පත් වූ සහ පශ්චාත්-ගැටුම් පසුබිම්වල සිටින කාන්තාවන්ගේ සාමය සහ ආරක්ෂාවත්, කාන්තාවන්ගේ ජීවිත උසස් තලයකට නංවාලීමත්, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාව ප්‍රවර්ධනය කිරීමත්, කෙරෙහි විශේෂ අවධානය යොමු කරයි.

මේ වන විට ජාතික ක්‍රියාකාරී සැලැස්මේ සියලු නිරීක්ෂණ හා සම්බන්ධීකරණය කිරීම සඳහා වූ ප්‍රධාන නියමු කමිටු රැස්වීම් 5ක් ද, අන්තර් ආයතනික සම්බන්ධීකරණ හා තක්සේරු කමිටු රැස්වීම් වාර 3 ක් ද පවත්වා ඇත. එමෙන්ම මධ්‍ය වාර්ෂික ප්‍රගතිය සමාලෝචනය කර සියලු පාර්ශ්වකරුවන්ගේ රැස්වීමක් කැඳවා දැනුවත් කර ඇත. 2025.12.31 දින වන විට 48% ක ප්‍රගතියක් අත්කර ගැනීමට අපේක්ෂා කරයි.

**2.1.5 ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අයවැයකරණය පිළිබඳ පනත සකස් කිරීමට මූලික පසුබිම සැකසීම**

පාර්ලිමේන්තුවෙන් සම්මත වන අයවැය තුළත් කාන්තාවන්ට විශේෂිත ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්වන බව තහවුරු කිරීම, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අයවැයකරණය පිළිබඳ පනත සකස් කිරීමේ මූලික අරමුණ වේ. එම සංකල්ප පත්‍රිකාවෙහි සිදු විය යුතු සංශෝධන පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තු ප්‍රධානීන් සමඟ සාකච්ඡා කර අවසානාත්මක සංකල්ප පත්‍රිකාව සකස් කරන ලදී. එමෙන්ම ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අයවැයකරණය පිළිබඳව අනෙකුත් අදාළ අමාත්‍යාංශ ප්‍රධානීන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් ද මෙම වර්ෂයේ දී පවත්වන ලදී. මෙම සංකල්ප පත්‍රිකාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

## 2.2 ළමුන් සම්බන්ධ පනත්, කමිටු, ප්‍රතිපත්ති හා නීතිමය කටයුතු

### 2.2.1 ආයතනික රැකවරණ හෝ භාරකාරත්වය යටතේ වන ළමුන් සහ වීදි ළමුන් සඳහා ජීවන වියදම් දීමනාව

2025.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආයතනික රැකවරණය හෝ භාරකාරත්වය යටතේ සිටින ළමුන් සහ වීදි ළමුන්ට අවුරුදු 18 සම්පූර්ණ වන තෙක් දරුවා නමින් රු. 2000/- ක මුදලක් මාසිකව බැංකු ගිණුමක තැන්පත් කරනු ලබන අතර, දරුවා රැඳී සිටින ළමා සංවර්ධන මධ්‍යස්ථානය හෝ භාරකාරත්වය දරන්නා වෙත රු. 3000/- ක මාසික දීමනාවක් ලබා දෙනු ලැබේ. එසේම මෙම වැඩසටහන සඵලදායීව පවත්වා ගෙන යාම, ප්‍රගති සමාලෝචනය හා පසු විපරම් කටයුතු සඳහා අප අමාත්‍යාංශයේ ලේකම්ගේ සභාපතිත්වයෙන් ජාතික මට්ටමේ මෙහෙයුම් කමිටුවක් ස්ථාපිත කර ඇත.

### 2.2.2 ආයතනගතව සිට සමාජගතවන අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස පහසුකම් සපයා ගැනීමට මූල්‍යාධාර ලබා දීමේ වැඩසටහන

නිසි පවුල් පසුබිමක් හෝ වෙනත් විධිමත් ආධාරක පද්ධතියක් නොමැති වීම හේතුවෙන් විවාහ වීම කල්දැමීමට සිදුව ඇති තරුණ තරුණියන්ට, ස්ථාවර හා ආරක්ෂිත නිවසක් තනා දීමට රුපියල් මිලියනයක මූල්‍යාධාර ලබා දීම මෙම වර්ෂය තුළ ආරම්භ කරන ලදී. මේ සඳහා 2025 අයවැය යෝජනා අංක 17 රු.මි. 1000 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර, මීට අදාල ප්‍රතිලාභීන් තෝරා ගැනීම මේ වන විට සිදු කරමින් පවතී.

### 2.2.3 ළමා අපයෝජන සිද්ධීන් අවම කිරීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයකින් යුතු බහු ආංශික යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම

දරුවන්ට සිදුවන අපයෝජන සහ සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වයන්ගෙන් දරුවන් ආරක්ෂා කිරීම සඳහා බහු ආංශික යාන්ත්‍රණයක් සැකසීම සඳහාත්, දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂාව වෙනුවෙන් සෘජුව මැදිහත් වීම සඳහාත්, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පොලීසියේ ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශය, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, අධිකරණ අමාත්‍යාංශය හා ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය යන ආයතනවල නිලධාරීන්ගෙන් සමන්විත ස්ථාවර ජාතික කමිටුවක් මෙම වර්ෂය තුළ පිහිටුවන ලදී.

**2.2.4 කාන්තාවන්ට එරෙහි සියලු ආකාර වෙනස්කොට සැලකීම පිටු දැකීමේ සම්මුතිය (CEDAW) පිළිබඳ අන්තර් අමාත්‍යාංශ ස්ථාවර කමිටුවක් පිහිටු වීම**

කාන්තාවන්ට එරෙහි සියලු ආකාර වෙනස්කොට සැලකීම් පිටු දැකීමේ සම්මුතිය (CEDAW) පිළිබඳ අන්තර් අමාත්‍යාංශ ස්ථාවර කමිටුවක් පිහිටු වීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, මෙම වර්ෂය තුළ එම කමිටුව පිහිටු වීම සඳහා නාම යෝජනා ලබා ගනිමින් පවතී.

**2.2.5 ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අනුව ළමුන් සඳහා සංයුක්ත පනතක් සකස් කිරීම**

ශ්‍රී ලංකාවේ ළමුන්ගේ ළමා අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා ළමා අයිතිවාසිකම් සුරැකීමට අදාළ සියලු නීති රීති හා අණ පනත් අධ්‍යයනය කර, වර්තමාන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි එක් පනතක් වශයෙන් ළමා අයිතිවාසිකම් නීතිගත කිරීම මෙහි අරමුණ වේ. මේ වනවිට ඒ පිළිබඳ අධ්‍යයනය කර, සංකල්ප පත්‍රිකාව සකස් කර, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇති අතර, නීති කෙටුම්පත් සම්පාදක විසින් මූලික කෙටුම්පත සකස් කර ඇත. නැවත වතාවක් අදාළ පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කර ලබා ගන්නා ලද යෝජනා සංයුක්ත පනතට ඇතුල් කර නව පනතක් ලෙස අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට සැලසුම් කරමින් පවතී.

**2.2.6 දිස්ත්‍රික් ළමා හා කාන්තා සංවර්ධන කමිටු රැස්වීම් පැවැත්වීම**

දරුවන්ට හා කාන්තාවන්ට සේවා සපයන සියලුම පාර්ශ්වකරුවන් ඒකාබද්ධ කොට, ගැටළු සාකච්ඡා කිරීමට කාර්තුමය වශයෙන් කමිටු රැස්වීම් ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්ගේ සම්බන්ධීකරණයෙන් හා දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ මූලිකත්වයෙන් පවත්වනු ලබන අතර කාර්තුව අවසානයේ දී අදාළ රැස්වීම් වාර්තාව කැඳවනු ලබයි. එසේ කැඳවනු ලබන රැස්වීම් වාර්තා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ද සහාය ලබා ගනිමින් සමාලෝචනය කර ජාතික මට්ටමින් සිදුකළ යුතු මැදිහත්වීම් සඳහා ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටු රැස්වීමේ දී තීරණය කර අවශ්‍ය මැදිහත් වීම් සම්බන්ධව කටයුතු කරනු ලබයි.

මෙම රැස්වීම් පැවැත්වීම සඳහා මෙම වර්ෂයේ තෙවන කාර්තුවේ සිට 30% මුදල් වැඩි කිරීමක් සිදු කළ අතර, ඒ අනුව, 2025 වර්ෂයේ දිස්ත්‍රික්ක 25 සඳහා රු.මි. 1.070 ක මුදලක් වෙන් කරනු ලැබීය. මේ වන විට අවශ්‍ය ප්‍රතිපාදන පළමු, දෙවන හා තෙවන කාර්තු සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත යොමු කර ඇත.

**2.2.7 කාන්තාවන්ට හා ගැහැනු ළමුන්ට එරෙහිව ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය (SGBV) වැළැක්වීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් සංසද පිහිටුවීම**

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය වැළැක්වීම, ඊට ප්‍රතිචාර දැක්වීම, දත්ත එක්රැස් කිරීම හා උද්දේශනය කිරීම, සම්බන්ධීකරණය කිරීම හා ශක්තිමත් කිරීමේ අරමුණු ඇතිව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් සංසද පිහිටු වීම 2025 වර්ෂයේ ද තවදුරටත් සිදු කරමින් පවතී.

### 2.2.8 අඩු වයස් ගැබ් ගැනීම් වැළැක්වීමේ වැඩසටහන

1991 දී ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය අපරානුමත කිරීමෙන් පසු, ශ්‍රී ලංකා රජය විසින් ළමුන් සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වයෙන්, සූරා කෑමෙන්, අපයෝජනයෙන් හා නොසලකා හරිනු ලැබීමෙන් ආරක්ෂා කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගැනීම සිදු කරයි. වර්තමානය වන විට ශ්‍රී ලංකාව තුළ අඩු වයස් ගැබ් ගැනීම් වාර්තා වීම ඉහළ යාම සමඟ පාසල් ළමුන් ඇතුළු විවිධ ඉලක්ක කණ්ඩායම් වෙනුවෙන් අඩු වයස් ගැබ් ගැනීම් වැළැක්වීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් දිස්ත්‍රික්ක 09 ක පැවැත්වීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත. ඒ අනුව, මේ වන විට කළුතර, මොණරාගල, හම්බන්තොට, කෑගල්ල, ත්‍රිකුණාමලය, අම්පාර, පුත්තලම සහ කිලිනොච්චිය යන දිස්ත්‍රික්ක සඳහා අවශ්‍ය ප්‍රතිපාදන යොමු කර ඇත.

### 2.3 මාධ්‍ය ප්‍රචාරණය

කාන්තාවන් සහ දරුවන් උදෙසා ජාත්‍යන්තර වශයෙන් වෙන්ව ඇති දිනයන්හි දී ඒ පිළිබඳව සමාජය දැනුවත් කිරීම සඳහා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය තුළින් ප්‍රවෘත්ති, සම්මුඛ සාකච්ඡා සහ පුවත්පත් අතිරේක ආදිය හරහා ප්‍රචාරණ කටයුතු සිදුකර ඇත. කාන්තාවන් සවිබල ගැන්වීම සහ ඔවුන් සුරැකීම උදෙසා අමාත්‍යාංශය විසින් දියත් කරනු ලබන වැඩසටහන්, ව්‍යාපෘති, ක්‍රියාකාරකම් පිළිබඳවත්, කාන්තාවන්ට හා දරුවන්ට හිතකර අයුරින් සදාචාරාත්මක ලෙස මාධ්‍ය හැසිරවීම උදෙසා අමාත්‍යාංශය විසින් දියත් කරනු ලබන විවිධ වැඩසටහන් පිළිබඳවත්, සමාජය සංවේදී කිරීම සඳහා මාධ්‍යන්හි දායකත්වය ලබාගැනීම මාධ්‍ය ප්‍රචාරණ වැඩසටහන් මඟින් සිදුකෙරේ. ඒ අනුව, 2025 වර්ෂයේ දී ජාත්‍යන්තර කාන්තා  දිනයට සහ ලෝක ළමා දිනයන්ට සමගාමීව එවැනි මාධ්‍ය ප්‍රචාරණ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී.

### 2.4 වෙනත් අමාත්‍යාංශ වෙත වාර්තා/තොරතුරු ලබාදීම හා ඊට අදාළ සම්බන්ධීකරණ කටයුතු

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ (UNGA) 80 වැනි සැසිවාරය සැප්තැම්බර් මාසයේ පැවැත්වීමට අදාළව එහි ඉහළ මට්ටමේ මහා විවාදයට  (High Level General Debate) අවශ්‍ය තොරතුරු විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත සපයන ලදී. තවද 80 වන මහා විවාදය සඳහා ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයාගේ  ප්‍රකාශයට  (Country Statement) අවශ්‍ය කරුණු අවශ්‍ය කරුණු සහ මෙම සැසිවාරයේ සාකච්ඡා සඳහා ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමට අවශ්‍ය තොරතුරු විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී.

කාන්තාවන් පිළිබඳ  සිව්වන ලෝක සමුළුවේ තිස් වැනි සංවත්සරය වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා මණ්ඩලයේ ඉහළ මට්ටමේ රැස්වීමක් නිව්යෝක් නුවර පවත්වන බැවින් ඊට අවශ්‍ය තොරතුරු විදේශ කටයුතු අමත්‍යාංශය වෙත සපයන ලදී. විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳව කමිටුවේ ඉදිරි සැසිවාරවලදී සලකා බැලිය යුතු ශ්‍රී ලංකාවේ මූලික වාර්තාවට අදාළ ගැටළු ලැයිස්තුවට (List of Issues) අදාළ තොරතුරු එම කටයුතු අමාත්‍යාංශය වෙත ලබා දෙන ලදී.

**2.5 ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා කාන්තා අයිතිවාසිකම් පිළිබඳ වැඩසටහන - එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ (UNFPA) ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කරන වැඩසටහන්**

ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය හිංසනය වැළැක්වීමට හා වින්දිතයන් වෙත සේවා සැපයීම සඳහා එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල මඟින් 2025 වසර සඳහා රු.මි. 9.147 ක් මෙම අමාත්‍යාංශය වෙත ලබා දී ඇත. එම ප්‍රතිපාදන ප්‍රමාණයෙන් සංවර්ධන අංශය වෙත රු.මි. 6.187 ක් වෙන් කරන ලදී. එම ප්‍රතිපාදනයෙන් 2025 සැප්තැම්බර් වන විට රු.මි. 5.697 ක මූල්‍ය ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති අතර, ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කිහිපයක් පහත පරිදි වේ.

- ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත් කාන්තාවන්ගේ සහ ඔවුන්ගේ දරුවන්ගේ හදිසි අවශ්‍යතා සපුරාලීමට රු.5000/- බැගින් රු.මි. 1.825 ක ප්‍රතිපාදන, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 340 කට සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 කට හදිසි අවස්ථා කළමනාකරණ පිරිවැය ලෙස ලබා දී ඇත.

- ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත සිදුවන හිංසනයන් වැළැක්වීම හා ඒවාට ප්‍රතිචාර දැක්වීමට අදාළව රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල පාර්ශ්වකරුවන් සමඟ පවත්වන වැඩසටහන් සඳහා රු.මි.1.854 ක ප්‍රතිපාදන යොදා ගනිමින් බදුල්ල, මඩකලපුව, පොළොන්නරුව, අම්පාර, මුලතිව්, වව්නියාව යන දිස්ත්‍රික්කවල වැඩසටහන් පවත්වා ඇත.

## 3.0 වැඩසටහන් කිහිපයක විශේෂ අවස්ථා



දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටු රැස්වීම - මඩකලපුව




දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටු රැස්වීම - මුලතිව්



ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය හිංසන වැළැක්වීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ වැඩමුළුව- රත්නපුරය





ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සිදුවන හිංසනයන් වැළැක්වීම හා ඒවාට අදාළව ප්‍රතිචාර දැක්වීමට අදාළව රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල පාර්ශවකරුවන් සමග පැවැත්වූ වැඩසටහන - බදුල්ල දිස්ත්‍රික්කය

## 4.0 ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්හි 2025.09.30 දිනට ප්‍රගතිය

| අනු අංකය | ප්‍රධාන ව්‍යාපෘතිය/ කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන් | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | ස්ත්‍රී | පුරුෂ |
| **1. ළමා අපයෝජනය හා කාන්තාවන්ට එරෙහි හිංසනය වැළැක්වීම** | | | | | | | |
| 1.1 | දිස්ත්‍රික් ළමා හා කාන්තා සංවර්ධන කමිටු රැස්වීම පැවැත්වීම | 1.070 | 0.388 | කාර්තුවකට 01 බැගින් දිස්ත්‍රික්ක 25හි රැස්වීම් 100 ක් පැවැත්වීම | පළමු කාර්තු රැස්වීම් - 23 දෙවන කාර්තු - 17 | ලැබී ඇති වාර්තා අනුව නිලධාරීන් 667 | |
| 1.2 | අඩු වයස් ගැබ් ගැනීම් වැළැක්වීමේ වැඩසටහන | 0.927 | – | දිස්ත්‍රික්ක 10ක වැඩසටහන් 43ක් පැවැත්වීම (ත්‍රිකුණාමලය, අම්පාර, කොළඹ, කළුතර, කුරුණෑගල, හම්බන්තොට, පුත්තලම, කිලිනොච්චිය, කෑගල්ල, මොණරාගල) | වැඩසටහන් 03ක් පවත්වා ඇත. (හම්බන්තොට -2, මොණරාගල -1) | | |
| 1.3 | කාන්තා සහ ළමා විෂයට අදාළව පවතින ගැටලු පිළිබඳව පළාත් ප්‍රධානීන් සමඟ සාකච්ඡා කිරීම | 0.153 | 0.132 | වැඩසටහනක් පැවැත්වීම | වැඩසටහන පවත්වා ඇත. | 112 | |
| **එකතුව** | | **2.150** | **0.520** | | | **779** | |
| **2. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය වැළැක්වීමේ වැඩසටහන (UNFPA)** | | | | | | | |
| 2.1 | ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කර ගත් හිංසනය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා සම්සුරු කණ්ඩායම් පිහිටුවීම සහ පහසුකම් සැපයීම සඳහා මාර්ගෝපදේශ පිළිබඳ වනිතා සංවර්ධන නිලධාරීන් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් (TOT) පැවැත්වීම. පසුව බිම් මට්ටමේ ජනතාව දැනුවත් කිරීම. | 0.994 | 0.696 | පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් පැවැත්වීම | පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන පවත්වා ඇත | 63 | |
| 2.2 | ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත සිදුවන හිංසනයෙන් පීඩාවට පත් වන වින්දිතයින් සඳහා හදිසි කළමනාකරණ පිරිවැයක් ලෙස රු. 5,000/- ක ප්‍රතිපාදන මුදලක් වෙන් කිරීම හා එම මුදල ඵලදායි අන්දමින් භාවිතයට ගැනීම. | 1.825 | 1.825 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25ට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 340කට ප්‍රතිපාදන යැවීම | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 26ක් වියදම් දරා වාර්තා එවා ඇත | 109 | |
| 2.3 | ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කර ගත් හිංසනය පිටුදැකීම සඳහා වූ "බහු - ආංශික ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2024/2028" සඳහා පසුවිපරම්, මෙහෙයුම් සහ අධීක්ෂණ ක්‍රමවේදය සකස් කිරීමට පරිපාලන පිරිවැය දැරීම. | 0.300 | 0.299 | ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සමඟ වෙබ් සත්කාරක පහසුකම් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා මුදල් ගෙවීම. | ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සමඟ වෙබ් සත්කාරක පහසුකම අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා මෙම වර්ෂයට මුදල් ගෙවා ඇත. | | |
| **උප එකතුව** | | **3.119** | **2.820** | | | **172** | |

| අනු අංකය | ප්‍රධාන ව්‍යාපෘතිය/ කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන් | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | ස්ත්‍රී | පුරුෂ |
| 2.4 | වැඩසටහන් මෙහෙයුම් පිරිවැය දැරීම | 0.022 | 0.022 | | | | |
| 2.5 | නීති නිලධාරීන් සඳහා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 0.173 | 0.172 | වැඩසටහන් - 01 | වැඩසටහන පවත්වා ඇත | 74 | |
| 2.6 | සංවර්ධන අංශය සඳහා අත්‍යවශ්‍ය උපකරණ සැපයීම. | 0.723 | 0.344 | | | | |
| 2.7 | ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත සිදුවන හිංසනයන් වැළැක්වීම හා ඒවාට ප්‍රතිචාර දැක්වීමට අදාළව රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල පාර්ශ්වකරුවන් සමඟ පවත්වන වැඩසටහන. | 1.854 | 1.840 | වැඩසටහන් 07 | වැඩසටහන් 07ක් පවත්වා ඇත. | | |
| 2.8 | ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබලගැන්වීමේ ප්‍රතිපත්තිය ඉදිරියට ගෙන යාම සඳහා ක්‍රියාකාරී සැලසුම් සඳහා තාක්ෂණික සහාය ලබා දීම. | 0.296 | 0.236 | සාකච්ඡා 05 | සාකච්ඡා 04ක් පවත්වා ඇත | | |
| 2.9 | සන්නිවේදන පහසුකම් (CDMA 42) බිල්පත් ගෙවීම. | 0.360 | 0.263 | බිල්පත් 504 | බිල්පත් 378ක් ගෙවා ඇත | | |
| 2.10 | ස්ත්‍රී පුරුෂ සමාජභාවීය හිංසන වැළැක්වීම හා වින්දිතයන්ගේ ආරක්ෂාව සැලසීම සඳහා සම්පත්දායක සංචිතයක් ස්ථාපිත කිරීම හා ශක්තිමත් කිරීම. | 0.296 | – | – | – | | |
| 2.11 | තාවකාලික රැකවරණ මධ්‍යස්ථානයන් හි පරිපාලන හා ක්ෂේත්‍ර නිරීක්ෂණ සඳහා අවශ්‍ය වන වියදම් දැරීම. | 0.296 | 0.170 | ක්ෂේත්‍ර නිරීක්ෂණ 06 | ක්ෂේත්‍ර නිරීක්ෂණ 03ක් පවත්වා ඇත (නුවරඑළිය, ගම්පහ, රත්නපුර) | | |
| 2.12 | ධනාත්මක ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ සම්මතයන් ප්‍රවර්ධන කිරීමේ අරමුණින් සකසා ඇති හැසිරීම් රටා වෙනස් කිරීම සන්නිවේදනය කිරීම පිළිබඳ මොඩියුලය පිළිබඳ වනිතා සංවර්ධන නිලධාරීන් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් (TOT) පැවැත්වීම. පසුව බිම් මට්ටමේ පිරිමි සහ පිරිමි ළමුන් දැනුවත් කිරීම. | 2.002 | 1.255 | TOT වැඩසටහන් 01 ක් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් 05 | TOT වැඩසටහන පවත්වා ඇත (මහනුවර) | | |
| 2.13 | අන්තර්ජාතික දින 16 වැඩසටහන් මාලාව | 0.296 | – | | | | |
| **උප එකතුව** | | **6.318** | **4.302** | | | **74** | |
| **මුළු එකතුව** | | **9.437** | **7.122** | | | **1025** | |

# 10.2 සැලසුම් හා තොරතුරු තාක්ෂණ අංශය

## 1.0 ප්‍රධාන කාර්යභාරය

අමාත්‍යාංශයේ සේවාවන් වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා සැලසුම්කරණය, වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, මෙහෙයුම්කරණය, පුහුණු වැඩසටහන් සිදු කිරීම, සම්බන්ධීකරණය හා රජයේ ඩිජිටල්කරණ කාර්යාවලියට අදාළව කටයුතු කිරීම, ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය ඇතුළු අදාළ සියලුම තොරතුරු තාක්ෂණ නෛතික තත්ත්වයන්ට අනුකූලව අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ භාවිතාවන් ක්‍රමවත්ව පවත්වාගෙන යාම.

## 2.0 ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන්

### 2.1 සැලසුම්කරණය

සැලසුම්කරණය යටතේ අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, දිස්ත්‍රික් ක්‍රියාකාරී සැලසුම්, ආයතනික ප්‍රතිඵල රාමුව සඳහා වන සැලැස්ම ඇතුළු කාන්තා හා ළමා ක්ෂේත්‍රයට අදාළ වෙනත් සැලසුම් සකස් කිරීම සිදු කර ඇත. තවද, රජයේ නව ප්‍රතිපත්ති ප්‍රකාශයට අදාළව මෙම අමාත්‍යාංශයට පැවරී ඇති උපාය මාර්ග 43 ට අනුගත වෙමින් 2025 ක්‍රියාකාරී සැලැස්මක් හා 2025-2029 පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්මක් ද සකස් කර ඇත. ඊට අමතරව, ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිපත්ති මෙන්ම නිර්දේශ අනුව මෙම අමාත්‍යාංශ විෂය පථය යටතේ විවිධ ආයතන/ දෙපාර්තමේන්තු හා වෙනත් අමාත්‍යාංශ මඟින් සකස් කෙරෙන සැලසුම්, ප්‍රතිපත්ති හා වෙනත් කාලීන වාර්තා සඳහා තාක්ෂණික සම්පත්දායකත්වය ලබා දී ඇත.

### 2.2 මෙහෙයුම්කරණය

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අදාල කාර්තු ප්‍රගතිය වාර්තා කිරීම, දිස්ත්‍රික් සැලසුම් ප්‍රකාරව ප්‍රගති වාර්තාකරණය හා කාර්යසාධන වාර්තාව සකස් කර ඉදිරිපත් කිරීම. අමාත්‍යාංශයේ සියලු සංවර්ධන වැඩසටහන්වලට අදාළ මාසික, කාර්තු හා වාර්ෂික ප්‍රගති වාර්තාකරණය හා ප්‍රගති සමාලෝචන සාකච්ඡා පැවැත්වීම සිදු කර ඇත. 2025 අයවැය යෝජනා සම්බන්ධ මාසික ප්‍රගති වාර්තාකරණය මෙන්ම ජනාධිපති කාර්යාලය මඟින් ඉල්ලුම් කෙරෙණ විශේෂ ප්‍රගති වාර්ථා ඉදිරිපත් කිරීම සිදු කර ඇත

එසේම ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ කාර්තුපාදක ඒකාබද්ධ ප්‍රගති සමාලෝචන රැස්වීම් 02ක් පවත්වා නිර්දේශ ලබා දී ඇත. මෙම අමාත්‍යාංශයට අදාලව ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන්ගේ කාර්යයන් හා ප්‍රගතිය පිළිබඳ ප්‍රගති සමාලෝචන සාකච්ඡාවන් 02ක් පවත්වා නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් හා මාර්ගෝපදේශ ලබා දී ඇත.

ඉන් එක් සාකච්ඡාවක් Zoom තාක්ෂණය ඔස්සේ පැවැත්වූ අතර, අනෙක් සාකච්ඡාව සෙත්සිරිපාය පරිශ්‍රයට කැඳවනු ලැබූ දිස්ත්‍රික් නිලධාරීන් 165 කගේ සහභාගීත්වයෙන් පැවැත්වුනි.

### 2.3 පසුවිපරම්කරණය

තරුණ කාන්තා ව්‍යවසායකයින් දිරි ගැන්වීමේ අරමුණින් සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි 2023 වර්ෂය සඳහා ඉදිරිපත් කෙරුණු අයවැය යෝජනාවක් මඟින් තරුණ ව්‍යවසායක කාන්තාවන් වෙත අමාත්‍යාංශය හරහා ව්‍යාපෘති ණය ලබා දී ඇත. මාතර දිස්ත්‍රික්කයේ තිහගොඩ, කිරින්ද -

පුහුල්වැල්ල හා හක්මණ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 03 ක් තෝරා ගෙන එකී ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන්ගේ ආදායම් වර්ධන ව්‍යාපෘති නිරීක්ෂණයට ලක්කර නිගමන හා නිර්දේශ සහිත වාර්තා ඉදිරිපත් කර තිබේ.

පුත්තලම දිස්ත්‍රික්කයේ වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ළමා විෂයට අදාල ව්‍යාපෘති කිහිපයක පසුවිපරම් ක්ෂේත්‍ර නිරීක්ෂණයක් හා මන්නාරම දිස්ත්‍රික් ක්ෂේත්‍ර නිරීක්ෂණයක් මෙන්ම නිලධාරීන්ගේ කාර්යයන් හි පසුවිපරමකරණයක් ද සිදුකිරීමට සැලසුම් කර ඇත.

## 2.4 ඩිජිටල්කරණය හා තොරතුරු තාක්ෂණ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම

පුරවැසියන්ට විනිවිද පෙනෙන සහ කාර්යක්ෂම සේවාවන් සපයන ප්‍රතිචාරාත්මක රාජ්‍ය අංශයක් නිර්මාණය කිරීම සඳහා රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය රජයේ ඉහළම ප්‍රමුඛතාවය වී ඇති අතර කාන්තා සහ ළමා කටයුතු ඩිජිටල්කරණය වෙනුවෙන් 2025 වසර සඳහා රු.මි. 30.00ක ප්‍රතිපාදන වෙන් කර ඇත. ඒ අනුව, දැනට දත්ත රැස් කිරීම, දත්ත බෙදා හැරීම හා විශ්ලේෂණය කිරීමේ ක්‍රමෝපායන් පිළිබඳ තොරතුරු රැස් කිරීමක් කරන ලද අතර, එහි යෝජනා හා අදහස් පදනම් කර ගනිමින් ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය හා තාක්ෂණික ආයතන සමඟ සාකච්ඡා වට කිහිපයක් පවත්වා ඇත. කාන්තා සහ ළමා විෂය ක්ෂේත්‍රයේ සංවිධිත දත්ත පද්ධතියක් හා දත්ත හා වාර්තා ලබා ගැනීමේ පද්ධතියක් සකස් කිරීමට අපේක්ෂා කර ඇත.

එසේම අමාත්‍යාංශ නිල වෙබ් අඩවිය, යූ ටියුබ් චැනලය හා ෆේස් බුක් පිටුව පවත්වා ගෙන යෑමේ කටයුතු මෙම අංශයට පැවරී ඇති අතර, ආයතන මඟින් ලබා දෙන තොරතුරු මත අදාළ මාධ්‍ය යාවත්කාලීන කිරීම සිදු කරනු ලබයි. අමාත්‍යාංශයේ ප්‍රති වෛරස මෘදුකාංග සැපයීම, ලංකා ඉ - රාජ්‍ය ජාල ව්‍යාපෘතිය යටතේ අන්තර්ජාල කටයුතු හා පරිගණක ජාලකරණයට අදාළ කටයුතු විධිමත්ව පවත්වා ගෙන යෑමද සිදු කර ඇත.

තොරතුරු හා සංනිවේදන තාක්ෂණ විෂය ක්ෂේත්‍රයේ නිලධාරී දැනුම යාවත්කාලීන කිරීම අරමුණු කර ගනිමින් අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩමුළු පවත්වන ලදී. ප්‍රධාන වශයෙන් මෙහිදී අමාත්‍යාංශයේ සංවර්ධන කාර්යයන්හි නිරත ආයතනවල නිලධාරීන් සඳහා අමාත්‍යාංශ නිල වෙබ් අඩවිය, නිල ෆේස් බුක් ගිණුම, LGN and LAN, ඉ-වානිජ, photoshop, MS Access (Advance) ලෙස සිදු කළ පරිගණක පුහුණු වැඩසටහන් ගණන 07ක් පමණ වන අතර ඒ සඳහා සහභාගි වූ නිලධාරීන් ගණන 164ක් පමණ වේ.

එසේම කාන්තා හා ළමා කටයුතු ඩිජිටල්කරණය කිරීමේ වර්තමාන විෂය පථයට ප්‍රවිෂ්ඨ වීමේ අරමුණින් නව පුහුණුවීම් හරහා කාර්ය මණ්ඩලයට වැඩි ප්‍රතිලාභ අත්පත් කර ගැනීමට ඉඩ සලසා දෙන ලදී. එමඟින් "රාජ්‍ය සේවකයන් සඳහා අත්‍යාවශ්‍ය තොරතුරු සංනිවේදන තාක්ෂණය හඳුන්වාදීම" සහ "නවීන තාක්ෂණ භාවිතයෙන් රාජ්‍ය සේවකයින්ගේ ආකල්පමය වෙනසක් ඇති කිරීම" යන පුහුණු වැඩසටහන් අමාත්‍යාංශයේ සියලු නිලධාරීන් ආවරණය වන සේ ආරම්භ කර ක්‍රියාත්මක වෙමින් පවතී

අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ උපාංග හා මෙවලම් සම්බන්ධ තොග ලේඛනයක් සකස් කිරීම සඳහා සහ QR කේතයක් යටතේ අදාළ තොරතුරු ගබඩා කිරීමේ ක්‍රමවේදයක් ආරම්භ කර ඇත.

## 2.5 දැනුවත් කිරීමේ වැඩසටහන්

ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාර දැක්වීමේ ආපදා සූදානම ශක්තිමත් කිරීම සඳහා මාතර දිස්ත්‍රික්කයට අනුයුක්තව සේවයේ නිරත වන කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයේ ක්ෂේත්‍ර

නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වා වාර්තා ඉදිරිපත් කර තිබේ. ඒ සඳහා සහභාගි වූ නිලධාරීන් ගණන 100ක් පමණ වේ.

මෙහි දෙවන වැඩසටහන කුරුණෑගල දිස්ත්‍රික්කයේ කාන්තා සහ ළමා විෂයට අදාළ නිලධාරීන් සඳහා පැවැත්වීමට කටයුතු යොදා ඇත.

## 2.6 ව්‍යාපෘති සම්බන්ධීකරණ කාර්යය

ආහාර සුරක්ෂිතතාවය සහ ජීවනෝපාය සංවර්ධන ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය මෙම අමාත්‍යාංශය වෙනුවෙන් සම්බන්ධීකරණය සිදු කරනුයේ සැලසුම් හා තොරතුරු තාක්ෂණ අංශය මඟින් වන අතර, ඒ යටතේ ප්‍රගති වාර්තාකරණය, මෙහෙයුම් සාකච්ඡා මෙන්ම ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව හා ප්‍රදායක ආයතන මට්ටමේ සාකච්ඡා නියෝජනය, අදාළ උපදෙස් හා නිර්දේශ ලබා දීම සිදු කර ඇත. මෙම ව්‍යාපෘතිය 2022 වර්ෂයේ ආරම්භ කරන ලද අතර 2026 වර්ෂය දක්වා ක්‍රියාත්මකය. කාන්තා හා ළමා සංවර්ධනය උදෙසා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට රු. මි. 459.86 ක ප්‍රතිපාදන වෙන්ව පවතී. සේම, සංවර්ධන අංශය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය හා ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මඟින් වැඩසටහන් ක්‍රියාවට නංවනු ලබයි .

අනෙකුත් විදේශ ආධාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධිකරණය හා අදාළ කාර්යයන්, ළමා හා කාන්තා සංවර්ධන විෂය සම්බන්ධ වෙනත් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන හා අමාත්‍යාංශ උපදෙස් පරිදි සම්බන්ධීකරණය සිදු කෙරේ. අවශ්‍යතාවය පදනම් කර ගනිමින් කාලීන විශේෂ ක්ෂේත්‍රවලට අදාළ දත්ත රැස් කිරීම සිදු කෙරෙන අතර, දැනටමත් ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ තොරතුරු දිවයින පුරා පවතින පළාත් සභා හා පළාත් පාලන ආයතන මට්ටමින් රැස් කරමින් පවතී.

## 2.7 අභ්‍යන්තර කටයුතු ඒකකය පවත්වා ගෙන යාම

රාජ්‍ය නිලධාරීන්ගේ සුපිළිපන්නභාවය තහවුරු කරමින් අල්ලස් හා දූෂණයෙන් තොර රාජ්‍ය සේවාවක් ශ්‍රී ලංකාව තුළ නිර්මාණය කිරීමේ අත්‍යාවශ්‍ය වැදගත්කම කෙරෙහි අවධානය යොමු කරමින්, ඒ අරභයා පවතින රජයේ ප්‍රතිපත්ති කෙරෙහි අනුගත වෙමින්, අමාත්‍යාංශය තුළ අභ්‍යන්තර කටයුතු ඒකකයක් (IAU) පිහිටුවන ලද අතර, එහි කාර්යයන් අඛණ්ඩව අතිශයින් ප්‍රමුඛව මෙන්ම විනිවිදභාවයෙන් යුතුව සිදු කර ඇත. අමාත්‍යාංශය වෙනුවෙන් අනෙකුත් අංශ / දෙපාර්තමේන්තු සමඟ ඒකාබද්ධව අමාත්‍යාංශයේ අභ්‍යන්තර කටයුතු ඒකකය පවත්වා ගෙන යාම හා එහි මෙහෙයුම් කටයුතු සිදු කිරීමේ වගකීම මෙම අංශයට පැවරී ඇත. ඒ යටතේ දැනුවත් කිරීමේ හා උපදෙස් ලබා දීමේ සාකච්ඡා වට කිහිපයක් සිදු කර ඇත. එමඟින් දැනුවත් කිරීමේ අත්පත්‍රිකා, පෝස්ටර් හා ස්ටිකර් බෙදා හැරීම තුලින් අනෙකුත් නිලධාරීන් දැනුවත් කිරීම සිදු කර ඇත.

## 2.8 වැඩසටහන් ඇගයීම

ශ්‍රී ලංකාවේ ජාතික ඇගයුම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සියලුම රාජ්‍ය ආයතනවල වගකීම හා කාර්ය භාරය වේ. ඒ පිළිබඳව සැලකිල්ලට ගෙන මෙම අංශය මඟින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ක්‍රියාත්මක පාසල් ළමා ආරක්ෂක කමිටු වැඩසටහන පිළිබඳ ඇගයීම් සිදු කිරීමට අවශ්‍ය මූලික කටයුතු ඉටු කර ඇත. මේ සඳහා රු. මිලියන 3.0ක ප්‍රතිපාදන ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂය යටතේ අමාත්‍යාංශය වෙත ලබා දී ඇත.

## 3.0 වැඩසටහන් කිහිපයක විශේෂ අවස්ථා



දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම



ඒකාබද්ධ ප්‍රගති සමාලෝචන රැස්වීම






දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2025-2029 එළිදැක්වීම හා රාජ්‍ය ආයතන තුළ අභ්‍යන්තර කටයුතු ඒකකය දියත් කිරීමේ ජාතික සමගාමී වැඩසටහන හා අමාත්‍යාංශයීය අභ්‍යන්තර කටයුතු ඒකකය ස්ථාපිත කිරීම





පුත්තලම දිස්ත්‍රික් වනාතවිල්ලුව ප්‍රා.ලේ.කො. ක්ෂේත්‍ර නිරීක්ෂණ හා පසුවිපරම්





මාතර දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර නිරීක්ෂණය හා නිලධාරී දැනුවත් කිරීම

## 4.0 ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්හි 2025.09.30 දිනට ප්‍රගතිය

| අනු අංකය | ව්‍යාපෘතිය/ කාර්යය | මූල්‍ය ඉලක්කය (රු. මි.) | මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | ස්ත්‍රී | පුරුෂ |
| **1.** | **ව්‍යවසායකත්ව සංවර්ධනය තුලින් කාන්තාවන් සවිබලගැන්වීම** | | | | | | |
| 1.1 | ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ ආපදා කළමනාකරණය සහ දේශගුණික විපර්යාස පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම | 0.613 | - | වැඩසටහන් - 03<br>කුරුණෑගල, ගම්පහ,<br>අනුරාධපුර | කුරුණෑගල දිස්ත්‍රික් වැඩසටහන සැලසුම් කර ඇත. | - | |
| 1.2 | අල්ලස් හා දූෂණ වැළැක්වීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 0.613 | - | වැඩසටහන් - 01<br>සාකච්ඡා - 10 | වැඩසටහන සැලසුම් කර ඇත.<br>සාකච්ඡා - 07 | 172 | |
| 1.3 | ළමා හා කාන්තා සංවර්ධනය සඳහා AI භාවිතය පිළිබඳ ධාරිතා සංවර්ධන වැඩසටහන | 0.612 | - | වැඩසටහන - 03<br>මහනුවර, කොළඹ පුත්තලම | සැලසුම් කර ඇක | | |
| 1.4 | වාර්ෂික සැලසුම් සහ මෙහෙයුම් චක්‍රය පිළිබඳ නිලධාරී පුහුණුව | 0.612 | - | වැඩසටහන් - 03 | සැලසුම් කර ඇත | | |
| 1.5 | ප්‍රගති සමාලෝචන රැස්වීම් | 0.050 | 0.022 | රැස්වීම් 07 | රැස්වීම් 08 | | |
| 1.6 | විශේෂ වැඩසටහන් සම්බන්ධීකරණය හා සාකච්ඡා | 0.100 | 0.065 | රැස්වීම් - 22 | රැස්වීම් - 15 | 198 | |
| 1.7 | ක්ෂේත්‍ර අධීක්ෂණ සහ දිස්ත්‍රික් මට්ටමේ අධීක්ෂණය | 0.500 | 0.223 | ක්ෂේත්‍ර නිරීක්ෂණ 05 | දිස්ත්‍රික් අධීක්ෂණ - 01 ක්ෂේත්‍ර නිරීක්ෂණ - 04 ක් සැලසුම් කර ඇත. | 167 | |
| 1.8 | වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2024, වාර්ෂික ප්‍රගති වාර්තාව 2024 සහ වාර්ෂික ප්‍රගති වාර්තාව 2025 | 0.400 | 0.093 | වාර්ෂික කාර්ය සාධන වාර්තා - 01<br>වාර්ෂික ප්‍රගති වාර්තා - 02 | වාර්ෂික කාර්ය සාධන වාර්තා - 01<br>වාර්ෂික ප්‍රගති වාර්තා - 01 | | |
| | **එකතුව** | **3.500** | **0.403** | | | | |
| 2. | පරිගණක තාක්ෂණය හා ආපදා කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන් | 1.900 | 0.276 | පුහුණු ක්ෂේත්‍ර 13 | පුහුණු ක්ෂේත්‍ර 08ක් යටතේ වැඩසටහන් 08 | 274 | |
| 3. | කාන්තා සහ ළමා කටයුතු ඩිජිටල්කරණය | 30.000 | 0.055 | කාන්තා හිංසන සහ ළමා අපයෝජන විධිමත් කළමනාකරණ ක්‍රමවේදයක් සැකසීම | තත්ත්ව විශ්ලේෂණය හා තාක්ෂණික රැස්වීම් 12 | 174 | 102 |
| | **මුළු එකතුව** | **35.400** | **0.734** | | | **1087** | |

# 10.3 මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය

## දැක්ම


ශාරීරික, මනෝ සමාජීය සහ ප්‍රජානන සංවර්ධනයෙන් පිරිපුන් ශ්‍රී ලාංකීය මුල් ළමාවිය දරු පරපුරක් බිහි කිරීම.

## මෙහෙවර

ජාතික මට්ටමේ කේන්ද්‍රීය ආයතනය ලෙස ප්‍රතිපත්ති සහ වැඩසටහන් සම්පාදනය, ක්‍රියාත්මක කිරිම, ඇගයීම හා පසුවිපරම් කිරීම තුළින් ශ්‍රී ලාංකීය මුල් ළමාවිය දරුවන්ගේ සමස්ත සංවර්ධනය සහතික කිරීම.

## සංවිධාන ව්‍යුහය

මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ සංවිධාන ව්‍යුහය



2023 ජූලි - 2024 ජූනි දක්වා ලියාපදිංචි උපත් සංඛාව 228,091

පෙර පාසැල් ළමුන්- 502,269

පෙර පාසල් සංඛ්‍යාව - 18,801

පෙර පාසැල් ගුරුවරුන්- 30,536

**ගර්භණී හා කිරිදෙන මව්වරුන් සඳහා පෝෂණ ආහාර මල්ල**

රු.මිලියන 7,500.000

ඉලක්කගත මව්වරුන්- 200,000

ප්‍රගතිය- **154,055**

**පෙර පාසල් ළමුන් සඳහා උදෑසන ආහාර වේල**

රු.මිලියන 3.200.000

ඉලක්කය- ළමුන් 155,000

ප්‍රගතිය ළමුන්- 152,000

**පෙර පාසල් ගුරුවරුන් සඳහා ගුරු අභිමානි දීමනාව**

රු.මිලියන 1,050.00

ඉලක්කය- ගුරුවරුන් 15,833

ප්‍රගතිය ගුරුවරුන් - 15,833

*මූලාශ්‍රය - මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය හා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

## 1.0 ප්‍රධාන කාර්යභාරය

- මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති, ව්‍යාපෘති/වැඩසටහන් සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීමේ හා නියාමනය කිරීමේ කේන්ද්‍රීය ආයතනය ලෙස කටයුතු කිරීම.
- රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික අංශයේ මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය හා ජාලගත කිරීම.
- මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනයට අදාළ වන පර්යේෂණ සිදු කිරීම, දත්ත රැස් කිරීම සහ වැඩසටහන් සම්පාදනය කිරීම.
- මුල් ළමාවිය දරුවන්ගේ සමස්ත සංවර්ධනය සඳහා අදාළ වන පුහුණු වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- මුල් ළමාවිය සංවර්ධනයට අදාළ මානව සම්පත් සංවර්ධනය.

## 2.0 ක්‍රියාත්මක කළ ප්‍රධාන සංවර්ධන වැඩසටහන්

### 2.1 ගර්භණී හා කිරිදෙන මව්වරුන් සඳහා රුපියල් 45,000/- ක පෝෂණ දීමනාවක් ලබාදීමේ වැඩසටහන

පෝෂණ ඌණතා හා සෞඛ්‍ය හේතු සහිතව හෝ පවුලේ ආදායම එම පවුලේ ඇස්තමේන්තුගත මධ්‍යයන මාසික වියදමට වඩා අඩු පවුල්වල මව්වරු සඳහා ගර්භණී සමයේ අවසන් මාස 06 සහ කිරිදෙන සමයේ පලමු මාස 04 සඳහා අවශ්‍ය පෝෂණීය ආහාර ද්‍රව්‍ය ලබාගැනීම වෙනුවෙන් රු.45,000/- ක් වටිනා වවුචර් පත් නිකුත් කෙරේ. 2025 වර්ෂයේ දී දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

### 2.2 පෙර පාසල් ගුරුවරියන් සඳහා මාසික දීමනාවක් ලබාදීමේ වැඩසටහන

පෙර පාසල් ගුරුවරුන්ගේ සේවය ඇගයීම හා ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම අරමුණු කර ගෙන පෙර පාසල් ගුරුවරුන්ට මාසික දීමනාවක් ලබාදීමේ ගුරු අභිමානී වැඩසටහන 2025 වර්ෂයේ දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක වේ. 2025 ජනවාරි මස සිට මැයි 31 දින දක්වා ලබාදුන් රු.5000/- ක දීමනාව 2025 ජුනි මස සිට රු.6000/- ක් දක්වා ඉහළ නංවා ඇත.

### 2.3 පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා ආයතන නියාමනය හා අධීක්ෂණය

පෙර පාසල් ගුරුවරුන්ගේ සේවයේ ගුණාත්මක තත්ත්වයෙන් පවත්වා ගැනීම, මුල් ළමාවිය සංවර්ධනය හා අධ්‍යාපනය සම්බන්ධයෙන් මනා දැනුමෙන්, කුසලතාවයෙන් හා යහපත් ආකල්පවලින් යුතු පෙර පාසල් ගුරුවරුන් බිහිකිරීමේ අරමුණ මත මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ මූලිකත්වයෙන් සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගයෙන් පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා ආයතන ලියාපදිංචි කිරීම සඳහා 2025 වර්ෂයේ නවක අයදුම්පත් කැඳවීම් සිදු කරන ලදී. මේ සඳහා අයදුම්පත් 102 ප්‍රමාණයක් ලැබී ඇති අතර, එම ආයතනයන්හි ලියාපදිංචි කටයුතු කිරීමට අවශ්‍ය ක්ෂේත්‍ර කටයුතු මේ වන විට සිදු කර ඇත.

## 2.4 පෙර පාසල් දරුවන් /මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා උදෑසන ආහාරවේලක් ලබාදීමේ වැඩසටහන

පෙර පාසල්ගත අඩුබර සහිත දරුවන්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නංවාලීමේ අරමුණ මත 2025 වර්ෂයේ දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි වතු සහ වතු නොවන ක්ෂේත්‍ර තුළ ක්‍රියාත්මක කරනු ලබන මෙම වැඩසටහන වෙනුවෙන් එක් දරුවකු සඳහා දිනකට රු.100/- ක් වෙන්කර ඇත.

## 2.5 මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව

ජාතික මට්ටමේ සැලසුම් සම්පාදනයේ දී, ක්‍රියාත්මක කිරීමේදී සහ මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ කාර්යයන්වල දී, ජාතික මට්ටමේ සිට බිම් මට්ටම දක්වා බහු ආංශික සහයෝගීතාවය සහතික කිරීම හා මුල් ළමාවිය සංවර්ධනය හා ජාතික මට්ටමේ තීන්දු තීරණ ගැනීම මෙම කමිටුවෙහි අරමුණ වේ.

## 2.6 මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2018) ක්‍රියාත්මක කිරීම

මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2018) ක්‍රියාත්මක කිරීම සඳහා වන පස් අවුරුදු බහු ආංශික ක්‍රියාකාරී සැලැස්ම යුනිසෙෆ් ආයතනයේ මූල්‍ය අනුග්‍රහය යටතේ සකස් කර ඇත. ඒ අනුව, 2025 – 2029 දක්වා, සියලු පාර්ශ්වකාර ආයතන සම්බන්ධ කර ගනිමින්, මෙම ක්‍රියාකාරී සැලැස්මෙහි අවසන් වලංගුකරණය සිදුකර ඇත. අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමු කර ඇති අතර, 2025 වර්ෂයේ සිට එය ක්‍රියාත්මක වේ.

## 2.7 මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම්

මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් අතර මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම, ජාතික/පළාත්/ප්‍රාදේශිය සහ ග්‍රාමීය මට්ටමේ ක්‍රියාත්මක වැඩසටහන්හි සාර්ථකත්වය පසු විපරම් කිරීම සහ නිලධාරීන්ගේ රාජකාරී කටයුතු තුළ දී ඇතිවන ගැටළු හඳුනාගැනීම හා ඒවාට විසඳුම් යෝජනා කිරීම යන අරමුණු මත පදනම් වෙමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

## 2.8 "සෙනෙහෙ තටාක" නිවස පදනම් කරගත් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධන වැඩසටහන ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන

දෙමාපියන් හා රැකබලාගන්නන්ගේ මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණය හා සම්බන්ධ දැනුවත්භාවය ඉහළ නැංවීම තුළින්, දරුවාගේ සමස්ත සංවර්ධනය තහවුරු කිරීම අරමුණු කරගනිමින් "සෙනෙහෙ තටාක" නිවස පදනම් කරගත් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධන වැඩසටහන ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන යුනිසෙෆ් ප්‍රතිපාදන මත දිස්ත්‍රික්ක 25ක් ආවරණය කරමින් ක්‍රියාත්මක වේ.

### 2.9 යහපත් මාපියභාවය හා මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ දෙමාපියන්, පෙර පාසල් ගුරුවරියන්, ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන

මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණය හා සම්බන්ධව දෙමාපියන් හා රැකබලාගන්නන්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම හා ආකල්ප සංවර්ධනය තුළින් ප්‍රතිචාරාත්මක දෙමාපියකු/ රැකබලාගන්නකු බවට පත් කිරීමේ අරමුණින් මෙම වැඩසටහන දිස්ත්‍රික් 25 ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක වේ.

### 2.10 මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සතිය

මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය සම්බන්ධිත ගුණාත්මක සේවාවන් ලබා ගැනීමේ අවශ්‍යතාව හා වැදගත්කම පිළිබඳ පොදු ජනතාව තුළ දැනුවත්බව ඇති කිරීමේ ප්‍රධාන අරමුණින් යුතුව සෑම වර්ෂයකම ජූලි මස 14 දින සිට 20 දින දක්වා මුල් ළමාවිය විෂය හා සම්බන්ධයෙන් වගකිවයුතු සියලු පාර්ශ්වයන් ඒකරාශි කර ගනිමින්, මුල් ළමාවිය දරුවන්ගේ ආරක්ෂාව, රැකවරණය හා සංවර්ධනය ඉලක්ක කරගත් වැඩසටහන් ජාතික, පළාත්, දිස්ත්‍රික්ක සහ ග්‍රාමීය මට්ටමින් පැවැත්වීම සිදු කරයි. 2025 වර්ෂයේ මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණය පිළිබඳ ජාතික සතිය සැමරීම **"පුංචි අපට ලොව දිනන්න - සෙල්ලමටත් ඉඩක් දෙන්න"** තේමාව ඔස්සේ පහත වැඩසටහන් ක්‍රියාත්මක විය.

**වගුව 4 - මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සතිය**

| අනු අංකය | පාර්ශ්වකරුවන් | වැඩසටහන |
|---|---|---|
| 1 | මුල් ළමාවිය සංවර්ධනය සම්බන්ධයෙන් කටයුතු කරන සියලු කණ්ඩායම් | දැනුවත්භාවය ඉහළ නැංවීම හා සෙල්ලම් පාදක මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ආකල්ප සංවර්ධනය කිරීම |
| 2 | මුල් ළමාවිය සංවර්ධනය සම්බන්ධයෙන් කටයුතු කරන සියලු කණ්ඩායම් | මුල් ළමාවිය ග්‍රාමීය සම්බන්ධීකරණ කමිටුවේ සාමාජිකයින් දැනුවත් කිරීම හා බලගැන්වීම සඳහා වැඩසටහන |
| 3 | තරුණ කණ්ඩායම් සහ නව විවාපත් කණ්ඩායම් | ගැබිණි මවුවරුන් දැනුවත් කිරීමේ සහ රසවින්දනාත්මක ජාතික වැඩසටහන |
| 4 | ප්‍රතිපත්ති සම්පාදකයින් | මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික කමිටුව කැඳවන අවස්ථාවට සමගාමී වැඩසටහන |
| 5 | දෙමාපියන්, භාරකරුවන් හා ප්‍රජාව | යහපත් මාපියභාවය හා මුල් ළමාවිය සංවර්ධනය |
| 6 | පෙර පාසල් ළමුන් | මුල් ළමාවියේ දරුවන් සඳහා ක්‍රියාකාරකම් පාදක පොකුරු වැඩසටහන |
| 7 | මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන/පෙර පාසල් ගුරුවරියන්, දිවා සුරැකුම් මධ්‍යස්ථාන පාලිකාවන්, ළමා නිවාස පාලිකාවන් | සෙල්ලම් පාදක ඉගැන්වීම පිළිබඳව දැනුවත් කිරීමේ සාකච්ඡාමය වෙබිනා වැඩසටහන |

**2.11 මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන**

2014 වර්ෂයේ සිට අනුයුක්ත වූ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සේවයේ නියුතු මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ගේ රාජකාරී කටයුතු ඉතා කාර්යක්ෂමව සහ කඩිනමින් ඉටු කරගැනීම සහ දැනුම යාවත්කාලීන කිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කර ඇත.

**2.12 ළමා නිවාස සහ දරුවන් භාරගැනීමේ මධ්‍යස්ථානවල සංවර්ධනය සඳහා ළමා මිතුරු පරිසරයක් ඇති කිරීමේ වැඩසටහන**

වැලිකඩ බන්ධනාගාරයේ රැකවරණ මධ්‍යස්ථානය තුළ සිටින මුල් ළමාවිය දරුවන්ගේ සංවර්ධන අවස්ථාවන් පුළුල් කෙරෙන සහ ධනාත්මක උත්තේජන සපයන ආකාරයේ භෞතික පරිසරයක් නිර්මාණය කිරීම. ළමුන් රැකබලාගන්නා සේවක පිරිසට මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ මූලික සංකල්ප පිළිබඳ දැනුම හා දරුවන් රැකබලා ගැනීමේ යහපත් ක්‍රමවේද සම්බන්ධ පුහුණුව ලබාදීම. භෞතික පහසුකම් පුළුල් කිරීම සහ මානව සම්පත සංවර්ධනය තුළින් රැකවරණය හා ආකල්ප සංවර්ධනය ලබන දරුවන්ගේ සමස්ත ගුණාත්මක සංවර්ධනය ළඟා කරවීම මෙහි මූලික අරමුණු වේ.

**2.13 හදිසි ආපදා අවස්ථාවන්හි දී මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ කටයුතු 2025**

පුළුල් හා සමෝධානිත මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධන සේවා පද්ධතියක මනා සහාය ලබමින් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සෑම විටම සුරක්ෂිත රැකවරණයකින් යුතු හිතකර පරිසරයක් තුළ, මුල් ළමාවියේ වෙසෙන සියලුම ශ්‍රී ලාංකික දරුවන්ගේ දිවි පැවැත්ම, වර්ධනය සහ සංවර්ධනය ඇති කිරීම උදෙසා ක්‍රියාත්මක කරවීම මේ යටතේ සිදුවේ.

**2.14 ලෝක ළමා දින ජාතික වැඩසටහන**

ලෝක ළමා දිනය වෙනුවෙන් පවත්වනු ලබන වැඩසටහන් මාලාවට සමගාමීව **ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමෙහි ලා පෙර පාසල් ගුරු භූමිකාව** යන මාතෘකාව යටතේ දිස්ත්‍රික්ක 25 ආවරණය කර ගනිමින් පෙර පාසල් ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී

**2.15 ෆේස්බුක් පිටුව සහ යූ ටියුබ් මාධ්‍ය මගින් මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ කෙටි වීඩියෝ පට සහ සටහන් මඟින් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන**

මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය විසින් නිල ෆේස්බුක් පිටුවක් (NSECD Facebook) සහ යූ ටියුබ් චැනලයක් (NSECD YouTube Channel) ක්‍රියාත්මක කරනු ලබයි. ඒ යටතේ, මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනයට අදාළව සකස් කරන ලද විවිධ වීඩියෝපට, දැන්වීම් හා සටහන් සමාජ මාධ්‍ය වෙත මුදා හැර ඇත.

## 2.16 මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය සඳහා සේවාවන් සැපයීම සම්බන්ධයෙන් ග්‍රාමීය කමිටු සාමාජිකයින් දැනුවත් කිරීම සහ කමිටු සාමාජිකයින් බලගැන්වීමේ වැඩසටහන

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය නියෝජනය කරනු ලබන ළමා අංශයට අදාල සියලු ආයතන හා නිලධාරීන් ඒකාබද්ධව ග්‍රාම නිලධාරී වසමකට එක බැගින් ග්‍රාමීය කමිටු පිහිටුවීම හා ක්‍රියාත්මක මට්ටමින් පවත්වා ගැනීමේ අවශ්‍යතාව සපුරමින් ග්‍රාමීය ළමා සංවර්ධන කමිටු සාමාජිකයින් දැනුවත් කිරීම හා කමිටු සාමාජිකයින් බලගැන්වීම මේ යටතේ සිදු කරනු ලබයි.


මෙම වැඩසටහන තුළින් සංවර්ධන අවස්ථා ලැබීම, සෞඛ්‍ය හා පෝෂණය, රැකවරණය හා ආරක්ෂාව යන අංශයන්ගෙන් අවදානමට ලක්ව ඇති දරුවන් හඳුනාගනිමින් ඒ සඳහා අවශ්‍ය මැදිහත්කරණය සිදු කිරීමට අවශ්‍ය දැනුම ලබාදීම සහ ග්‍රාමීය කමිටු සාමාජිකයින් ඒ සඳහා බලගැන්වීම තුළින් දරුවන් සඳහා ආරක්ෂාකාරී පවුල් පරිසරයක් සහ සාමාජීය පරිසරයක් නිර්මාණය කිරීමට ද අපේක්ෂා කෙරේ.

## 3.0 වැඩසටහන් කිහිපයක විශේෂ අවස්ථා



මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සතිය
2025.07.14 – 2025.07.20











මුල් ළමාවිය සංවර්ධනය ක්ෂේත්‍ර පරීක්ෂාවන්

# 4.0 ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්හි 2025.09.30 දිනට ප්‍රගතිය

<table>
<tr><th rowspan="2">අනු අංකය</th><th rowspan="2">ව්‍යාපෘතිය/ කාර්යය</th><th rowspan="2">මූල්‍ය ඉලක්කය (රු.මි.)</th><th rowspan="2">මූල්‍ය ප්‍රගතිය (රු.මි.)</th><th rowspan="2">භෞතික ඉලක්කය</th><th rowspan="2">භෞතික ප්‍රගතිය</th><th colspan="2">ප්‍රතිලාභීන්/ ප්‍රතිලාභීන් සංඛ්‍යාව</th></tr>
<tr><th>ස්ත්‍රී</th><th>පුරුෂ</th></tr>
<tr><td>01.</td><td>ගර්භනී හා කිරිදෙන මව්වරුන්ට රුපියල් 45,000/- ක පෝෂණ දීමනාවක් ලබාදීමේ වැඩසටහන</td><td>7500.00</td><td>4,837.201</td><td>200,000 ගර්භනී හා කිරිදෙන මව්වරු</td><td>154,055 ආසන්න වශයෙන් ගැබිණි හා කිරිදෙන මව්වරු)</td><td>154,055 ගැබිණි හා කිරිදෙන මව්වරු</td><td></td></tr>
<tr><td>02.</td><td>පෙර පාසල් දරුවන්/ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා උදෑසන ආහාර වේලක් ලබා දීමේ වැඩසටහන</td><td>3200.00</td><td>1,564.455</td><td>155,000 පෙර පාසල් දරුවන් (වතු හා වතු නොවන)</td><td>152,000 පෙර පාසල් දරුවන්</td><td>152,000 පෙර පාසල් දරුවන්</td><td></td></tr>
<tr><td>03.</td><td>පෙර පාසල් ගුරුවරියන් සඳහා “ගුරු අභිමාණී”- මාසිකව රු. 5000/- ක වැඩසටහන</td><td>1050.00</td><td>599.772</td><td>15,833 පෙර පාසල් ගුරුවරියන්</td><td>15,833 පෙර පාසල් ගුරුවරියන්</td><td>15,833 පෙර පාසල් ගුරුවරියන්</td><td></td></tr>
<tr><td>04.</td><td>“සෙනෙහෙ තටාක” නිවස පදනම් කරගත් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය වැඩසටහන ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන</td><td>3.000 (යුනිසෙෆ් ප්‍රතිපාදන)</td><td>2.800</td><td>පුහුණු වැඩසටහන් 4</td><td>පුහුණු වැඩසටහන් 2</td><td></td><td></td></tr>
<tr><td colspan="8">05. මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය (171 – 02- 08 - 14 - 2509 )</td></tr>
<tr><td>5.1</td><td>මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව</td><td>0.210</td><td>0.063</td><td>කමිටු 03</td><td>කමිටු 01</td><td></td><td></td></tr>
<tr><td>5.2</td><td>මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2018) ක්‍රියාත්මක කිරීම සඳහා වන පස් අවුරුදු බහු ආංශික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම</td><td>0.129</td><td>0.129</td><td>01සැලසුම්</td><td>01සැලසුම්</td><td>-</td><td>-</td></tr>
<tr><td>5.3</td><td>යහපත් මාපියභාවය හා මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ දෙමාපියන්, පෙර පාසල් ගුරුවරියන්, ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන</td><td>5.371</td><td>1.798</td><td>වැඩසටහන් 340</td><td>වැඩසටහන් 113</td><td></td><td></td></tr>
<tr><td colspan="2">උප එකතුව</td><td>5.710</td><td>1.990</td><td></td><td></td><td></td><td></td></tr>
</table>

| අනු අංකය | ව්‍යාපෘතිය/ කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන්/ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | ස්ත්‍රී | පුරුෂ |
| 5.4 | මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සතිය | 8.100 | 7.343 | වැඩසටහන් 7 | වැඩසටහන් 7 | | |
| 5.5 | මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන | 1.170 | 0.972 | වැඩසටහන් 1 | වැඩසටහන් 1 | | |
| 5.6 | ළමා නිවාස සහ දරුවන් භාරගැනීමේ මධ්‍යස්ථානවල සංවර්ධනය සඳහා ළමා මිතුරු පරිසරයක් ඇති කිරීමේ වැඩසටහන | 3.020 | - | වැඩසටහන් 2 | | | |
| 5.7 | හදිසි ආපදා අවස්ථාවන්හිදී මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ කටයුතු 2025 | 1.000 | | අවශ්‍යතා හා ඉල්ලීම් මත | | | |
| උප එකතුව | | **13.290** | **8.315** | | | | |
| මුළු එකතුව | | **19.000** | **10.305** | | | | |

# 10.4 පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ අධිකරණය විසින් පරිවාස ක්‍රමය අත්හදා බැලීමක් වශයෙන් ක්‍රියාත්මක කරනු ලැබ ඇත්තේ වර්ෂ එක්දහස් නවසිය තිස් ගණන්වලදී ය. ඉන් අනතුරුව වර්ෂ 1944 දී සම්මත කරන ලද අංක 22 දරණ පරිවාස ආඥා පනත තුළින් පරිවාස ක්‍රමය ලංකා අධිකරණයේ ස්ථාපිත වී තිබේ. ඒ අනුව බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා සම්බන්ධ පරිවාස සේවාව පරිවාස නිලධාරීන් කිහිප දෙනෙකුගෙන් ආරම්භ වී ඇත.

ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනත ක්‍රියාත්මක කිරීමත් සමඟ ළමයින් වෙත සැපයෙන සේවාවන් එක්තැන් කිරීමේ වැදගත්කම පිළිබඳ ලද නිර්දේශ අනුව 1956 ඔක්තෝම්බර් 01 දින පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ආරම්භ විය. වර්තමානයේ දී කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තුවේ කටයුතු ක්‍රියාත්මක කෙරේ.

**දැක්ම**

ළමයින්ගේ අයිතීන් තහවුරු වූ ඔවුනට සංවේදී හිතකර සමාජයක්

**මෙහෙවර**

ජාතික ප්‍රතිපත්තීන් හා ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට අනුකූලව අනාථ, අත්හල හා අසරණ ළමයින් ද, නීතිමය ගැටළුවලට බඳුන් වූ ළමයින් ද, සුවිශේෂී කර ගනිමින් සියලුම ළමුන්ගේ අයිතිවාසිකම් තහවුරු කරමින් ඔවුනට සමාන අවස්ථාවන් උදා කර දීම.

## 1.0 ප්‍රධාන කාර්යභාරය

- දෙපාර්තමේන්තු කාර්යභාරය
- නීතිය සමඟ ගැටුම් ඇති කරගත් දරුවන් පුනරුත්ථාපනය
- අනාථ, අත්හල හා අසරණ දරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ක්‍රියාමාර්ග ගැනීම
- නීතිමය ගැටළුවලට ලක් වූ ළමුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම
- ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ තහවුරු කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග ගැනීම
- අදාළ අමාත්‍යාංශ හා පළාත්සභා සම්බන්ධීකරණය කරමින් ඔවුන්ගේ නිර්දේශ මත ළමා අයිතිවාසිකම් සම්බන්ධව දැනට පවතින අණ පනත් ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි සංශෝධනය කිරීම
- විදේශීය හදාවඩා ගැනීම් සම්බන්ධ කටයුතු
- නීතිය සමඟ ගැටුම් ඇති කර ගත් දරුවන් පුනරුත්ථාපනයට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම

- පවතින අභ්‍යන්තර වත්කම් හා කළමනාකරණ ක්‍රමයන් වැඩිදියුණු කිරීම
- ජනතා අවශ්‍යතා තෘප්තිමත් වන ආකාරයෙන් කාර්යක්ෂම සේවාවක් සැපයීම
- පුහුණු හා පර්යේෂණ කටයුතු සිදු කිරීම

## 2.0 ක්‍රියාත්මක කළ ප්‍රධාන සංවර්ධන වැඩසටහන්

ළමයින්ගේ සුබසාධනය පිළිබඳ ප්‍රවේදිතාවයක් සහිත විශේෂිත අනු නියෝජිතායතනවල සහ ජාත්‍යන්තර සංවිධානවල ව්‍යවස්ථාවල සහ අදාළ සාධනපත්‍රවල පිළිගනු ලැබ ඇති ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයන් අනුව, ශ්‍රී ලංකාව තුළ ළමා අයිතිවාසිකම් පිළිගන්නා නීති සහ ප්‍රතිපත්ති ඇති කළ යුතු හෙයින්, ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය රජය විසින් ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව පහත දැක්වෙන කරුණු ආවරණය වන පරිදි සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කෙරේ.

- ජීවත්වීමට සහ සංවර්ධනයට ඇති අයිතිවාසිකම් සහතික කිරීම
- ළමා සහභාගිත්වය තහවුරු කිරීම
- ළමා ආරක්ෂණය
- ළමුන්ගේ පැවැත්ම සාක්ෂාත් කිරීම

### 2.1 දරුවන්ගේ අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම උදෙසා වන වැඩසටහන්

අනිවාර්ය අධ්‍යාපන පනත අනුව සෑම දරුවකුම අවුරුදු 16 දක්වා අධ්‍යාපනය ලැබීම අනිවාර්ය වේ. එමෙන්ම ළමා අයිතිවාසිකම් සම්මුතියේ 29 වන වගන්තිය අනුව සෑම දරුවෙකුටම අධ්‍යාපනය ලැබීමේ අයිතිවාසිකමක් ඇති අතර, ළමා සංවර්ධනයේ දී එය ඉතා වැදගත් සාධකයකි. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය අතරමඟ නතර කරන ළමුන් නිසා ළමා ශ්‍රමිකයින්, ළමා මව්වරුන් බිහිවීම හා විවිධ අපයෝජනවලට ළමුන් ලක්වන අවස්ථා බහුල වී ඇත. දෙමාපියන් අහිමි වීම, දෙමාපියන්ගේ නොදැනුවත්කම, නොසැළකිල්ල, මව විදේශගත වීම, ආර්ථික දුෂ්කරතා ආදී විවිධ කරුණු මත ළමුන්ගේ පාසල් අධ්‍යාපනය අතරමඟ නතරවීම සිදුවනු ඇත.

#### 2.1.1 අධ්‍යාපන ආධාර වැඩසටහන

පාසැල් අධ්‍යාපනය අතරමඟ නතර වීමේ අවදානමක් ඇති දරුවන් හඳුනාගෙන ඔවුන් වෙත මූල්‍ය අනුග්‍රහය දැක්වීම මෙහි දී සිදු කරයි. එක් දරුවකුට එක්වරක් පමණක් ගෙවන රු.5,000/- ක ආධාරයක් මෙහි දී ලබා දෙනු ලබයි.

#### 2.1.2 කැපකරු දෙගුරු ආධාර වැඩසටහන

මෙම වැඩසටහන අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ගේ අධ්‍යාපනය අඛණ්ඩව සිදු කර ගෙන යාමට මූල්‍යාධාර ලබා දෙන වැඩසටහනකි. මේ සඳහා තෝරා ගන්නා දරුවන්ට අ.පො.ස. සා/ පෙළ දක්වා ආධාර මුදල් හිමි වේ. ආර්ථික දුෂ්කරතා නිසා පාසල් අධ්‍යාපනයට බාධා එල්ල වී ඇති දරුවන්ගේ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් හඳුනාගෙන දෙපාර්තමේන්තුව වෙත ගෙන්වා ගනු ලබන අතර නිර්ණායක මත තෝරා ගන්නා ළමුන් සඳහා මෙම ආධාර ප්‍රදානය කෙරේ.

### 2.1.3 හදිසි විපත් ආධාර වැඩසටහන

ක්ෂණිකව පාරිසරික සහ කාලගුණ විපර්යාස නිසා ඇතිවන ආපදා තත්ත්වයන්, නිවාස ගිනි ගැනීම් ආදිය මෙන්ම දෙමව්පියන් මිය යෑම, දරුවන් අතහැර දමා යෑම, දෙමාපියන් හදිසි අනතුරුවලට/ රෝගාබාධවලට ගොදුරු වීම, විදේශගතව නැවත නොපැමිණීම, දරුවන් තාවකාලික භාරකරුවන් අතට පත්විම, භාරකරුවන් ශාරීරික හා මානසිකව දුර්වල අය වීම වැනි හේතූන් මත අධ්‍යාපන අවස්ථා අහිමිවීමේ අවදානමක් ඇති දරුවන්ට මෙම ආධාර ලබා දීමට කටයුතු කෙරේ.

මෙහි දී එක් ළමයෙකු සඳහා රු. 10,000/- ක ආධාරයක් ලබා දේ.

### 2.1.4 සිප්සවිය

මෙය ඇට්ලස් ආයතනයේ අනුග්‍රහයෙන් ක්‍රියාත්මක වන වැඩසටහනකි. එක් ළමයෙකුට මාසිකව රු. 2500 බැගින් අනුග්‍රාහකත්වය ලබා දේ .

**වගුව 5 - "සිප්සවිය"ආධාර ලබාදීම**

| අනු අංකය | වැඩසටහන | ආධාර සඳහා ප්‍රතිපාදන යොමු කර ඇති ළමුන් සංඛ්‍යාව | වටිනාකම රු. |
|---|---|---|---|
| 1 | අධ්‍යාපන ආධාර | 140 | 700,000 |
| 2 | කැපකරු දෙගුරු ආධාර | 1,830 | 14,640,000 |
| 3 | හදිසි විපත් ආධාර | 97 | 970,000 |
| **මුළු එකතුව** | | **2,067** | **16,310,000** |

## 2.2 ළමා සහභාගීත්වය තහවුරු කෙරෙන වැඩසටහන්

### 2.2.1 ළමා සමාජ සහ ළමා සභාව

ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ 12,13,14 යන වගන්ති මඟින් ආවරණය වන ළමයින්ගේ සහභාගිත්ව අයිතිය තහවුරු කරමින් ළමයින් බලගැන්වීමේ ප්‍රධාන අරමුණින් යුතුව 2007 වර්ෂයේ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමෙන් ළමා සමාජ පිහිටුවන ලදී. මෙසේ පිහිටුවා ගන්නා ළමා සමාජ තුළින් දරුවන්ගේ සංවර්ධනයට, සාරධර්ම හා කුසලතා වර්ධනයට අදාළ විවිධ වැඩසටහන් රාශියක් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ක්‍රියාත්මක කර ඇත.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් පිහිටුවා ඇති ළමා සමාජ ඒකරාශී කර ගනිමින් ප්‍රාදේශීය ළමා සභා ද, ප්‍රාදේශීය ළමා සභාවේ නිලධාරී මණ්ඩලයේ එකතුවෙන් දිස්ත්‍රික් ළමා සභා ද, දිස්ත්‍රික්වල ළමා සභා එකතුවෙන් ජාතික ළමා සභාවක් ද ස්ථාපිත කර ඇත.

ළමා සමාජ රැස්වීම් වර්ෂයකට 3ක් බැගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමෙන් සහ දිස්ත්‍රික් මට්ටමෙන් පවත්වනු ලැබේ. ජාතික ළමා සභාව වර්ෂයකට වරක් පවත්වනු ලබයි.

**වගුව 6 - පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ළමා සමාජ සංඛ්‍යාව**

| අනු අංකය | දිස්ත්‍රික්කය | 2025 වර්ෂය තුළ ලියාපදිංචි කරන ලද ළමා සමාජ සංඛ්‍යාව | 2023 සිට 2025.09.30 දක්වා ලියාපදිංචි මුළු ළමා සමාජ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | කොළඹ | 6 | 47 |
| 2 | කළුතර | 20 | 72 |
| 3 | ගම්පහ | 11 | 56 |
| 4 | ගාල්ල | 6 | 31 |
| 5 | මාතර | 3 | 21 |
| 6 | හම්බන්තොට | 4 | 32 |
| 7 | මහනුවර | 12 | 59 |
| 8 | මාතලේ | 7 | 32 |
| 9 | නුවරඑළිය | 7 | 78 |
| 10 | අනුරාධපුරය | 4 | 23 |
| 11 | පොළොන්නරුව | 5 | 29 |
| 12 | යාපනය | 18 | 47 |
| 13 | වව්නියාව | 0 | 00 |
| 14 | කිලිනොච්චිය | 0 | 00 |
| 15 | මුලතිව් | 0 | 00 |
| 16 | මන්නාරම | 1 | 10 |
| 17 | ත්‍රිකුණාමලය | 12 | 60 |
| 18 | මඩකලපුව | 13 | 42 |
| 19 | අම්පාර | 6 | 32 |
| 20 | කුරුණෑගල | 23 | 111 |
| 21 | පුත්තලම | 3 | 28 |
| 22 | බදුල්ල | 3 | 50 |
| 23 | මොණරාගල | 2 | 42 |
| 24 | රත්නපුර | 12 | 45 |
| 25 | කෑගල්ල | 22 | 170 |
| **එකතුව** | | **200** | **1,117** |

### 2.2.2 ළමා මූලික අධ්‍යයනයන්


ළමුන්ට බලපාන ගැටළු හඳුනාගෙන එම ගැටළු අධ්‍යයනය කිරීම හා ව්‍යාපෘති වාර්තාවක් පිළියෙල කර එහි ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම තුළින් දරුවන් විපර්යකාරකයන් බවට පත් කිරීම සහ ඒ තුළින් ළමා සහභාගීත්වය වර්ධනය කිරීම මෙහි දී සිදු කරයි.

**වගුව 7 - ළමා මූලික අධ්‍යයනයන් සඳහා ප්‍රතිපාදන යොමු කිරීම - 2025**

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රතිපාදන යොමු කිරීම රු. |
|---|---|---|
| 1 | මහනුවර | 100,000 |
| 2 | කුරුණෑගල | 100,000 |
| 3 | මාතලේ | 76,000 |
| 4 | කෑගල්ල | 232,000 |
| 5 | ගාල්ල | 50,000 |
| 6 | බදුල්ල | 100,000 |
| 7 | මඩකලපුව | 50,000 |
| **එකතුව** | | **708,000** |

### 2.2.3 "නියෝ ජෙන්" (NEOGEN) ශ්‍රී ලංකා

ළමා සමාජ වැඩසටහන නවමු මාවතකට රැගෙන යාමට හා නූතන තාක්ෂණය ගුණාත්මක බවින් යුතුව පරිහරණය කිරීමට දරුවන් තුළ හැඩගැස්මක් ඇති කිරීමේ අරමුණින් ලංකාව පුරා විසිරී සිටින ළමා සමාජ දරුවන් විසින් සිදු කරන ක්‍රියාකාරකම් පොදු සමාජ මාධ්‍ය කණ්ඩායමක් හරහා ප්‍රචාරය කිරීමත්, දරුවන්ට බලපාන පොදු ගැටළු දරුවන් මඟින් ආමන්ත්‍රණය කිරීම තුළින් අර්ථාන්විත ළමා සහභාගිත්වය යතාර්ථයක් බවට පත් කිරීමත් සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) මඟින් මේ සඳහා අනුග්‍රාහකත්වය සපයනු ලබයි.




## 2.3 ළමා ආරක්ෂණය සහ පැවැත්ම තහවුරු කිරීම සඳහා සිදු කරනු ලබන වැඩසටහන්

### 2.3.1 රැකවරණ සැලසුම්

බරපතල අවදානමට ලක් විය හැකි දරුවන් එම අවදානමෙන් ඉවත් කර පවුල තුළ සුරක්ෂිත කිරීමට රැකවරණ සැලසුම් වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. අවදානම් තත්ත්වයේ පසු වන දරුවන් සඳහා දිගු කාලීනව ආරක්ෂාව සහතික කිරීමේ වැඩපිළිවෙල ආරක්ෂණ සැලසුම් සකස් කිරීමයි. ළමා ආරක්ෂාව සහතික කිරීමේ ශිල්පීය ක්‍රමවේදයක් ලෙස මෙය හඳුනා ගැනේ. මෙමඟින් දරුවාට ආරක්ෂාව සහ සංවර්ධනය ලැබෙන අතරම පවුල් නඟා සිටුවීම ද සිදු වෙයි. විශේෂයෙන් දරුවන්ගේ පෝෂණය හා සංවර්ධනයට අවශ්‍ය පවුලේ ආදායම් මාර්ග වැඩිදියුණු කිරීම, සනීපාරක්ෂක පහසුකම් වර්ධනය මෙන්ම අධ්‍යාපන තත්ත්වය නඟා සිටුවීම සඳහා අවශ්‍ය පහසුකම් සපයා දීමට මේ තුළින් හැකියාව ලැබී ඇත.

### 2.3.2 ළමා අයිතිවාසිකම් පිළිබඳ මෙහෙයුම් කමිටු වැඩසටහන

ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යයෙහි ලා ප්‍රජා පාදක සමාජ ව්‍යුහයන් ස්ථාපිත කිරීමත්, ශක්තිමත් කිරීමත් මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබයි. ඒ අනුව ළමා අයිතිවාසිකම් ප්‍රජාව අතරට රැගෙන යාම, ළමුන් විෂයයෙහි ඇති ගැටළු සඳහා සාධනීය මැදිහත්වීමක් ලබා දීම, එම කාර්යයන් රජය ලෙස මෙහෙයුම් ක්‍රියාවලියට ඇතුළත් වීම වෙනුවෙන් ළමා අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් කමිටු ක්‍රියාවලිය පවත්වාගෙන යනු ලබයි.

මෙම වැඩසටහන ග්‍රාමීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා වන සෑම පරිපාලන තලයක දීම නිලධාරීන් හා ප්‍රජාව සම්බන්ධ වෙමින් පවත්වාගෙන යනු ලබන කමිටු ව්‍යුහයක් ලෙස ක්‍රියාත්මක වේ. ග්‍රාම නිලධාරී වසම් මට්ටමේ දී සෑම ගමකටම ග්‍රාමීය ළමා සංවර්ධන කමිටු පිහිටුවා ඇත. ඒ සඳහා ව්‍යවස්ථාපිත කරුණු හා විධිමත්භාවයක් ඇති කිරීම උදෙසා විධිමත් මාර්ගෝපදේශනයක් ද හඳුන්වා දී ඇත. එමෙන්ම ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුව ද, දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික් මෙහෙයුම් කමිටුව ද, පළාත් ප්‍රධාන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පළාත් මෙහෙයුම් කමිටුව සහ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් ජාතික මෙහෙයුම් කමිටුවද ලෙස මෙම කමිටු ක්‍රියාදාමය ව්‍යාප්ත වී ඇත. මෙම ක්‍රියාවලිය යටතේ 2025.08.31 දිනට දිවයින පුරා ග්‍රාමීය ළමා සංවර්ධන කමිටු 10,317ක් පිහිටුවා ඇත. ප්‍රාදේශීය කමිටු 340ක් ද, දිස්ත්‍රික් කමිටු 25ක් ද , පළාත් කමිටු 9ක් ද ක්‍රියාත්මක වේ.

ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික කමිටු මෙම දෙපාර්තමේන්තුවේ වැය යටතේ පැවැත්වේ.

### 2.3.3 ග්‍රාමීය මට්ටමේ ළමාරක්ෂක ව්‍යුහයන් ශක්තිමත් කිරීම සඳහා නිලධාරීන් දැනුවත් කිරීම

අක්‍රීය තත්ත්වයේ පවතින ග්‍රාමීය ළමා සංවර්ධන කමිටු සහ ළමා සමාජ බලගැන්වීම සහ නව කමිටු සහ ළමා සමාජ පිහිටුවීම සඳහා නිලධාරීන් දැනුවත් කිරීම මෙහි අරමුණ වන්නේ ය. මෙහි මූලික වැඩසටහන 2025.09.12 දින රත්නපුර, අනුරාධපුර සහ යාපනය දිස්ත්‍රික්කවල ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්/ සහකාරවරුන් 55 දෙනෙකු සඳහා පවත්වන ලදී. අනුග්‍රහය එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) මඟිනි.

### 2.3.4 ආන්තික ප්‍රජාව අතර සිටින දරුවන් සඳහා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්

සමාජය තුළ අවාසි සහගත තත්ත්වයට පත් වූ දරුවන් බොහෝ විට අයිතිවාසිකම් කඩවීම්වලට ලක් වන බව පැහැදිළි වේ. එයට ප්‍රධාන හේතුව වන්නේ ඔවුන්ට ස්වාධීනව ජීවත්වීම සඳහා අවශ්‍ය සමාජ, ආර්ථික පරිසරයක් නොමැති වීමයි. මේ නිසා ජීවත් වීම, අධ්‍යාපනය, සංවර්ධනය සහ සහභාගිත්වය සඳහා ඔවුනට තිබෙන ඉඩකඩ සහ අවස්ථා සීමා වී ඇත.

මේ පිළිබඳව අවධානය යොමු කරමින් අයිතිවාසිකම් කඩවීම්වලට භාජනය වූ දරුවන්ට ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කරමින් සමාන අවස්ථා ලබා දීමට විශේෂ වැඩසටහනක් ලෙස මෙය ක්‍රියාත්මක කරනු ලබයි. මේ මඟින් එම දරුවන්ගේ කල්ගිය උපත් ලියාපදිංචිය, වෛද්‍ය සායන පැවැත්වීම, කුසලතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම, භෞතික පහසුකම් ඇති කිරීම, පාසල් උපකරණ ලබා දීම, පුස්තකාල ආරම්භ කිරීම ආදී වැඩසටහන් ක්‍රියාත්මක වේ.

වගුව **8 - ආන්තික ප්‍රජාව අතර සිටින දරුවන් සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන - 2025**

| අනු අංකය | දිස්ත්‍රික්කය | යොමු කර ඇති ප්‍රතිපාදන රු. |
|---|---|---|
| 1 | මඩකලපුව | 50,000 |
| 2 | ගාල්ල | 443,000 |
| 3 | බදුල්ල | 250,000 |
| 4 | මහනුවර | 350,000 |
| 5 | කොළඹ | 200,000 |
| 6 | මාතලේ | 100,000 |
| 7 | මොණරාගල | 160,000 |
| 8 | කෑගල්ල | 150,000 |
| 9 | කුරුණෑගල | 50,000 |
| 10 | ගම්පහ | 82,000 |
| 11 | මන්නාරම | 50,000 |
| 12 | කළුතර | 50,000 |
| **එකතුව** | | **1,935,000** |

### 2.3.5 අවදානම් ළමුන් හඳුනා ගැනීමේ නියමු ව්‍යාපෘතිය

දිවයින පුරා අවදානම් ළමුන් වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී පොදුවේ සම්පත් බෙදාහැරීම වෙනුවට, අවදානම් ළමුන් ව්‍යාප්තිය සිතියම්ගත කර ඒ ඒ ප්‍රදේශවලට සුවිශේෂ වූ අවදානම් හඳුනා ගනිමින් සම්පත් බෙදා හැරීමේ අවශ්‍යතාවය, වර්තමානය වන විට තාක්ෂණික පෙරළිය හා ගෝලීයකරණය හමුවේ දැඩි ලෙස වර්ධනය වී ඇත. ඒ සඳහා මූලික පියවරක් ලෙස මෙම අවදානම් ළමුන් හඳුනා ගැනීමේ නියමු ව්‍යාපෘතිය Catholic Care for Children Sri Lanka සංවිධානයෙහි අනුග්‍රහය මත දිස්ත්‍රික් 6ක හඳුනාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30ක් සඳහා මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී.

### 2.3.6 සහභාගිත්ව ශිල්පීය පර්යේෂණ ක්‍රම පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන

පර්යේෂණ ක්‍රම පිළිබඳ දරුවන්ගේ දැනුම පුළුල් කිරීම, ළමාරක්ෂණය තුළ දරුවන්ගේ මැදිහත්වීම ශක්තිමත් කිරීමට අවශ්‍ය තාක්ෂණික කුසලතා නිලධාරීන්ට ලබා දීම අරමුණු කර ගනිමින් දෙපාර්තමේන්තුවට අනුයුක්ත ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්/ සහකාරවරුන් 33 දෙනෙකු එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ (UNICEF) අනුග්‍රහයෙන් 2025 සැප්තැම්බර් මාසයේ දී පුහුණු කරන ලදී. නිලධාරීන් විසින් ලබා ගන්නා ලද දැනුම උපයෝගී කරගෙන ළමා සමාජ/ ළමා සභා දරුවන් සමඟ ක්ෂේත්‍රයේ හඳුනා ගන්නා ලද ගැටළු අවම කිරීමට පර්යේෂණ සිදු කිරීමටත්, එකී පර්යේෂණ ශාස්ත්‍රීය සම්මේලනයක දී ඉදිරිපත් කිරීමට ඉදිරියේ දී අවස්ථාව ලබා දීමටත් අපේක්ෂා කෙරේ.

### 2.3.7 විදේශීය හදාවඩා ගැනීම

1941 අංක 24 දරන දරුකමට හදාවඩා ගැනීමේ ආඥා පනත යටතේ හදාවඩා ගැනීමට යෝජිත දරුවන්ගේ නීත්‍යානුකූල භාරකරු ලෙස ක්‍රියා කිරීමේ වගකීම දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබේ. මෙම කාර්යභාරය දේශීය හා විදේශීය වශයෙන් කොටස් 2කට බෙදේ. මෙයින් දේශීය හදාවඩා

ගැනීම් පළාත් කොමසාරිස් විසින් ද, විදේශීය හදා වඩා ගැනීම් මධ්‍යම රජයේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලැබේ.

**වගුව 9 - 2025 වර්ෂයේ විදේශීය හදාවඩා ගැනීම් පිළිබඳ තොරතුරු**

| අනු අංකය | විදේශීය රට | විදේශයන්හි සිටින ශ්‍රී ලාංකිකයන් විසින් හදාවඩා ගැනීමට ගත් දරුවන් සංඛ්‍යාව | විදේශීය හදාවඩා ගැනීම් | හදාවඩා ගැනීමට දුන් මුළු දරුවන් ගණන |
|---|---|---|---|---|
| 1 | ඇමෙරිකා එක්සත් ජනපදය | 3 | - | 3 |
| 2 | ජර්මනිය | - | 1 | 1 |

## 3.0 වැඩසටහන් කිහිපයක විශේෂ අවස්ථා



ළමා සංවර්ධන මධ්‍යස්ථාන සහ රජයේ සුරකුම් මධ්‍යස්ථානවල නේවාසික ළමුන් සඳහා රු. 5000/-ක මාසික දීමනාව ලබාදීමේ " අර්ථ " වැඩසටහන සමාරම්භය





ළමා සහභාගීත්වය පළාත් පාලන ක්‍රියාවලියට දායක කර ගැනීම



ලෝක ළමා දින ජාතික උත්සවය - 2025

## 4.0 ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්හි 2025.09.30 දිනට ප්‍රගතිය

| අනු අංකය | ව්‍යාපෘතිය / කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන්/ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | ස්ත්‍රී | පුරුෂ |
| **1.** වැය විෂය - 217-02-02-05-2202 | | | | | | | |
| 1.1 | දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් | 4.790 | 2.000 | රැස්වීම් 313 | රැස්වීම් 162 | 1920 | 912 |
| 1.2 | දිස්ත්‍රික් ළමා සභා රැස්වීම් පැවැත්වීම | 0.900 | 0.480 | ළමා සභා රැස්වීම් 75 | ළමා සභා රැස්වීම් 39 | 1161 | 792 |
| 1.3 | ජාතික ළමා සභා රැස්වීම් පැවැත්වීම | 1.000 | - | 1 | - | - | - |
| 1.4 | "ඉටු කරමු යුතුකම් - රැක ගනිමු හිමිකම්" දරුවන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් | 3.410 | 2.470 | ධාරිතා සංවර්ධන 340 | ධාරිතා සංවර්ධන 247 | 26031 | 15315 |
| 1.5 | ළමා සභා රැස්වීම් පැවැත්වීම - ප්‍රාදේශීය | 8.180 | 4.040 | ළමා සභා රැස්වීම් 1023 | ළමා සභා රැස්වීම් 529 | 17955 | 12251 |
| 1.6 | ළමා අයිතිවාසිකම් පිළිබඳ මෙහෙයුම් කමිටු රැස්වීම් | 0.300 | 0.060 | මෙහෙයුම් කමිටු 2 | මෙහෙයුම් කමිටු 1 | 42 | 30 |
| 1.7 | ළමා අයිතිවාසිකම් පිළිබඳ පළාත් මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීම | 0.680 | 0.180 | මෙහෙයුම් කමිටු 27 | මෙහෙයුම් කමිටු 13 | 345 | 200 |
| 1.8 | ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රාදේශීය මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීම | 8.650 | 4.560 | මෙහෙයුම් කමිටු 1364 | මෙහෙයුම් කමිටු 614 | 25471 | 17590 |
| 1.9 | අවදානම් සහගත තත්වයේ පසුවන දරුවන් සිටින පවුල් සඳහා ආරක්ෂණ සැලසුම් තුළින් මූල්‍ය සහ මූල්‍ය නොවන සහනයන් සැලසීම | 6.190 | 1.720 | ආරක්ෂණ සැලසුම් 121 | ආරක්ෂණ සැලසුම් 38 | 1538 | 1246 |
| 1.10 | ආන්තික ප්‍රජාව තුල සිටින දරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට වැඩසටහන් පැවැත්වීම | 2.000 | 0.860 | වැඩසටහන් 40 | වැඩසටහන් 18 | - | -- |
| 1.11 | ළමා මූලික පර්යේෂණ | 0.560 | - | පර්යේෂණ 12 | - | - | - |
| 1.12 | පළාත් පරිවාස දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය | 0.300 | 0.050 | සාකච්ඡා 4 | සාකච්ඡා 2 | 46 | 10 |
| 1.13 | ලෝක ළමාදින වැඩසටහන් පැවැත්වීම | 4.890 | - | වැඩසටහන් 367 | | | |
| 1.14 | මුද්‍රණ කටයුතු ප්‍රකාශන හා බෙදාහැරීම | 0.150 | - | 1 | - | - | - |
| මුළු එකතුව | | **42.000** | **16.420** | | | **74,509** | **48,319** |

| අනු අංකය | ව්‍යාපෘතිය / කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන්/ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | ස්ත්‍රී | පුරුෂ |
| **2.** | වැය විෂය - **217-02-02-06-2202** | | | | | | |
| 2.1 | කැපකරු දෙගුරු ශිෂ්‍යාධාර වැඩසටහන | 23.090 | 4.530 | 1965 ළමුන් | ළමුන් 1254 | ළමුන් 735 | 506 |
| 2.2 | කඩින්කඩ පාසල් යන හා පාසල් හැරයාමේ අවදානමක් සහිත දරුවන් සඳහා අධ්‍යාපනික ආධාර ලබා දීම | 1.600 | 0.330 | 320 ළමුන් | ළමුන් 56 | ළමුන් 34 | 22 |
| 2.3 | නිවුන් දරු ආධාර | 4.500 | 0.090 | 580 ළමුන් | ළමුන් 13 | ළමුන් 15 | 11 |
| 2.4 | වෛද්‍ය හා පෝෂණ ආධාර ලබා දීම | 2.050 | 0.540 | 410 ළමුන් | ළමුන් 109 | ළමුන් 53 | 56 |
| 2.5 | පීඩාවට පත් ළමුන් සඳහා හදිසි ආධාර ආධාර ලබා දීම | 1.000 | 0.350 | 100 ළමුන් | ළමුන් 35 | ළමුන් 15 | 20 |
| 2.6 | ගංවතුරින් අසරණ වූ දරුවන් සඳහා ආධාර ලබාදීම | 0.360 | 0.250 | 15 ළමුන් | ළමුන් 15 | ළමුන් 8 | 7 |
| මුළු එකතුව | | **32.600** | **6.080** | | | **860** | **622** |

## 10.5 ජාතික ළමා ආරක්ෂක අධිකාරිය


**දැක්ම**

ළමුන් සඳහා ළමා හිතකාමී සහ සුරක්ෂිත පරිසරයක් ගොඩනැගීම

**මෙහෙවර**

ළමුන් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් නිදහස් බව තහවුරු කිරීම

**2025 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සංවිධාන ව්‍යුහය**




**හැඳින්වීම**

ළමා අපයෝජන වැළැක්වීම සහ එවැනි අපයෝජනවලට ගොදුරුවූ ළමයින් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම පිණිස ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේ කාර්ය සඳහා සහ සියලු ආකාරයේ වූ ළමා අපයෝජනවලට එරෙහි වූ ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය හා නියාමනය කිරීම සඳහා 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත මඟින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවන ලදී.

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2025 ජාතික සංවර්ධන ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී මුදල් අමාත්‍යාංශයේ අයවැය දෙපාර්තමේන්තුවේ ඉල්ලීම මත ප්‍රාග්ධන වියදම් සහ පුනරාවර්තන වියදම් ලෙස වර්ගීකරණයට ලක් කරන ලදී.

## 1.0 ප්‍රධාන කාර්යභාරය

ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනත ප්‍රකාරව පුළුල් කාර්යභාරයක් පැවරී ඇති ආයතනයකි.

ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නෛතික, පරිපාලන හෝ වෙනත් ප්‍රතිසංස්කරණ සංවර්ධනය කිරීම, මහජනතාවගෙන් ළමා අපයෝජනය සම්බන්ධ පැමිණිලි භාර ගැනීම, ළමුන් සම්බන්ධ ළමා අපයෝජන නඩු ක්‍රියාවලිය නියාමනය, නීතිය සමඟ ගැටෙන හා සම්බන්ධ වන ළමයින් සඳහා ආධාර, නියාමනය සහ පසු විපරම් සිදුකිරීම හා ළමා ආරක්ෂක සේවා සහ පහසුකම් සැපයීම සඳහා අවම ප්‍රමිතීන් සංවර්ධනය කිරීම සහ අධීක්ෂණය කිරීම ඊට ඇතුළත් වේ. එමෙන්ම ළමයාගේ උපරිම යහපත සඳහා ළමා අපයෝජන වැළැක්වීමේ හා අපයෝජනයට ගොදුරු වූ ළමයාට ප්‍රතිචාර දැක්වීමේ අරමුණු ඇතිව ජාතික වැඩසටහන් සංවර්ධනය සහ පැවැත්වීම. සියලු ආකාරයේ අපයෝජනවලින් ළමයාගේ ආරක්ෂාව තහවුරු කිරීමට ළමා අපයෝජන වැළැක්වීමේ ක්‍රමවේදයන් හා ළමා ආරක්ෂණ දැනුම ප්‍රචලිත කිරීම සඳහා ළමුන්, යෞවනයන්, වෘත්තිකයන් සහ ප්‍රජාව දැනුවත් කිරීම, තොරතුරු සහ අධ්‍යාපනය ලබාදීම හා ළමා ආරක්ෂණය හා ළමා සංවර්ධනය පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ රැස්වීම්, වැඩමුළු, සාකච්ඡා, සහ සංසද ආදිය පැවැත්වීම ද ප්‍රධාන කාර්යයන් අතර වේ.

අධිකාරියේ කාර්යභාරය සිදුකිරීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් නිලධාරීන් අනුයුක්ත කර ඇත. ඔවුන් අධිකාරිය මඟින් යොමු කරන කාර්යයන් හා ඍජුව තමන් වෙත වාර්තා වෙන්නා වූ කාර්යයන් සම්බන්ධයෙන් කටයුතු කරයි.

## 2.0 ක්‍රියාත්මක කළ ප්‍රධාන සංවර්ධන වැඩසටහන්

### 2.1 ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධ උද්දේශනය සහ දිස්ත්‍රික්, කොට්ඨාස මට්ටමින් රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම.

දිස්ත්‍රික් මට්ටමින් කටයුතු කරන ළමා ආරක්ෂණය සම්බන්ධ වෘත්තිකයන් සඳහා ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධව දැනුවත් කිරීම මඟින් ළමුන්ගේ ආරක්ෂාවට ප්‍රමුඛත්වය ලබාදීම මෙහි අරමුණු වේ.

### 2.2 ළමා ආරක්ෂාව සම්බන්ධ ග්‍රාමීය මට්ටමින් ළමුන්ගේ සුරක්ෂිතතාවය වර්ධනය කිරීම උදෙසා ප්‍රජා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ දීපව්‍යාප්ත වැඩසටහන

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ළමා සුරක්ෂිතතාවය වර්ධනය කිරීමට අදාළව ප්‍රජාව බලගැන්වීම, ඒ තුළින් ළමුන්ට වඩාත් සුදුසු පරිසරයක් ඔවුන් විසින් නිර්මාණය කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කිරීම

තුළින් ළමා ආරක්ෂණය උදෙසා සක්‍රීය ප්‍රජා ජාලයක් නිර්මාණය කිරීම. (Child Protection Advocacy Network) මෙහි අරමුණු වේ.

**2.3 පාසල් ළමා ආරක්ෂක කමිටු හෙවත් ‘‘සුරැකුම් පවුර’’ පිහිටුවීම සහ පාසල් ළමා ආරක්ෂක කමිටු සක්‍රීය කිරීම**

අනිවාර්ය අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම සහ එම ළමුන් ළමා අපයෝජනයන්ගෙන් වැළැක්වීමට අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා පාසල්වල පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීම, ළමුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් අධ්‍යාපන බලධාරීන් වඩාත් සංවේදී කිරීම මඟින් පාසල්වල ක්‍රියාකාරී ළමා ආරක්ෂක කමිටු ඇති කිරීම සඳහා ඔවුන්ගේ උපරිම සහයෝගය ලබාගැනීම සහ පාසල් ළමා ආරක්ෂක කමිටු ප්‍රවර්ධනය සඳහා වර්ෂය පුරා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම උත්තේජනය කිරීම සඳහා සක්‍රීය කමිටු සහිත පාසල් තක්සේරු කිරීම තුළින් ළමුන්ට වඩාත් ප්‍රියමනාප පාසල් පද්ධති ඇති කිරීම, මෙහි මූලික අරමුණු වේ.

**2.4 ළමා ආරක්ෂාව පිළිබඳ පාසල් ශිෂ්‍ය නායකයින් සඳහා "ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන’’ හා විශ්ව විද්‍යාල සිසුන් සඳහා "විශ්ව විද්‍යාල තානාපති" ජාතික වැඩසටහන**

ජ්‍යෙෂ්ඨ පාසල් ශිෂ්‍ය නායකයින් හා විශ්ව විද්‍යාල සිසුන්ගේ ළමා ආරක්ෂාව පිළිබඳ දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය කිරීම මෙම වැඩසටහනේ මූලික අරමුණ වේ. පාසල් තුළ ළමා අපයෝජන අවම කිරීම සඳහා ශිෂ්‍ය නායකයින්ගේ සහභාගීත්වය ලබා ගැනීම සහ පාසල් ප්‍රජාව ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සිදු කෙරෙයි.

**2.5 ළමා රැකවරණ සේවා සපයන ආගමික හා පුණ්‍ය ආයතන අධීක්ෂණය සහ ළමා දිවා සුරැකුම් පහසුකම් සපයන මධ්‍යස්ථාන අධීක්ෂණය**

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 14 (ග) වගන්තියට අනුව ළමයින් සඳහා ළමා රැකවරණ සේවා සපයන සියලු ආගමික හා පුණ්‍ය ආයතන, ළමා සංවර්ධන මධ්‍යස්ථාන අධීක්ෂණය හා නියාමනය කිරීම සහ ශ්‍රී ලංකාවේ ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා ශ්‍රී ලංකාවේ ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා වන ජාතික මාර්ගෝපදේශයේ විධිවිධාන අනුව ශ්‍රී ලංකාවේ ළමා දිවා සුරැකුම් පහසුකම් සපයන මධ්‍යස්ථාන අධීක්ෂණයට අදාළ විධිවිධාන ක්‍රියාවට නැංවීම මෙම වැඩසටහන්වල මූලික අරමුණුවේ.

**2.6 ළමා ආරක්ෂාව පිළිබඳව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන් හා කාර්යය මණ්ඩල සාමාජිකයන් දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන**

ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් සවිඥානික හා සංවේදී ගුරු ප්‍රජාවක් හා කාර්යය මණ්ඩලයක් ගොඩනැංවීම තුළින් ළමා හිතකාමී පාසලක අධ්‍යාපනය ලබන සුරක්ෂිත හා සතුටින් සිටින ළමා පරපුරක් බිහි කිරීම මෙහි මූලික අරමුණු වේ.

**2.7 ළමා ආරක්ෂාව පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති හෙද පුහුණු විදුහල්වල හෙද නිලධාරීන් දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන**

ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් සංවේදී හෙද නිලධාරීන් පිරිසක් බිහි කිරීම තුළින් ළමුන් සම්බන්ධව සිදුකරන සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සියලු මැදිහත්කරණයන් ළමුන්ගේ උපරිම යහපත පිණිස සිදුකිරීම, මෙහි මූලික අරමුණු වේ.

**2.8 ළමා ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය හා සන්නිවේදන වැඩසටහන්**

ළමා අයිතීන් සහ ළමා ආරක්ෂාව පිළිබඳ පාසල් ප්‍රජාව, දෙමාපියන්, වෘත්තිකයන් වැඩිහිටියන් සහ පොදු ජනතාවගේ දැනුම කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීම සඳහා තොරතුරු සහ අධ්‍යාපනය ලබාදීම මෙහි මූලික අරමුණ වේ. 2025 සැප්තැම්බර් 30 වන විට ජනමාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් සහ ළමා ආරක්ෂාව සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් 04 ක් සිදු කරන ලදී.

**2.9 "සිතුවිලි සිත්තම්" සමස්ත ලංකා චිත්‍ර, පෝස්ටර් සහ කාටූන් තරඟාවලිය**

ළමා අපයෝජනවලින් ආරක්ෂා වීම සහ ළමා අයිතීන් පිළිබඳව ළමුන් තුළ දැනුවත්භාවය හා උනන්දුව ඇති කිරීම මෙහි මූලික අරමුණ වේ. 2025 සැප්තැම්බර් 30 වන විට අවසන් විනිශ්චය සිදුකර ඇත.

**2.10 විශේෂ විමර්ශන, විමර්ශන නියාමනය / අපරාධ නඩු කටයුතු සහ අධිකරණ කටයුතු නියාමනය කිරීම.**

ළමා අපයෝජන හේතු කොට වින්දිත වූ ළමුන් සඳහා නෛතික සහාය සැලසීම මෙහි ප්‍රධාන අරමුණ වේ. 2025 සැප්තුම්බර් 30 වන විට ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකය අධිකරණයේ පෙනී සිටීම් 1,252 ක් සම්පූර්ණ කර ඇත. එමෙන්ම නීති අංශය විසින් අධිකරණයේ පෙනී සිටීම් 8 ක් සිදුකර ඇති අතර, පුද්ගලයින් 762 කට නීතිමය සහාය ලබාදී ඇත.


**2.11 ළමා හිතකාමී වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකක පිහිටුවීම, නඩත්තු කිරීම සහ අයිතිවාසිකම් උල්ලංඝනය වූ ළමුන් සඳහා සහාය වීම සහ නිලධාරීන් පුහුණු කිරීම**

ළමා අපයෝජන හේතුවෙන් වින්දිතභාවයට පත්වන ළමුන් ද්විතීයික වින්දිතභාවයට පත්වීම වැළැක්වීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මේ වන විට වීඩියෝ සාක්ෂි පටිගත කිරීම් 159ක් අවසන් කර ඇති අතර, අධිකරණ නියෝග හා නීතිපතිවරයාගේ නියෝග මත සාක්ෂි සටහන් 185 ක් නිකුත් කර ඇත. එමෙන්ම මහාධිකරණ නඩුවාර 55 ක් සඳහා පෙනී සිට ඇත.

## 2.12 ළමා උපකාරක දුරකතන සේවයේ (1929) මෙහෙයුම් සහ නඩත්තු කටයුතු සිදු කිරීම.

ළමා අපයෝජන සම්බන්ධ මහජන පැමිණිලි භාර ගැනීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මේ මඟින් කායික, මානසික, ලිංගික අපයෝජන මෙන්ම නොසලකා හැරීම්වලට අදාළ මහජන පැමිණිලි භාරගැනීම ද පැය 24 පුරාම සිදුකරයි.

**ප්‍රස්ථාර -1**




**මූලාශ්‍රය : දිස්ත්‍රික් වශයෙන් පැමිණිලි ලැබීම් වාර්තාව 2025.09.30 දිනට - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය හා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

## 2.13 ජාතික ළමා කේන්ද්‍රීය මනෝ සමාජීය සහාය සේවාව

ළමුන්ගේ උපරිම යහපත වෙනුවෙන් ලබාදෙන සේවාවෙහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ අපයෝජනයට පත් ළමුන්ගේ මානසික තත්ත්වයන් හඳුනාගෙන මනෝ සමාජීය සහාය සේවාවන් වෙත යොමු කිරීම සහ මානසික යහපැවැත්ම ඉහළ නැංවීම මෙහි මූලික අරමුණු වේ. මේ වනවිට ළමුන් 191 ක් සඳහා මනෝ සමාජීය සහාය හා මැදිහත්වීම් ලබා දී ඇති අතර, ළමා අපයෝජන පැමිණිලි පසු විපරම් 208 ක් සිදුකර ඇත. එමෙන්ම ඊට අමතරව මනෝ සමාජයීය උපදේශන 167 ක් හා සිද්ධි සම්මන්ත්‍රණ 33 ක් පවත්වා ඇත.

**2.14 මනෝ සමාජීය මැදිහත්කරණ ලබාදීම් සම්බන්ධ පුහුණු වැඩසටහන් පැවැත්වීම.**

ළමුන් සඳහා සුරක්ෂිත ළමා හිතකාමී පරිසරයක් ගොඩනැගීම සහ ළමා ආරක්ෂක වෘත්තිකයන් සතු දැනුම යාවත්කාලීන කිරීම මෙන්ම පුහුණු වැඩසටහන් හරහා ලබාගත් දැනුම ප්‍රායෝගිකව වෘත්තිය තුළ භාවිතයට ගැනීම මෙහි මූලික අරමුණු වේ.

**2.15 වැවිලි ක්ෂේත්‍රය ආශ්‍රිතව වෙසෙන ළමුන්ගේ යහපැවැත්ම සහතික කිරීම උදෙසා ක්‍රියාත්මක කෙරෙන විශේෂ ප්‍රජා වැඩසටහන**

ළමා ආරක්ෂණය උදෙසා සක්‍රීයව ක්‍රියා කරන වැවිලි ප්‍රජා ජාලයක් නිර්මාණය කිරීම මෙහි මූලික අරමුණ වේ.

**2.16 වෙරළබඩ කලාපය ආශ්‍රිත ගම්මානවල ජීවත්වන ළමුන්ගේ ආරක්ෂාව හා යහපැවැත්ම නඟා සිටුවීම උදෙසා ක්‍රියාත්මක කෙරෙන ප්‍රජාපාදක වැඩසටහන.**

ළමා ආරක්ෂණය උදෙසා සක්‍රීය වෙරළබඩ කලාපය ආශ්‍රිත ප්‍රජා ජාලයක් නිර්මාණය කිරීම මෙහි මූලික අරමුණ වේ.

**2.17 පාසල් ළමුන් ප්‍රවාහනය කරන රියදුරන් හා සහායකයින් ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන.**

පාසල් ළමුන් ප්‍රවාහනය කරන රියදුරන් හා සහායකයින් ළමා ආරක්ෂාව හා යහපැවැත්ම තහවුරු කිරීම උදෙසා බලගැන්වීම මඟින් ප්‍රවාහන සේවයේ ළමා අපයෝජන වැළැක්වීම මෙහි අරමුණ වේ.

**2.18 නවාතැන් පහසුකම් සපයන ආයතන හිමිකරුවන් දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන.**
නවාතැන් පහසුකම් සපයන ආයතනවලදී ළමයින්ට සිදුවිය හැකි සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් ළමුන් ආරක්ෂා කිරීම සඳහා එම ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීම මෙහි මූලික අරමුණු වේ.

**2.19 ළමා ආරක්ෂාව පිළිබඳව පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ ඉගෙනුම ලබන වෛද්‍යවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන.**

පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයෙහි ඉගෙනුම ලබන වෛද්‍යවරුන් ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් සංවේදී පිරිසක් ලෙස පුහුණු කිරීම මඟින් ළමුන් සම්බන්ධ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මැදිහත්කරණයන් ළමුන්ගේ උපරිම යහපත වෙනුවෙන් සිදු කිරීම මෙහි මූලික අරමුණ වේ.

## 3.0 වැඩසටහන් කිහිපයක විශේෂ අවස්ථා





සිතුවිලි සිත්තම් - 2025 සමස්ථ ලංකා චිත්‍ර, පෝස්ටර් සහ කාටූන් තරඟාවලිය



ළමා දින ජාතික සතිය සමගාමී 1929 ස්ටිකර් ඇලවීමේ වැඩසටහන





ගැහැනු ළමයාගේ ජාත්‍යන්තර දිනයට සමගාමීව පැවති ජාතික වැඩසටහන - 2025



ළමා ආරක්ෂණයට අදාල පුහුණුව

## 4.0 ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්හි 2025.09.30 දිනට ප්‍රගතිය

| අනු අංකය | ව්‍යාපෘතිය / කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන්/ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | ස්ත්‍රී | පුරුෂ |
| **1.** | **171-02-08-13-1509 ජාතික ළමා ආරක්ෂක අධිකාරිය - ප්‍රාග්ධන** | | | | | | |
| 1.1 | ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය පිළිබඳ උද්දේශන වැඩසටහන. | 5.000 | 2.188 | වැඩසටහන් 50 | වැඩසටහන් 36 | 2184 | |
| 1.2 | ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අදාළව ජාතික මෙහෙයුම් කමිටුව සහ දිස්ත්‍රික් ළමා ආරක්ෂක කමිටු සකස් කිරීම සහ මෙහෙයවීම. | 1.500 | 0.020 | නියමු වැඩසටහන් 04 | - | | |
| 1.3 | ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අදාළව නීති පද්ධතිය ශක්තිමත් කිරීම. | 0.100 | 0.017 | කමිටු රැස්වීම් - 04 | කමිටු රැස්වීම් 01 පවත්වා ඇත. | | |
| 1.4 | පාර්ශ්වකරුවන් සඳහා පුහුණු, වැඩමුළු, සාකච්ඡා, සංසද හරහා නීති උපදේශනය සහ දැනුවත් කිරීම. | 1.500 | 1.914 | දැනුවත් කිරීමේ වැඩසටහන් 06ක් | වැඩසටහන් 07 | | |
| 1.5 | සංචාරක අංශය සහ අනෙකුත් අංශ තුළ ළමා ආරක්ෂාව පිළිබඳ ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සංවාදය | 0.100 | 0.009 | පාර්ශ්වකරුවන්ගේ රැස්වීම් - 02 | පාර්ශ්වකරුවන්ගේ රැස්වීම් - 03 | | |
| 1.6 | ළමා අපයෝජන පිළිබඳ ජාතික දත්ත පද්ධතිය (සංවර්ධනය හා නඩත්තුව) | 1.200 | 0.450 | මාසික වාර්තා 12 | මාසික වාර්තා 9 | | |
| 1.7 | ළමුන්ට එරෙහි සාහසිකත්වය වැළැක්වීමේ සහ ප්‍රතිචාර දැක්වීමේ දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ප්‍රජා පාදක වැඩසටහන් | 5.000 | 2.190 | රැස්වීම් 04<br>ප්‍රජා වැඩසටහන් 204<br>දිස්ත්‍රික් රැස්වීම් 10 | ප්‍රජා වැඩසටහන් 107 | 10682 | |
| 1.8 | පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීම. (SCPC) "සුරකුම් පච්ච" | 5.000 | 1.206 | දැනුවත් කිරීම 33<br>පාසල් 1000 ක් ඇගයීම<br>ප්‍රාදේශීය වැඩසටහන් 05 | දැනුවත් කිරීම් 21 | 1437 | |
| | **උප එකතුව** | **19.400** | **7.994** | | | **14,303** | |

| අනු අංකය | ව්‍යාපෘතිය / කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන්/ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | ස්ත්‍රී | පුරුෂ |
| 1.9 | පාසල් ශිෂ්‍ය නායකයින් සඳහා "ශිෂ්‍ය තානාපති" ජාතික වැඩසටහන (SANP) | 8.000 | 1.946 | ශිෂ්‍ය තානාපති නව පාසල් ලියාපදිංචි - 500<br>නිලධාරී පුහුණු 02<br>දැනුවත් කිරීම - 25<br>දිස්ත්‍රික් ශිෂ්‍ය තානාපති පුහුණු වැඩසටහන් - 25<br>ශිෂ්‍ය තානාපති දිස්ත්‍රික් සමුලු - 25<br>ශිෂ්‍ය තානාපති ජාතික සමුළුව - 01 | ශිෂ්‍ය තානාපති නව ලියාපදිංචි - 240<br><br>නිලධාරී පුහුණු - 01<br><br>දැනුවත් කිරීම් - 02 | දැනුවත් කිරීමේ ප්‍රතිලාභීන් 38 | |
| 1.10 | විශ්වවිද්‍යාල සිසුන් සඳහා "විශ්ව විද්‍යාල තානාපති" ජාතික වැඩසටහන (UANP) | 3.000 | 1.194 | විශ්ව විද්‍යාල සිසුන් 500<br>නිලධාරී පුහුණු 01<br>විශ්ව විද්‍යාල ශිෂ්‍ය තානාපති පුහුණු 08<br>ජාතික සමුළුව 01 | 971 සිසුන් ලියාපදිංචි කර ඇත.<br>නිලධාරී පුහුණු 01<br>විශ්ව විද්‍යාල ශිෂ්‍ය තානාපති පුහුණු 5 | 1066 | |
| 1.11 | ආපදා හෝ හදිසි අවස්ථා වලදී ළමා ආරක්ෂාව සහ ළමුන් සඳහා සහන වැඩසටහන්. | 1.250 | - | ළමුන් 250 | | | |
| 1.12 | ආන්තික, අවදානම්, අනාරක්ෂිත, අඩාශාමාන සහ ළමා අපයෝජනයට ගොදුරු වූ ළමයින් සඳහා අධ්‍යාපනික ආධාර හෝ අදාළ සහාය ලබාදීම. | 5.000 | 1.080 | ළමුන් 833 | ළමුන් 141 | ළමුන් 141 | |
| 1.13 | ළමා සංවර්ධන මධ්‍යස්ථාන සහ දිවාසුරැකුම් මධ්‍යස්ථාන නියාමනය. | 1.000 | 0.289 | දිවා සුරැකුම් මධ්‍යස්ථාන 250<br>ළමා සංවර්ධන මධ්‍යස්ථාන 340 | දිවා සුරැකුම් මධ්‍යසථාන නියාමන 178 | | |
| 1.14 | ළමා අපචාර පිළිබඳ අපරාධ නඩු කටයුතු නියාමනය | 0.300 | 0.002 | නඩු 100<br>ස්ථාවර නියෝග පිළිබඳ උපදේශන රැස්වීම් 02 | නඩු - 633 | | |
| 1.15 | ළමුන්ට එරෙහි සහාසිකත්වය පිළිබඳ උද්දේශනය, දැනුවත් කිරීම සහ පුහුණු වැඩසටහන්. | 5.000 | 1.093 | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ වැඩසටහන් 11<br>සෞඛ්‍ය අංශ වැඩසටහන් 06<br>ප්‍රජා දිස්ත්‍රික් වැඩසටහන් 10<br>සංචාරක වැඩසටහන් 14<br>දිවා සුරැකුම් වැඩසටහන් 25 | අධ්‍යාපන පීඨ 07<br>සෞඛ්‍ය අංශ වැඩසටහන් 02 | 617 | |
| | **උප එකතුව** | **23.550** | **4.524** | | | **1,721** | |

| අනු අංකය | ව්‍යාපෘතිය / කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන්/ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | ස්ත්‍රී | පුරුෂ |
| 1.16 | ළමා ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය හා සන්නිවේදන වැඩසටහන් | 8.000 | 0.657 | මාධ්‍යවේදී පුහුණුව 02<br>IEC ද්‍රව්‍ය සංවර්ධනය කිරීම<br>ළමා ආරක්ෂාව දැනුවත්කිරීම 2<br>දින සැමරුම් 03<br>ප්‍රදර්ශන සහ ජංගම සේවා - 2 (ඉල්ලීම මත)<br>මාධ්‍ය ව්‍යාපාරය 1<br>ජාතික ළමා ආරක්ෂක අධිකාරි නිල වෙබ්, මුහුණු පොත, YouTube සහ ගිණුම් නඩත්තු කිරීම | මාධ්‍යවේදී පුහුණු - 01<br>ළමා ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීම් - 04<br>ප්‍රදර්ශන හා ජංගම සේවා - 06<br>ජාතික ළමා ආරක්ෂක අධිකාරි නිල වෙබ්, මුහුණු පොත, YouTube සහ ගිණුම් නඩත්තු කිරීම | | |
| 1.17 | ළමා අපයෝජන හා අධිකරණ කටයුතුවලට අදාළ විශේෂ විමර්ශන / විමර්ශන නියාමනය / අපරාධ නඩු කටයුතු පිළිබඳ ආවේක්ෂණය / සයිබර් ආවේක්ෂණය. | 5.250 | 3.060 | පරීක්ෂණ 10000 ක් ආරම්භ කිරීම<br>වසා ඇති නඩු ගණන (සියලු වසර) 3000<br>අධිකරණයේ පෙනී සිටීම් 2000 | පරීක්ෂණ ආරම්භ කිරීම් - 6881<br>වසා ඇති නඩු - 7571<br>අධිකරණ පෙනී සිටීම් - 1260 | | |
| 1.18 | දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ විමර්ශන. | 1.500 | 0.343 | පැමිණිලි සිද්ධි ගණන 150 | පැමිණිලි - 413 | | |
| 1.19 | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සඳහා පැමිණිලි හැසිරවීමේ මාර්ගෝපදේශ සහ අදාළ ආකෘති පත්‍ර මුද්‍රණය කිරීම. | 2.000 | 0.258 | වාර්තා හා රිසිට් පොත් - 26<br>විමර්ශන නිලධාරී සටහන් පොත් - 350, කරුණු වාර්තා පෝරම - 100 | වාර්තා හා රිසිට් පොත් - 08<br>විමර්ෂණ නිලධාරී සටහන් පොත් - 350 | | |
| 1.20 | ළමා අපයෝජනවලට අදාළ සයිබර් නිරීක්ෂණය සහ සයිබර් නිරීක්ෂණ ඒකකයේ ක්‍රියාකාරිත්වය | 1.000 | 0.049 | ආරම්භ කළ විමර්ශන - 60<br>සයිබර් දැනුවත් කිරීමේ වැඩසටහන 10 | පැමිණිලි 146 | | |
| 1.21 | ළමා හිතකාමී වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකක පුහුණු කිරීම/ නඩත්තු කිරීම. | 4.000 | 0.262 | වීඩියෝ සාක්ෂි පටිගත කිරීම් 300<br>නිකුත් කරන ලද වීඩියෝ පටිගත කිරීම් (සියළු වසර) 200<br>උසාවියේ පෙනීසිටීම් 100 (සියලු වසර)<br>පුහුණු - 04 | වීඩියෝ සාක්ෂි පටිගත කිරීම් - 159<br>නිකුත් කළ වීඩියෝ පටිගත කිරීම් - 185<br>උසාවි පෙනී සිටීම් - 55 | | |
| 1.22 | 1929 ළමා උපකාරක සේවය මෙහෙයුම් සහ නඩත්තු කිරීම. | 3.000 | 0.846 | 36000 පිළිතුරු දුන් ඇමතුම් ගණන<br>ලැබී ඇති පැමිණිලි ගණන 8000<br>1929 නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් | ඇමතුම් - 21879<br>පැමිණිළි - 6154 | | |
| 1.23 | ජාතික ළමා කේන්ද්‍රීය මනෝ සමාජීය උපකාර සේවාව. | 1.940 | 0.000 | ළමුන් - 80 | ළමුන් 191 | 191 | |
| | **උප එකතුව** | **26.690** | **5.475** | | | **191** | |

| අනු අංකය | ව්‍යාපෘතිය / කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන්/ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | ස්ත්‍රී | පුරුෂ |
| 1.24 | ළමා අපයෝජනය පිළිබඳ ප්‍රතිසාධන විෂය මාලාව සකස් කිරීම. | 0.500 | - | | | | |
| 1.25 | මනෝ සමාජීය මැදිහත්වීම් පිළිබඳ පුහුණු (විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා මැදිහත්වීම, නාට්‍ය චිකිත්සාව සහ අනෙකුත් ආශ්‍රිත පුහුණු ආදිය) | 0.800 | 0.404 | වැඩමුළු - 04 | වැඩමුළු - 02 | ළමුන් 137 | |
| 1.26 | ළමා ආරක්ෂාව පිළිබඳ අවශ්‍යතා ඇති ප්‍රජාවන් සහ ළමා කණ්ඩායම් සඳහා විශේෂ ප්‍රජා වැඩසටහන් | 5.000 | 0.779 | වෙරළබඩ වැඩසටහන් හා විශේෂ ව්‍යාපෘති - 28<br>වෙරළබඩ ක්ෂේත්‍ර නිරීක්ෂණ සහ පුහුණුව 04<br>වැව්ලි වැඩසටහන් විශේෂ ව්‍යාපෘති - 12<br>සහතික 5000ක් සහ ස්ටිකර් 5000ක් මුද්‍රණය කිරීම<br>ප්‍රජා දිස්ත්‍රික් වැඩසටහන් 14<br>වතු ක්ෂේත්‍ර නිරීක්ෂණ 02<br>පාසල් වෑන් රථ දැනුවත් කිරීමේ වැඩසටහන් 12<br>පශ්චාත් උපාධි වෛද්‍ය ආයතන පාදක දැනුවත් කිරීම් වැඩසටහන් 02 | වෙරළබඩ වැඩසටහන් - 10<br>වෙරළබඩ ක්ෂේත්‍ර නිරීක්ෂණ- 1<br>වැව්ලි වැඩටහන් - 8<br><br>පාසල් වෑන් රථ දැනුවත් කිරීමේ - 16<br>පශ්චාත් උපාධි වෛද්‍ය ආයතන පාදක දැනුවත් කිරීම් - 1 | 1130 | |
| 1.27 | ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පුස්තකාලය සංවර්ධනය හා නඩත්තුව. | 0.500 | 0.249 | පුස්තකාල පොත් මිලදී ගැනීම<br>පුස්තකාල කබඩ් මිලදී ගැනීම<br>NCPA පුස්තකාලය නඩත්තු කිරීම | පොත් 219 ක් මිලදී ගැනීම | | |
| 1.28 | කැපකරු සත්කාර වැඩසටහන යටතේ සුනාමියෙන් විපතට පත් වූ ළමුන්ට උපකාර කිරීම සහ අධීක්ෂණය කිරීම | 0.260 | 0.104 | ළමුන් 02 අධ්‍යාපන ආධාර | ළමුන් 02 | 02 | |
| 1.29 | මාසික, කාර්තුමය හා වාර්ෂික ප්‍රගති සමාලෝචන රැස්වීම්, වාර්ෂික වාර්තා, ක්ෂේත්‍ර අධීක්ෂණය, රාජකාරි වාර්තා පොත් මුද්‍රණය සහ වාර්තා කිරීම පිළිබඳ දත්ත පද්ධතිය සංවර්ධනය හා නඩත්තු කිරීම. | 2.500 | 1.560 | දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන - 100.<br>පළාත් ප්‍රගති සමාලෝචන - 04<br>අහඹු ක්ෂේත්‍ර නිරීක්ෂණ - 03<br>රාජකාරි වාර්තා පොත් මුද්‍රණය කිරීම | දිස්ත්‍රික් ප්‍රගති සාකච්ඡා - 99<br>පළාත් ප්‍රගති සාකච්ඡා - 4 | | |
| 1.30 | පාර්ශ්වකරුවන්ගේ රැස්වීම් සහ වැඩමුළු | 0.500 | 0.160 | පාර්ශ්වකරුවන්ගේ රැස්වීම් සහ වැඩමුළු (ඉල්ලීම මත) | රැස්වීම් 01 | | |
| **උප එකතුව** | | **10.600** | **3.256** | | | | |
| **මුළු එකතුව** | | **79.700** | **21.249** | | | | |

| අනු අංකය | ව්‍යාපෘතිය / කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන්/ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | ස්ත්‍රී | පුරුෂ |
| **2. 171-02-08-13-2201 ජාතික ළමා ආරක්ෂක අධිකාරිය - සංවර්ධන** | | | | | | | |
| 2.1 | ළමා අපයෝජන පිළිබඳ ජාතික දත්ත පද්ධතිය (සංවර්ධනය හා නඩත්තුව) | 0.800 | | | | | |
| 2.2 | ළමා හිතකාමී වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකක සකස් කිරීම | 36.000 | 0.775 | නව VER ඒකක පිහිටුවීම - 02 | ඒකකය අළුත් වැඩියා කිරීම සහ උපකරණ මිලදී ගැනීම | | |
| 2.3 | ළමා ආරක්ෂාව පිළිබඳ නව අධ්‍යයන සහ පර්යේෂණ | 5.000 | 0.013 | 1) ක්ෂේත්‍ර කටයුතු - 10<br>2) පර්යේෂණ - 01 | ක්‍රියාත්මක වෙමින් පවතී | | |
| 2.4 | ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් සඳහා ළමා ආරක්ෂාවට අදාළ තාක්ෂණික විෂයයන් පිළිබඳ අඛණ්ඩ වෘත්තීයමය ධාරිතා සංවර්ධන වැඩසටහන (CPD) | 3.500 | 1.261 | අධිකාරියේ නිලධාරීන් සඳහා ළමා ආරක්ෂාවට අදාළ තාක්ෂණික විෂයයන් පිළිබඳ අඛණ්ඩ වෘත්තිය සංවර්ධන වැඩසටහන (CPD) | මනෝසමාජීය සහ ගිණුම්කරණ පුහුණු වැඩසටහන් 2<br><br>ළමා ආරක්ෂණ වැඩමුළුව සඳහා නාට්‍ය චිකිත්සාව | ප්‍රතිලාභීන් 113 | |
| 2.5 | ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම. | 4.000 | 0.170 | ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | මාර්ගගත පද්ධති නඩත්තු කිරීම | | |
| 2.6 | ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම (ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය නිලධාරීන්) | 25.000 | 0.503 | ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය නිලධාරීන් | විදුලි හා පරිගණක උපකරණ | | |
| | මුළු එකතුව | **74.300** | **2.722** | | | **113** | |

# 10.6 ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය

## හැඳින්වීම

ශ්‍රී ලාංකික සමාජය සඳහා විචක්ෂණශීලී, සංවේදී සහ විශ්වාසවන්ත කාන්තා පරපුරක් නිර්මාණය කරන ජාතික ආයතනය බවට පත්වීම දැක්ම කර ගනිමින්, ආත්ම විශ්වාසයෙන් යුතුව අභියෝගවලට මුහුණ දෙන කාන්තා පරපුරකට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා විධිමත් සංවිධාන රාමුවක් හරහා මනාව සැලසුම් සහගතව දැනුවත් කිරීම මඟින් සක්‍රීය කරන ලද සමාජ හා ආර්ථික සවිබල ගැන්වීම තුළින් රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව ඔවුන්ගේ ප්‍රඥාව සහ ශක්තිය උපරිමයෙන් ප්‍රයෝජනයට ගැනීමෙන් කාන්තා යහපැවැත්ම සඳහා ක්‍රියාත්මක වන ජාතික යාන්ත්‍රණය බවට පත්වීම තම මෙහෙවර කරගත් ප්‍රමුඛතම ආයතනයකි.

කාන්තාවන් ආර්ථික හා සමාජයීය වශයෙන් සවිබල ගැන්වීම සඳහා ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාවට නංවන ජාතික යාන්ත්‍රණයයි. ශක්තිමත් සංවිධාන ජාලයක් ඇති කරමින් කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් ඔවුන්ගේ අවශ්‍යතා සාමූහික ක්‍රියාවලියක් හරහා ඉටු කිරීමට ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය කටයුතු කරනු ලබයි.

## 1.0 වගකීම හා කාර්යභාරය

**කාන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබලගැන්වීම ප්‍රධානතම වගකීම වන අතර, ඒවා ඉලක්ක කර ගනිමින් පහත අංශයන් ඔස්සේ වැඩසටහන් ක්‍රියාත්මකයි.**

- කාන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් බල ගැන්වීම සඳහා සුදුසු වැඩසටහන් හා ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පසු විපරම.
- සියලු ම වයස් පරාසවල කාන්තාවන්ගේ සුවිශේෂිතා හඳුනාගෙන ඔවුන් උචිත පරිදි රටේ සමස්ත සංවර්ධනයේ කොටස්කරුවන් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කාන්තාවන් වීම නිසාම ඔවුන් මුහුණ දෙන සමාජීය දුෂ්කරතා මඟ හැරවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- එම වගකීම් ඉටු කිරීම සඳහා කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම හා සමාජීය වශයෙන් රැකවරණය සැලසීම.
- ජාතික මට්ටමේ සිට බිම් මට්ටම දක්වා කාන්තාවන්ගේ සමාජ හා ආර්ථික සංවර්ධනය සඳහා සාමූහික ප්‍රවේශයක් තුළ අයිතිවාසිකම් සහ අවස්ථාවන් සාක්ෂාත් කර ගැනීම සඳහා ශක්තිමත් කාන්තා සංවිධාන ජාලයක් පිහිටුවීම.
- කාන්තාවන්ගේ නායකත්ව කුසලතා සංවර්ධනය මඟින් දේශපාලනය සඳහා ප්‍රවේශ කරවීම.
- කාන්තාවන් ඉලක්ක කර ගත් විවිධ (චක්‍රීය ණය, වැන්දඹු කාන්තා ණය) වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 2.0 ක්‍රියාත්මක කළ ප්‍රධාන සංවර්ධන වැඩසටහන්

### 2.1 කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීමේ සංවර්ධන වැඩසටහන

කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම සඳහා හඳුනා ගත් අංශයන් නියෝජනය වන පරිදි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ සඳහා, ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වැඩසටහන මෙන් ම විවිධ ජාත්‍යන්තර සංවර්ධන හවුල්කරුවන් විසින් ක්‍රියාත්මක වැඩසටහන් ද ඉටු කරනු ලබයි.

## 2.1.1 ව්‍යවසායකත්ව සංවර්ධනය

දැනුම හා කුසලතාව මත ව්‍යවසායකත්ව ව්‍යාපෘති සඳහා යොමු වන කාන්තාවන් ඇතුළුව, නාගරික අඩු ආදායම්ලාභී කාන්තාවන්, ධීවර කර්මාන්තය ආශ්‍රිත කාන්තාවන්, වතු ආශ්‍රිත කාන්තාවන්, විදේශගත වීමට අපේක්ෂිත කාන්තාවන්, සුවිශේෂී හේතූන් මත සමාජ සංවේදීතාවය අහිමි වූ කාන්තාවන්, දිගු කාලයක් බන්ධනාගාරගත වූවන්ගේ පවුල්වල ආපදාවට ලක්වූ කාන්තාවන්, නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමවලින් පීඩාවට පත් ග්‍රාමීය කාන්තාවන් හා ස්ත්‍රී මූලික පවුල්වල කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම සිදුවේ.

2025 වර්ෂය තුළ ක්‍රියාත්මක වැඩසටහන යටතේ ව්‍යාපෘති 666 ක් ක්‍රියාත්මක කර ඇති අතර, ඒ සඳහා වෙන් කරන ලද මුදල රු.මි. 59.50 කි. එයින් ව්‍යාපෘති 488 ක් තනි පුද්ගල ව්‍යාපෘති වන අතර ව්‍යාපෘති 190 ක් කණ්ඩායම් ව්‍යාපෘති ලෙස ක්‍රියාත්මකයි. ඒ අනුව, කාන්තාවන් 5,302 ක් මෙම වැඩසටහන් යටතේ ප්‍රතිලාභ ලබා ඇත.

**වගුව 10: ව්‍යවසායකත්ව සංවර්ධන ප්‍රතිලාභ සාරාංශය**

| අනු අංකය | වැඩසටහන | ප්‍රතිපාදන (රු.මි.) | ක්‍රියාත්මක ව්‍යාපෘති ගණන | ප්‍රතිලාභීන කාන්තාවන් ගණන |
|---|---|---|---|---|
| 1 | අඩු ආදායම්ලාභී නාගරික කාන්තාවන් සවිබලගැන්වීමේ වැඩසටහන | 4.000 | 40 | 40 |
| 2 | වැන්දඹු හා ගෘහ මූලික කාන්තා ආධාර වැඩසටහන | 5.000 | 50 | 50 |
| 3 | කාන්තාවන් ආර්ථික හා සමාජයීය වශයෙන් සවිබලගැන්වීම - “දිරිය මංපෙත” වැඩසටහන | 12.000 | 160 | 160 |
| 4 | විදේශගතවීමට අපේක්ෂිත කාන්තාවන් සඳහා විකල්ප ආදායම් උත්පාදනය | 4.000 | 40 | 40 |
| 5 | ධීවර ආශ්‍රිත ගෘහ කර්මාන්තය සඳහා යොමු වීමට සුදුසු කාන්තාවන් සවිබල ගැන්වීම | 4.126 | 40 | 40 |
| 6 | සවිමත් කතක්-සුවබර පවුලක් වැඩසටහන | 2.500 | 5 | 25 |
| 7 | වතු අංශයේ කාන්තාවන් ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය “දිවියට අරුතක්” | 5.000 | 50 | 50 |
| 8 | නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රමවලින් පීඩාවට පත් ග්‍රාමීය කාන්තාවන්ට සහන සැලසීම | 4.000 | 40 | 40 |
| 9 | වනිතා නවෝදය කාන්තා කාර්ය සංවිධාන සක්‍රිය කිරීම | 1.000 | 60 | 1500 |
| 10 | ළමා නිවාසවල සිට ඉවත්වන අවු. 18 ඉක්ම වූ ගැහැනු ළමුන් සමාජගත කිරීම සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටමේ හෙද පුහුණුව ලබාදීම හා අවශ්‍ය මූලික පුහුණුව ලබාදීම | 1.500 | 3 | 30 |
| **එකතුව** | | **43.126** | **488** | **1975** |

## 2.2 ව්‍යවසායක කාන්තාවන් සඳහා වෙළඳපොළ ප්‍රවර්ධනය

ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් සවිබලගැන්වෙන කාන්තාවන් සඳහා ප්‍රමුඛ අවශ්‍යතාව වන්නේ වෙළඳ පොළ අවස්ථා සුලබ කිරීමයි. ඒ සඳහා ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන මත ප්‍රධාන වැඩසටහන් කීපයක් ක්‍රියාත්මක කරනු ලබයි. එමඟින් ව්‍යවසායිකාවන් ලෙස සාර්ථකත්වයට පත් වූ කාන්තාවන් ප්‍රාදේශීය, දිස්ත්‍රික් සහ ජාතික මට්ටමින් ඇගයීම ප්‍රධාන වැඩසටහනකි.

එමෙන් ම මෙම ව්‍යවසායිකාවන් වෙත දේශීය සහ විදේශීය වෙළඳ පොළ වෙත ප්‍රවේශ වීමේ පහසුකම් සලසා දීම සඳහා කාන්තා නිෂ්පාදන ප්‍රදර්ශනය හා අලෙවිපොළ අවස්ථා ඇති කරනු ලබයි. ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරන ලද “ලිය ශක්ති” කාන්තා නිෂ්පාදන ප්‍රදර්ශනය සහ අලෙවි පොළ ප්‍රධාන වේ. අමතර වශයෙන් සියලු දිස්ත්‍රික් ආවරණය වන පරිදි වෙළඳ පොළ පැවැත් වීම සඳහා කටයුතු කර ඇත.

ව්‍යවසායිකාවන් කණ්ඩායමක් ලෙස සංවිධානගතව අලෙවි පොළ පැවැත්වීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අලෙවි කුටි **(Canopy Huts)** ලබා දීමත් මෙම වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වේ.

අවිධිමත් ලෙස වෙළඳාමේ යෙදෙන කාන්තාවන් සඳහා “ජංගම අලෙවි කුටි” ලබා දීම තවත් එක් වෙළඳ පොළ අවස්ථා ප්‍රවර්ධනය කරන ලද ව්‍යාපෘතියක් වේ.

**වගුව 11: ව්‍යවසායක කාන්තාවන් සඳහා වෙළඳපොළ ප්‍රවර්ධනය**

| අනු අංකය | වැඩසටහන | ප්‍රතිපාදන (රු.මි.) | ක්‍රියාත්මක ව්‍යාපෘති ගණන | ප්‍රතිලාභී කාන්තාවන් ගණන |
|---|---|---|---|---|
| 1 | “ලිය ශක්ති” ජාතික කාන්තා නිෂ්පාදන ප්‍රදර්ශනය හා අලෙවි පොළ | 0.271 (ආයතනවලින් ලද අනුග්‍රහය මත ක්‍රියාත්මක කර ඇත.) | 02 | 200 |
| 2 | දිස්ත්‍රික් කාන්තා නිෂ්පාදන ප්‍රදර්ශනය හා අලෙවිපොළ | 0.200 | (දිස්ත්‍රික්වලින් ලැබෙන ව්‍යාපෘති අනුව ප්‍රතිපාදන වෙන් කරයි) | 170 |
| 3 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා කැනොපි කුඩ හා මේස ලබා දීම | 0.358 | 04 | 200 |
| 4 | කැනොපි කුඩ (Canopy Hut) ලබා දීම | 1.225 | 09 | 450 |
| 5 | අවිධිමත් ලෙස වෙළඳාමේ යෙදෙන කාන්තාවන් සඳහා “ජංගම අලෙවි රථ” ලබා දීම | 1.900 | 16 | 16 |
| **එකතුව** | | **3.954** | **31** | **1,036** |

ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව පැවති “ලිය ශක්ති” ජාතික කාන්තා නිෂ්පාදන ප්‍රදර්ශනය හා අලෙවි පොළ සඳහා විශේෂ අනුග්‍රහයක් ජපන් අන්තර්ජාතික සහයෝගීතා ආයතනය (JICA) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) විසින් ලබා දීම සිදු කරන ලදී.

## 2.3 ව්‍යවසායක කාන්තාවන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම

අඩු ආදායම්ලාභී සහ සමාජීය සහ ආර්ථික වශයෙන් බලපෑමට ලක් වූ කාන්තාවන් ව්‍යවසායකාවන් ලෙස සවිබලකරණයේ දී ව්‍යවසායකත්වය සම්බන්ධ දැනුම සහ කුසලතාවන් සංවර්ධනය සහ විශේෂයෙන් මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳ ව දැනුවත්භාවය ලබා දීම අවශ්‍යතාවයක් ලෙස හඳුනාගෙන ඇත.

ඒ අනුව වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම යටතේ "ආදායම් උත්පාදන මාර්ග සඳහා පෙළඹවීමේ පුහුණු වැඩසටහන" සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලබයි. ඒ යටතේ රු.මි. 1.20 ක් වෙන් කර ඇත. එක් වැඩසටහනක් සඳහා රු. 25,000/- ක ප්‍රතිපාදන වෙන් කෙරෙන අතර අවම වශයෙන් ප්‍රතිලාභීන් 40 ක කණ්ඩායමක් සඳහා ව්‍යවසායකත්වය පිළිබඳ දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය සිදු කරයි.

ඒ සඳහා තාක්ෂණික දායකත්වය කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය, කාර්මික සංවර්ධන මණ්ඩලය, විදාතා සම්පත් මධ්‍යස්ථානය, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය වැනි ආයතන මඟින් ලබා දේ.

2025 වර්ෂය සඳහා දිස්ත්‍රික් මට්ටමින් වැඩසටහන් 49 ක් පැවැත්වීම සඳහා ප්‍රතිලාභීන් 1,960 ක් දැනුවත් කිරීම ඉලක්ක කරයි.

**වගුව 12- දිස්ත්‍රික් මට්ටමින් ව්‍යවසායකත්ව පුහුණු අවශ්‍යතා බෙදී යාම**

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණන | ප්‍රතිපාදන (රු.මි.) | ඉලක්කගත ප්‍රතිලාභී කාන්තාවන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | කොළඹ | 02 | 0.050 | 80 |
| 2 | කළුතර | 05 | 0.175 | 280 |
| 3 | මහනුවර | 04 | 0.100 | 160 |
| 4 | මාතලේ | 02 | 0.050 | 80 |
| 5 | නුවරඑළිය | 01 | 0.025 | 40 |
| 6 | ගාල්ල | 01 | 0.025 | 40 |
| 7 | මාතර | 02 | 0.050 | 80 |
| 8 | අනුරාධපුර | 02 | 0.050 | 80 |
| 9 | පොළොන්නරුව | 04 | 0.100 | 160 |
| 10 | මඩකලපුව | 01 | 0.025 | 40 |
| 11 | අම්පාර | 02 | 0.050 | 80 |
| 12 | කුරුණෑගල | 02 | 0.050 | 80 |
| 13 | පුත්තලම | 02 | 0.050 | 80 |
| 14 | යාපනය | 04 | 0.100 | 160 |
| 15 | වවුනියාව | 02 | 0.050 | 80 |
| 16 | මුලතිව් | 01 | 0.025 | 40 |
| 17 | කිලිනොච්චි | 01 | 0.025 | 40 |
| 18 | බදුල්ල | 02 | 0.050 | 80 |
| 19 | මොණරාගල | 02 | 0.050 | 80 |
| 20 | රත්නපුර | 03 | 0.075 | 120 |
| 21 | කෑගල්ල | 02 | 0.050 | 80 |
| **එකතුව** | | **47** | **1.225** | **1960** |

ග්‍රාමීය කාන්තාවන්ගේ ආර්ථික ශක්තිය වැඩි දියුණු කිරීමේ අපේක්ෂාවෙන් ක්‍රියාත්මක සියලුම ණය වැඩසටහන් සඳහා (චක්‍රීය ණය වැඩසටහන/ වැන්දඹු හා ගෘහ මූලික කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම/ විදේශගත වීමට අපේක්ෂිත කාන්තාවන් සඳහා විකල්ප ආදායම් උත්පාදනය/ පශු සම්පත්/ දිරිය මංපෙත ආදී වැඩසටහන්) සුදුසුකම් ලැබිය හැක්කේ ආදායම් උත්පාදන මාර්ග සඳහා පෙළඹවීමේ පුහුණුව ලබා ගැනීමෙන් අනතුරුව ය.

**ආදර්ශ ප්‍රතිලාභී සහතික පත්‍රය**



2025.09.30 දිනට වැඩසටහන් 28 ක් පවත්වා ප්‍රතිලාභීන් 1,198 ක් දැනුවත් කර ඇත. ඒ සඳහා රු.700,000/- ක මුදලක් වැය කර ඇත.

එමෙන්ම වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම යටතේ ළමා නිවාසවල සිට සමාජගත වන අවු. 18 ඉක්ම වූ ගැහැනු ළමුන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටමේ හෙද පුහුණුව හා ආහාර නිෂ්පාදන පුහුණු වැඩසටහනක් පවත්වනු ලබයි. මෙය රාජ්‍ය - පෞද්ගලික හවුල්කාර ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක අතර තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) මඟින් තාක්ෂණික පුහුණුව ලබාදීමත් ආයතනය විසින් එම පුහුණුලාභීන් රැකියාගත කිරීමත් සිදු කරයි.

සුවිශේෂී හේතූන් මත සමාජ සංවේදීතාවය අහිමි වූ කාන්තාවන් ආර්ථික හා සාමාජීය වශයෙන් සවිබල ගැන්වීම සඳහා "දිවියට අරුතක්" තේමාව යටතේ වැඩසටහනක් ක්‍රියාත්මක කරයි. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ පීඩාවට පත් වූ කාන්තාවන් විසින් කරනු ලබන ඉල්ලීම් හෝ වෙනත් පාර්ශ්වයන් වෙතින් කෙරෙන ඉල්ලීම් අනුව මෙම ව්‍යවසායකත්ව වැඩසටහන ක්‍රියාත්මක කරයි.

මෙම වැඩසටහන තුළ දීර්ඝකාලීනව ස්වාමිපුරුෂයන් බන්ධනාගාර ගතවූ ගෘහ කුටුම්භයන්හි ආර්ථිකය නඟා සිටුවීම මෙන්ම සුළු වැරදි සඳහා බන්ධනාගාර ගතව නිදහස් වන කාන්තාවන් නැවත බන්ධනාගාර ගතවීම වැළැක්වීම අරමුණු කරගත් මැදිහත් වීම් සිදුකරයි.

## 2.4 වෙළඳපොළ ප්‍රවර්ධනය සහ කාන්තා නිෂ්පාදන ප්‍රදර්ශනය හා අලෙවි පොළ

විවිධ අභියෝග හමුවේ කාන්තාවක් ලෙස ඇය පවුල තුල විවිධ ආර්ථික හා සමාජ ගැටළු රැසකට මුහුණ දෙනු ලබයි. එවන් තත්ත්ව අභිබවා ව්‍යවසායිකාවක් ලෙස නිෂ්පාදන හා සේවා සපයමින් ව්‍යාපාරික කටයුතුවල නිරත වීමට වෙර දරන කාන්තාවන් හඳුනාගෙන ඔවුන්ගේ නිෂ්පාදන හා සේවාවන්හි ගුණාත්මක තත්ත්වය ඇති කිරීම, වෙළඳපල අවස්ථා හඳුන්වාදීම, වෙළඳපල පුළුල් කිරීම මෙන්ම ඩිජිටල් අලෙවිකරණය වෙත යොමු කිරීම තුලින් ආර්ථිකය වැඩි දියුණු කර ගැනීම මෙන්ම පවුල තුළ හා සමාජීය තත්ත්වය යහපත්ව පවත්වාගෙන යැමට යෝග්‍ය පවුල් පරිසරයක් ඇති කිරීම පිණිස මෙම වැඩසටහන ක්‍රියාත්මක කර ඇත.

ඒ අනුව, දිස්ත්‍රික් 11 ආවරණය වන පරිදි අමාත්‍යාංශ ප්‍රතිපාදන රු. 877,571/- ක් යොදා ගනිමින් ව්‍යවසායකයින් 563 ක් සඳහා වෙළඳ පොළ අවස්ථා ලබා දීමට හැකි විය.

**2.5 කාන්තාව සමාජීය වශයෙන් සවිබලගැන්වීම**
ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ ප්‍රමුඛතම කාර්යභාරයක් ලෙස හිංසනයට හා අසරණභාවයට පත් වූ කාන්තාවන් සඳහා සපයන සේවාවන් හැඳින්විය හැකියි.

**2.5.1උපදේශන වැඩසටහන**

දුර්වල මානසික සෞඛ්‍ය තත්ත්වයෙන් පසුවන කණ්ඩායම්වලට ප්‍රජා මට්ටමේ බලපෑම් අවම කිරීම, උපදේශනයේ නවෝත්පාදනය හරහා ප්‍රමිතිගත උපදේශන සේවාවක් ලබා දීම, උපදේශන ක්ෂේත්‍රයේ පාර්ශ්වකරුවන් අතර සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීම හා සේවාව නිරීක්ෂණය කිරීම සඳහා මාර්ගෝපදේශ ස්ථාපිත කිරීම අරමුණ වේ.

ඒ සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සේවාවන් සැපයීම සඳහා උපදේශන නිලධාරි සහ උපදේශන සහකාරවරුන්ගේ සේවාව ක්‍රියාත්මක වේ. ඊට අමතරව විශේෂ මධ්‍යස්ථාන 12 ක් උපදේශන සේවාවන් ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවා ඇත. මෙම සේවා මධ්‍යස්ථාන අනුරාධපුර, මොණරාගල, නුගතලාව, රත්නපුර, කටුනායක (නිදහස් වෙළඳ කලාපය), කෑගල්ල, මාතර, ගාල්ල, ගම්පහ, කළුතර හා කොළඹ ප්‍රදේශයන්හි (උපදේශන ඒකක) ක්‍රියාත්මකයි.

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත හිංසනයට ලක් වන කාන්තාවන් මුහුණ දෙන සමාජයීය දුෂ්කරතා මඟ හැරවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අරමුණ කර ගනිමින් උපදේශන දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලබන අතර, ඒ යටතේ සේවාලාභීන් 1,410 ක් පමණ දැනුවත් කර ඇත.

**2.5.2 තාවකාලික කාන්තා රැකවරණ නිවාස**

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත හිංසනයට ලක්වන කාන්තාවන්ගේ ආරක්ෂාව සහ අයිතිවාසිකම් තහවුරු කිරීම යන අරමුණ පෙරදැරි කර ගනිමින් දිවයිනේ තාවකාලික කාන්තා රැකවරණ මධ්‍යස්ථාන 11 ක් පවත්වාගෙන යනු ලබයි.

වින්දිත කාන්තාවන්ගේ ආරක්ෂාව, පුනරුත්ථාපනය, ස්වාධීනත්වය සහ සවිබලගැන්වීම ඉලක්ක කරගත් පරිපූර්ණ රැකවරණ නිවාස සේවා ඇතුළු ඔවුන් වෙනුවෙන් සහාය සේවා වැඩිදියුණු කිරීම මඟින් ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට එරෙහි ලිංගික සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීම මෙහි මූලික අරමුණ වේ.

වින්දිත කාන්තාවන්ට සහ ඔවුන්ගේ දරුවන්ට සහ එහි අවදානමට පත්ව සිටින්නන්ට පහත සඳහන් සේවාවන් සපයනු ලැබේ.

- ක්ෂණික සහන සහ රැකවරණ නිවාස සහාය
- ආරක්ෂාව සහ ආරක්ෂිත පරිසරය
- ප්‍රතිකර්ම, පුනරුත්ථාපන සහ පිළියම් සේවා
- යොමු කිරීම් සේවා
- සමාජගත කිරීම සඳහා වන වෘත්තීය පුහුණුව
- පසුවිපරම

ඒ සඳහා දැනට රැකවරණ නිවාස 11 ක් දිස්ත්‍රික් 10 ක ක්‍රියාත්මක වේ. මේ අතරින් මධ්‍යස්ථාන 2 ක් අමාත්‍යාංශ සෘජු ප්‍රතිපාදන මඟින් හා අනෙක් රැකවරණ නිවාස ස්වේච්ඡා සංවිධානවල සහය ඇතිව පවත්වා ගෙන යනු ලබයි.

වගුව 13 - තාවකාලික කාන්තා රැකවරණ නිවාස ව්‍යාප්තිය හා සේවාලාභීන්

| අනු අංකය | රැකවරණ නිවාසය | පරිපාලන / සහයක ආයතනය | සේවාලාභීන් ගණන (2025.09.30 දිනට) |
|---|---|---|---|
| 1 | ගම්පහ | කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය | 04 |
| 2 | රත්නපුර | කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය | 04 |
| 3 | මොණරාගල | කාන්තා සංවර්ධන මධ්‍යස්ථානය | 48 |
| 4 | කොළඹ | කාන්තා පිහිට ආයතනය | 81 |
| 5 | මඩකළපුව | කාන්තා පිහිට ආයතනය | 63 |
| 6 | අනුරාධපුර | කාන්තා පිහිට ආයතනය | 51 |
| 7 | මාතර | කාන්තා පිහිට ආයතනය | 80 |
| 8 | යාපනය | Jaffna Social Action Center | 102 |
| 9 | මුලතිව් | Jaffna Social Action Center | 105 |
| 10 | අනුරාධපුර (තඹුත්තේගම) | ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමය | 129 |
| 11 | නුවරඑළිය | කාන්තා සංවර්ධන මධ්‍යස්ථානය | 01 |
| එකතුව | | | **668** |

2025 වර්ෂය තුළ කාන්තාවන් 668 දෙනෙකු සඳහා සේවාවන් සපයා ඇති අතර, මේ දක්වා දරන ලද වියදම රු.මි. 17.498 කි.

## 2.6. කිලිනොච්චිය වැන්දඹු හා ගෘහ මූලික කාන්තා ජාතික මධ්‍යස්ථානය

වැන්දඹු හා ගෘහ මූලික කාන්තාවන්ගේ සුභ සාධනය සඳහා 2015.11.13 දින ආරම්භ කරන ලද මෙම මධ්‍යස්ථානය මඟින් කාන්තාවන් සඳහා තාක්ෂණික පුහුණුව අනුව ආදායම් උත්පාදන අවස්ථා ලෙස තල් නිෂ්පාදන, මැහුම් ව්‍යාපෘති, විසිතුරු භාණ්ඩ, ගව පාලනය, එළු පාලනය යනාදි ව්‍යාපෘති සඳහා අවශ්‍ය පහසුකම් සපයන අතර, ඒ සඳහා අවශ්‍ය පුහුණුව හා ආධාර ලබා දෙනු ඇත.

2025 වර්ෂයේ දී ගෘහමූලික කාන්තාවන් සවිබලගැන්වීම සඳහා වැඩසටහන් 12 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 2.0 ක ප්‍රතිපාදන වැය කර ඇත.

ඡායාරූප 2 : කිලිනොච්චිය වැන්දඹු හා ගෘහමූලික කාන්තා ජාතික මධ්‍යස්ථානය





## 2.7. ජාත්‍යන්තර දින සැමරුම්

ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය ජාත්‍යන්තර දින සැමරුම් දෙකක් වාර්ෂිකව සිදු කරනු ලබයි. එයින් "ජාත්‍යන්තර කාන්තා දිනය" සැමරීමේ ජාතික ආයතනය වන අතර "ලෝක මානසික සෞඛ්‍ය" දිනය සැමරීමේ එක් පාර්ශ්වයක් ලෙස කටයුතු කරයි.

## 2.7.1 ජාත්‍යන්තර කාන්තා දින ජාතික සැමරුම

ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව ශ්‍රී ලංකාව "ජාත්‍යන්තර කාන්තා දින ජාතික සැමරුම් වැඩසටහන" පවත්වනු ලබන අතර, මෙවර **"තැනුමට තිරසර හෙටක් - සවිමත් ඇය වේ මගක්"** තේමා කර ගනිමින් කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් එය සංවිධානය කරනු ලබයි.

ඒ අනුව, ජාතික කාන්තා දින සැමරුම් වැඩසටහන 2025.02.26 දිනැති අමාත්‍යමණ්ඩල තීරණය අනුව "ජාතික කාන්තා සතිය - 2025" ලෙස ප්‍රකාශයට පත් කර 2025 මාර්තු 02 සිට 2025 මාර්තු 08 දක්වා ජාතික සැමරුම් වැඩසටහන පැවැත්වුණි.

ඒ අනුව, පහත පරිදි සමස්ත දිවයින ම ආවරණය වන පරිදි අදාල අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතන විසින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල කේන්ද්‍රකර ගනිමින් සිදු කිරීමට සැලසුම් කරන ලදී'

වගුව **14 - ජාතික කාන්තා සතිය වැඩසටහන**

| | දිනය | තේමාව | ඉලක්කගත වැඩසටහන |
|---|---|---|---|
| 1 | 2025.03.02 | "කාන්තා ව්‍යවසායකත්වය මගින් ගොඩනගමු දැය" | ජාතික ආර්ථිකයේ කාන්තා දායකත්වය ඉහළ නැංවීම සඳහා සඳහා ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ ව්‍යවසායක කාන්තාවන් සඳහා ව්‍යවසායක දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය මෙන් ම "ඩිජිටල් ආර්ථිකය" (Digital Economy) වෙත ප්‍රවේශය ඇති කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම. |
| 2 | 2025.03.03 | "කාර්යක්ෂම ශ්‍රම සම්පතක් - ගෞරවනීය වෘත්තියක්" | රැකියා වෙළඳ පොළ තුල කාන්තා දායකත්වය ඉහළ නැංවීම සඳහා රැකියා අවස්ථා හඳුන්වා දීම, පෙළඹවීම සහ විශේෂයෙන් පාසල් හැරයන ගැහැනු දරුවන් සඳහා වෘත්තීය පාඨමාලා හඳුන්වා දීමට අදාළ ව වැඩසටහන් පැවැත්වීම. රැකියා ස්ථානය තුළ හිංසනයෙන් තොර වෘත්තීය තෘප්තිය තහවුරු කෙරෙන ආයතනික ව්‍යුහයක් ස්ථාපිත කිරීමට අදාළ වැඩසටහන් පැවැත්වීම. |
| 3 | 2025.03.04 | "නිරෝගී කතුන් දැයට සවියකි" | කාන්තාවන් සඳහා සෞඛ්‍ය සායන, දැනුවත් කිරීම් සහ උපදේශන වැඩසටහන් සංවිධානය කර පැවැත්වීම. |
| 4 | 2025.03.05 | *"ක්ලීන් ශ්‍රී ලංකා"* වැඩසටහන තුළ කාන්තා භූමිකාව | ආකල්ප සංවර්ධනය තුළින් යහපත් කාන්තා පරපුරක් බිහි කිරීම, මත් ද්‍රව්‍ය උවදුර තුළින් කාන්තාවන් හා අනාගත දරු පරපුර සුරක්ෂිත කිරීම මුල් කරගත් සමාජීය වැඩසටහන් සහ ප්‍රාදේශීය මට්ටමින් ශ්‍රමදාන, පවිත්‍රතා වැඩසටහන් සංවිධානය. |
| 5 | 2025.03.06 | "ප්‍රීතිමත් පවුලක් - වින්දනීය ජීවිතයක්" | කාන්තා කර්ය සංවිධාන සාමාජිකාවන්ගේ පවුලේ සියලු දෙනාගේ සහභාගිත්වය සමඟ රස වින්දනාත්මක වැඩසටහන් පැවැත්වීම |
| 6 | 2025.03.07 | ***"තැනුමට තිරසර හෙටක් - සවිමත් ඇය වේ මගක්"*** තේමාව යටතේ ජාතික සැමරුම උත්සවය | ජාත්‍යන්තර කාන්තා දින ජාතික උත්සවය බත්තරමුල්ල, "සුහුරුපාය" පරිශ්‍රයේ පැවැත්වීම. |
| 7 | 2025.03.08 | "දැනවත් වෙමු කාන්තාව අයිතිවාසිකම් පිළිබඳව" | කාන්තාව සහ ගැහැනු දරුවන් සම්බන්ධව ජාත්‍යන්තර හා ජාතික වශයෙන් ක්‍රියාත්මක නීති, අණ පනත් මෙන්ම ආයතනික සහායන් (උදා: 1929 හා 1938 Helpline) පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම හා නායකත්ව කුසලතා ඉහළ නැංවීමට අදාළ වැඩසටහන් පැවැත්වීම. |

### 2.7.2 මානසික සෞඛ්‍ය දිනය

එක්සත් ජාතීන්ගේ සෞඛ්‍ය සංවිධානය (WHO) මගින් සෑම වසරකම ඔක්තෝබර් 10 වනදා ලෝක මානසික සෞඛ්‍ය දිනය ලෙස නම් කර ඇත. 2025 වසර සඳහා තේමාව වන්නේ “ප්‍රජාව: මානසික යහපැවැත්මට එක්ව සහාය වීම” යන්නයි. මීට සමගාමීව ජාතික, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය වශයෙන් වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කර ඇත.

**වගුව 15 - ජාතික මානසික සෞඛ්‍ය දින සැමරුම් ප්‍රධාන වැඩසටහන**

| | දිනය | වැඩසටහන / ක්‍රියාකාරකම | අපේක්ෂිත අරමුණ / ප්‍රතිඵලය |
|---|---|---|---|
| 1 | 2025.10.10 | ලෝක මානසික සෞඛ්‍ය දින සැමරුම් වැඩසටහන (කුරුණෑගල දිස්ත්‍රික්කය) | මානසික සෞඛ්‍ය පිළිබඳ සමාජීය අවධානය යොමු කිරීම |
| | 2025.10.19 - 20 | උපදේශන නිලධාරි / උපදේශන සහකාර නිලධාරි වෘත්තීය සංවර්ධන පුහුණු වැඩමුළුව (වැඩමුළු 3 ක්) | මානසික සෞඛ්‍ය පිළිබඳ නිලධාරී ධාරිතා සංවර්ධනය |

**වගුව 16 - ජාතික මානසික සෞඛ්‍ය දින සැමරුම් දිස්ත්‍රික් වැඩසටහන**

| | දිනය | වැඩසටහන / ක්‍රියාකාරකම | අපේක්ෂිත අරමුණ / ප්‍රතිඵලය |
|---|---|---|---|
| 1 | 2025.10.12 | “ප්‍රජාව: මානසික යහපැවැත්මට එක්ව සහාය වීම” යන ලෝක මානසික සෞඛ්‍ය දින තේමාවට අදාළව පුහුණු වැඩසටහන | “ප්‍රජාව: මානසික යහපැවැත්මට එක්ව සහාය වීම” පිළිබඳව නිලධාරීන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය කිරීම. |
| 2 | 2025.10.13 - 18 | කාන්තා කාර්ය සංවිධාන සාමාජිකාවන්ගේ පවුල් 100ක් මනෝ සමාජයීය වශයෙන් සවිබලගැන්වීම සඳහා ප්‍රජා පාදක වැඩසටහන. | උපදේශන සේවාව සහ එහි ප්‍රතිලාභ වඩාත් කාර්යක්ෂමව ප්‍රජාව වෙත සමීප කිරීම. |

**වගුව 17- ජාතික මානසික සෞඛ්‍ය දින සැමරුම් ප්‍රාදේශීය වැඩසටහන**

| අනු අංකය | දිනය | වැඩසටහන / ක්‍රියාකාරකම | අපේක්ෂිත අරමුණ / ප්‍රතිඵලය |
|---|---|---|---|
| 1 | 2025.10.11 | සමාජ විෂයෙහි මානසික සෞඛ්‍යයෙහි වැදගත්කම තේමාකර ගත් වැඩමුළුව | ඵලදායිත්වය හා වෘත්තීය තෘප්තිය ඉහළ නැංවීම |
| 2 | 2025.10.12 | සෞන්දර්යය හා කලාව හා බැඳුනු උපදේශන ක්‍රම ශිල්ප සමාජගත කිරීමේ වැඩසටහන | කලා නිර්මාණ මඟින් මානසික තෘප්තිය කෙතරම් ඉහළ දැමීමේ හැකියා ඇත්ද යන්න පෙන්වාදීම. |
| 3 | 2025.10.13 | ජංගම උපදේශන සායන | උපදේශන සේවාව ගම වෙත ගෙනයාම හා එහි වැදගත්කම පෙන්වා දීම. |
| 5 | 2025.10.14 | පෙර පාසල් වියේ දරුවන්ගේ මානසික සෞඛ්‍ය රැක ගැනීම තේමාකර ගත් වැඩමුළුව | දරුවන්ගේ යහපැවැත්ම තහවුරු කිරීම සඳහා වැඩිහිටියන්ට අවශ්‍ය දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය. |
| 6 | 2025.10.15 | තාක්ෂණික මෙවලම් භාවිතය හා ආශ්‍රිත ආරක්ෂණය හා රැකවරණය | සයිබර් අවකාශයේ අපරාධ අවම කිරීම.<br>මාර්ගගත ආරක්ෂාව (Online Safety) කෙරෙහි සමාජ අවධානය ඇති කිරීම. |
| **7** | 2025.10.16 | විශේෂ බන්ධනාගාර වැඩසටහන | කාන්තා රැඳවියන්ගේ මානසික සෞඛ්‍ය ඉහළ නැංවීම. |

## 2.8. කාන්තා සංවිධාන ජාලය ගොඩනැගීම

කාන්තාවන් ආර්ථික හා සමාජයීය වශයෙන් සවිබලගැන්වීම සඳහා ග්‍රාම සේවා වසම් මට්ටමින් වයස අවුරුදු 18 වැඩි සියලු ම කාන්තාවන් ඒකරාශී කර ගනිමින් කාන්තා කාර්යය සංවිධාන පිහිටුවා ගන්නා අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් එම කාන්තා නිලධාරින්ගේ සහභාගිත්වයෙන් ප්‍රාදේශීය කාන්තා බලමණ්ඩල පිහිටුවා ඇත. කාන්තාවන් දිස්ත්‍රික් මට්ටමින් ඒකරාශී කිරීම සඳහා දිස්ත්‍රික් 25ටම සම්බන්ධ කාන්තා නිලධාරින් මගින් දිස්ත්‍රික් කාන්තා බලමණ්ඩල පිහිටුවයි. මෙම ජාලය මගින් සමස්ත කාන්තා ප්‍රජාවම රටේ සංවර්ධනයට දායක කර ගැනීමත්, ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මගින් සිදු කරන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් සිදු කරනු ලබයි.

- කාන්තා කාර්යය සංවිධාන (වසම් මට්ටමින් ) 12,994
- ප්‍රාදේශීය කාන්තා බලමණ්ඩල (ප්‍රාදේශීය මට්ටමින්) 317
- දිස්ත්‍රික් කාන්තා බලමණ්ඩල (දිස්ත්‍රික් මට්ටමින්) 25 ද සක්‍රීය ව පවතී

## 2.9. විදේශීය අරමුදල් භාවිතයෙන් සිදුකළ ව්‍යාපෘති

### 2.9.1 ව්‍යවසායකත්වය, නායකත්වය හා ජාලකරණය හරහා කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම

ව්‍යවසායකත්වය, නායකත්වය හා ජාලකරණය හරහා කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා JICA (ජපන් අන්තර්ජාතික සහයෝගිතා ඒජන්සිය) මගින් කාන්තා කාර්ය සංවිධාන ප්‍රතිසංවිධානය හා කාන්තා ව්‍යවසායකයන් බලගැන්වීමේ ව්‍යාපෘති අම්පාර හා මොණරාගල දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වේ. JICA ආයතනය ව්‍යාපෘතිය සඳහා සෘජුව වියදම් දරයි. ව්‍යාපෘති කාල සීමාව 2023 - 2027 වර්ෂය දක්වා වේ.

මෙහිදී කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම අංගය යටතේ එක් දිස්ත්‍රික්කයකින් කාන්තා ව්‍යවසායිකාවන් 09 ක් බැගින් 18 දෙනෙකු තෝරා ගන්නා ලද අතර ඔවුන් සඳහා භාණ්ඩ හා උපකරණ ලබා දීමේ ක්‍රියාවලියෙහි ප්‍රසම්පාදන කටයුතු මේ වන විට සිදුකරමින් පවතී.

එමෙන් ම මෙම ව්‍යාපෘතියෙහි කාන්තා කාර්ය සංවිධාන සක්‍රීය කිරීමේ අංගය යටතේ කාන්තා කාර්ය සංවිධාන සාමාජිකාවන් සාමාජයීය වශයෙන් සවිබලගැන්වීම සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන් 56 ක් මේ වන විට පවත්වා ඇත. තව ද මෙහි ක්‍රියාකාරකමක් වන කාන්තා කාර්ය සංවිධාන ව්‍යවස්ථා සංශෝධනය කිරීමේ කටයුතු සහ ජාතික බල මණ්ඩලය පිහිටුවීම සඳහා කැබිනට් පත්‍රිකාව සකස් කිරීමේ කටයුතු ද මේ වනවිට අවසන් අදියරෙහි පවතී.

### 2.9.2 නුවරඑළිය දිස්ත්‍රික්කයේ තිරසර ප්‍රජා මූලික පවුල් සවිබල ගැන්වීම - Saemaul

(සෙමාවුල් ගෝලීය පදනම) මගින් අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම, 2023 අගෝස්තු 25 සමාරම්භක උළෙල පැවැත්වූ අතර, ශාන්තිපුර පාසලේ පිළිසකර කිරීම් සිදු කර ඇත. බිඳුණුවැව කෘෂිකර්ම මධ්‍යස්ථානයේදී ගොවීන් 60 ක් සඳහා කෘෂිකාර්මික පුහුණුව ලබාදීමට සැලසුම් කිරීම. නුවරඑළිය දිස්ත්‍රික්කයේ බඹරකැලේ සෙමාවුල් එළවළු එකතුකිරීමේ මධ්‍යස්ථානය නවීකරණය කිරීම සඳහා නැවත ටෙන්ඩර් කැඳවීම සිදු කර ඇත. මෙම ව්‍යාපෘතිය 2022-2026 වර්ෂ සඳහා ක්‍රියාත්මක වේ. ප්‍රදායක ආයතනය සෘජුව වියදම් දරයි.

**2.9.3 ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය සංවර්ධන ප්‍රතිපාදන හදිසි ආධාර ව්‍යාපෘතිය - ආසියානු සංවර්ධන බැංකුව**

වෘත්තීය හා ධාරිතා පුහුණු ලබාදීම හා අඩු ආදායම්ලාභී කාන්තාවන් සඳහා ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙමගින් සිදුවේ. ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් රු.මි. 10.766 ක මුදලක් වැය කර ඇති අතර, මෙය 2022-2026 වර්ෂ සඳහා ක්‍රියාත්මක වේ.

**2.9.4 කාන්තා අයිතීන් සුරක්ෂිත කිරීමේ ව්‍යාපෘති - UNFPA (එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල)**

වාර්ෂික ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වේ. කාන්තා රැකවරණ මධ්‍යස්ථාන සඳහා CDMA දුරකථන 42 ක බිල් ගෙවීම, වනිතා සංවර්ධන නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන පාඨමාලාව පැවැත්වීම, තාවකාලික රැකවරණ මධ්‍යස්ථාන ක්ෂේත්‍ර නිරීක්ෂණය. මූල්‍ය ප්‍රගතිය රු.මි. 0.290 කි.

**2.9.5 එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකය (UN Women) හා ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් - 2024- 2025**

කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම යටතේ එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකය (UN Women), ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය හා ඒකාබද්ධව 2024 මාර්තු මස සිට 2025 මාර්තු දක්වා ව්‍යාපෘති හතරක් (4) ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලැබේ. මෙහිදී එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින් ව්‍යවසායක කාන්තාවන් 43 දෙනෙකු බැගින් ව්‍යවසායක කාන්තාවන් 500 දෙනෙකු බල ගැන්වීම සිදු කෙරේ.

මෙම ව්‍යාපෘතියෙහි කොරියානු ආධාර යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ ඇල්ල/ හාලිඇල/ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි සමාජ ආර්ථික අර්බුදයෙන් පීඩාවට පත් වූ කාන්තාවන් ආමන්ත්‍රණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය.

**2.9.6 එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP)**

තාවකාලික කාන්තා රැකවරණ මධ්‍යස්ථාන පරිපාලනය පිළිබඳ ජාතික මාර්ගෝපදේශ, පිළිබඳ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කමිටු සාමාජිකයන් ලබා දී දැනුවත් කිරීමට සහාය, රත්නපුර හා මාතර හැර ඉතිරි කාන්තා රැකවරණ මධ්‍යස්ථාන පවතින දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කමිටු මේ වන විට දැනුවත් කර ඇත.

## 3.0 වැඩසටහන් කිහිපයක විශේෂ අවස්ථා






ජාත්‍යන්තර කාන්තා දින ජාතික උත්සවයට සමගාමීව පවත්වන ලද වැඩසටහන්



ධීවර ක්ෂේත්‍රය ආශ්‍රිත කාන්තා කරවල නිෂ්පාදනය සහ අලෙවිය - කොළඹ දිස්ත්‍රික්කය, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය



දිරිය මං පෙත - කණ්ඩායම් ව්‍යාපෘතිය ඇල්ස්ට්‍රොමේරියා සහ ඩේසි මල් වගාව වැලිමඩ දිස්ත්‍රික්කය, ඔහිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය



දිරිය මං පෙත - කණ්ඩායම් ව්‍යාපෘතිය
බතික් නිර්මාණ ව්‍යාපෘතිය
මහනුවර දිස්ත්‍රික්කය, පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය



දිරිය මං පෙත - කණ්ඩායම් ව්‍යාපෘතිය
අඹ වගා ව්‍යාපෘතිය (වගා ක්ෂේත්‍ර පුහුණුව)
කුරුණෑගල දිස්ත්‍රික්කය, ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

## 4.0 ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්හි 2025.09.30 දිනට ප්‍රගතිය

| අනු අංකය | වැඩසටහන | මූල්‍ය ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභී කාන්තාවන් ගණන | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | ස්ත්‍රී | පුරුෂ |
| **1.** | **ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් කාන්තාවන් සවිබල ගැන්වීම** | | | | | | |
| 1.1 | අඩු ආදායම්ලාභී නාගරික කාන්තාවන් සවිබලගැන්වීම වැඩසටහන | 4.000 | 0.500 | 40 (ව්‍යාපෘති) | 14 (ව්‍යාපෘති) | 34 | - |
| 1.2 | වැන්දඹු හා ගෘහ මූලික කාන්තා ආධාර වැඩසටහන | 5.000 | 0.300 | 50 (ව්‍යාපෘති) | 18 (ව්‍යාපෘති) | 44 | - |
| 1.3 | කාන්තාවන් ආර්ථික හා සාමාජයීය වශයෙන් සවිබලගැන්වීම සඳහා වන ‘දිරිය මං පෙත’ වැඩසටහන (තනි පුද්ගල සහ කණ්ඩායම) | 12.000 | 2.200 | 40 (ව්‍යාපෘති) | 19 (ව්‍යාපෘති) | 160 | - |
| 1.4 | විදේශගත වීමට අපේක්ෂිත කාන්තාවන් සඳහා විකල්ප ආදායම් උත්පාදන වැඩසටහන | 4.000 | 0.280 | 40 (ව්‍යාපෘති) | 10 (ව්‍යාපෘති) | 32 | - |
| 1.5 | ධීවර ආශ්‍රිත ගෘහ කර්මාන්තය සඳහා යොමු වීමට සුදුසු කාන්තාවන් සවිබල ගැන්වීම | 4.126 | 0.300 | 41 (ව්‍යාපෘති) | 11 (ව්‍යාපෘති) | 32 | - |
| 1.6 | වතු අංශයේ ගෘහ කර්මාන්තය සඳහා යොමු වීමට සුදුසු කාන්තාවන් සවිබල ගැන්වීම | 3.000 | 0.500 | 32 (ව්‍යාපෘති) | 13 (ව්‍යාපෘති) | 32 | - |
| 1.7 | සවිමත් කතක්-සුවබර පවුලක් වැඩසටහන | 2.500 | - | 5 (පවුල්) | 10% | 25 | 8 |
| 1.8 | සුවිශේෂී හේතූන් මත සමාජ සංවේදීතාවය අහිමි වූ කාන්තාව ආර්ථික හා සාමාජයීය වශයෙන් සවිබල ගැන්වීම යටතේ ‘දිවියට අරුතක්’ වැඩසටහන | 5.000 | 0.925 | 50 (ව්‍යාපෘති) | 28 (ව්‍යාපෘති) | 50 | - |
| 1.9 | නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රමවලින් පීඩනයට පත් ග්‍රාමීය කාන්තාවන්ට සහන සැලසීම | 4.000 | 0.200 | 40 (ව්‍යාපෘති) | 10 (ව්‍යාපෘති) | 40 | - |
| 1.10 | වනිතා නවෝදය කාන්තා කාර්ය සංවිධාන සක්‍රීය කිරීම | 1.000 | 0.210 | 40 (කා.කා.සං.) | 16 (ව්‍යාපෘති) | 1.500 | - |
| 1.11 | ළමා නිවාසවල සිට ඉවත්වන අවු. 18 ඉක්ම වූ ගැහැනු ළමුන් සමාජගත කිරීම සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)මට්ටමේ හෙද පුහුණුව ලබා දීම හා අවශ්‍ය මූලික පුහුණුව ලබා දීම | 1.500 | - | 1 (ව්‍යාපෘති) | 5% ප්‍රතිපාදන යොමු කර ඇත | 30 | - |
| 1.12 | කිලිනොච්චිය වැන්දඹු සහ ගෘහ මූලික කාන්තාවන් සවිබලගැන්වීමේ ජාතික මධ්‍යස්ථානය - කාන්තාවන් සඳහා ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | 2.000 | - | 23 (ව්‍යවසායක ව්‍යාපෘති) | 10% | 23 | - |
| 1.13 | වෙළඳ පොළ ප්‍රවර්ධන සහ අලෙවි පොළ පැවැත්වීම (අලෙවි රථ සහ ආවරණ සැපයීම) | 3.704 | - | 1,500 (ප්‍රතිලාභීන්) | 10% | - | - |
| 1.14 | ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමී 'ලිය ශක්ති' අලෙවි පොළ | 1.000 | 0.551 | 200 (ප්‍රතිලාභීන්) | 200 (ප්‍රතිලාභීන්) | 200 | |
| 1.15 | ව්‍යවසායක කාන්තාවන් සඳහා ආදායම් උත්පාදන පුහුණු වැඩසටහන් පැවැත්වීම | 1.200 | 0.700 | 40 (වැඩසටහන්) | 28 (වැඩසටහන්) | 800 | |
| | උප එකතුව | **54.030** | **6.666** | | | **3,002** | |

| අනු අංකය | වැඩසටහන | මූල්‍ය ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභී කාන්තාවන් ගණන | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | ස්ත්‍රී | පුරුෂ |
| 1.16 | මාධ්‍ය සහ පුස්තකාල සංවර්ධනය | 1.000 | 0.200 | 800 (නිලධාරීන්) | 20% | - | |
| 1.17 | ක්ෂේත්‍ර නිලධාරී මෙහෙයවීම සහ අධීක්ෂණය (රාජකාරි දිනපොත් මුද්‍රණය සහ උපදේශන සේවාලාභී ආකෘති මුද්‍රණය) | 1.200 | - | 800 (නිලධාරීන්) | 5% | - | |
| 1.18 | අධීක්ෂණය සහ ප්‍රගති සමාලෝචනය (වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම / කාන්තා කාර්ය සංවිධාන / වනිතා ශක්ති පදනම්) | 1.000 | 0.863 | 800 (නිලධාරීන්) | 70% | - | |
| 1.19 | ජාත්‍යන්තර කාන්තා දින ජාතික සහ දිස්ත්‍රික් සැමරුම් වැඩසටහන් | 2.270 | 1.274 | 1+25 (වැඩසටහන්) | 95% | - | |
| | **උප එකතුව** | **5.470** | **2.337** | | | | |
| | **මුළුඑකතුව** | **59.500** | **9.003** | | | **3,002** | |

| අනු අංකය | වැඩසටහන | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභී කාන්තාවන් ගණන | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | ස්ත්‍රී | පුරුෂ |
| **2.** | **ළමා අපයෝජනය හා කාන්තාවන්ට එරෙහි හිංසනය වැළැක්වීම** | | | | | | |
| 2.1 | තාවකාලික කාන්තා රැකවරණ මධ්‍යස්ථාන (10) නඩත්තු කිරීම | 33.500 | 19.122 | 75% වියදම් ප්‍රතිපූර්ණය | 80% වියදම් ප්‍රතිපූර්ණය | 50 | - |
| 2.2 | උපදේශන මධ්‍යස්ථාන (12) නඩත්තුව කිරීම | 0.500 | 0.026 | 75 වියදම ප්‍රතිපූර්ණය | 8% වියදම් ප්‍රතිපූර්ණය | - | - |
| 2.3 | උපදේශන මධ්‍යස්ථාන නඩත්තු කිරීම - නුගතලාව උපදේශන මධ්‍යස්ථානය අළුත්වැඩියාව | 0.350 | - | 100 | - | 75 | 25 |
| 2.4 | උපදේශන දැනුවත් කිරීමේ වැඩසටහන | 1.500 | 0.525 | 60 (වැඩසටහන්) | 40% | 400 | 100 |
| 2.5 | ලෝක මානසික සෞඛ්‍ය දින සැමරුම් වැඩසටහන | 1.000 | - | - | - | 300 | 150 |
| 2.6 | ලෝක මානසික සෞඛ්‍ය දින දිස්ත්‍රික් සැමරුම් (25) වැඩසටහන | 1.000 | - | - | - | - | - |
| | **එකතුව** | **37.850** | **19.673** | | | **825** | **275** |

සටහන - හඳුනා ගන්නා ලද ව්‍යාපෘති සංඛ්‍යාවෙන් 95%කට පමණ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත යොමු කර ඇත. සියලු ව්‍යාපෘති ක්‍රියාත්මක අදියරෙහි පවතී.

# 10.7 ජාතික කාන්තා කමිටුව

**හැඳින්වීම**

1993 මාර්තු 08 දින පිහිටවනු ලැබූ ජාතික කාන්තා කමිටුව මඟින් කාන්තා ප්‍රඥප්තියේ නිර්දේශ ක්‍රියාවට නංවනු ලබයි. කාන්තාවන්ගේ සුභසිද්ධිය, ආරක්ෂාව, රැකවරණය වෙනුවෙන් ප්‍රතිපත්ති හා නීති සම්පාදනය කරනු ලබන ජාතික ආයතනයයි.

**1. ප්‍රධාන කාර්යභාරය**

සමානාත්මතාවය තහවුරු වූ, හිංසනයෙන් තොර, කාන්තාවන්ට හිතකර ශ්‍රී ලාංකික සමාජයක් බිහි කිරීමේ අරමුණින් පිහිටුවන ලද ජාතික කාන්තා කමිටුවේ ප්‍රධාන කාර්යය වන්නේ, ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කර ප්‍රවර්ධනය කිරිම, සමානාත්මතාවය තහවුරු කිරීම හා පූර්ණ සංවර්ධනයට ඉවහල් වන ප්‍රතිපත්ති හා නීති පද්ධතීන් සකස් කිරීම වේ. මේ සඳහා ජාතික කාන්තා කමිටුව මඟින් නිර්දේශ හා සහාය ලබා දීම, අධීක්ෂණය කර ඇගයීම සිදු කරනු ලබයි. ඒ අනුව ජාතික කාන්තා කමිටුව තුළ පැමිණිලි මධ්‍යස්ථානයක් සහ පැය 24 පුරා අවශ්‍ය සේවා සපයන 1938 කාන්තා උපකාරක දුරකතන සේවාව ක්‍රියාත්මක වේ. එම සේවාව මඟින් නීති උපදෙස් ලබා දීම, උපදේශනය ලබා දීම හා අදාළ ආයතන වෙත පැමිණිලිකරුවන් යොමු කිරිම හා වාර්තා කැඳවීම සිදු කරනු ලබයි. එමෙන්ම ලැබෙන පැමිණිලි සම්බන්ධව කාලීන පසුවිපරම් සිදු කිරීම ද ජාතික කාන්තා කමිටුවේ ප්‍රධාන කාර්යභාරයකි.

**2.0 ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන්**

**2.1 සයිබර් ප්‍රචණ්ඩත්වය, ප්‍රවාහනයේදී සිදුවන හිරිහැර සහ ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ උසස් අධ්‍යාපන ආයතනවල සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන**

පොදු ප්‍රවාහනයේදී හා අන්තර්ජාලය තුළ නව යෞවන යෞවනියන්ට සිදුවන හිංසනයන් වැළැක්වීම හා නව යොවුන්විය තුළ ඔවුන් මුහුණදෙන අභියෝග ජය ගැනීම සඳහා දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීම අරමුණ වේ.

ගම්පහ, හම්බන්තොට, රත්නපුර යන දිස්ත්‍රික්කයන්හි දී වැඩසටහන් 03 ක් පවත්වා ඇත.

**2.2 විවාහ අපේක්ෂිත තරුණ තරුණියන් සඳහා පූර්ව විවාහ පිළිබඳ උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (ප්‍රීතිමත් පවුල් ජීවිතයක් සඳහා)**

විවාහයෙන් පසු පවුල් ජීවිතය තුළ ඇති වන ගැටුම් අවම කර ගනිමින් සාර්ථක පවුල් ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය උපදේශනය ලබාදීම අරමුණයි.

යාපනය, බදුල්ල, පුත්තලම, ගම්පහ, කොළඹ, කෑගල්ල, ගාල්ල, කළුතර, යන දිස්ත්‍රික්කයන්හිදි වැඩසටහන් පැවැත්වීම සඳහා රු.මි. 0.894 ක ප්‍රතිපාදන බැදීම් පත්‍ර මඟින් යොමු කර ඇති අතර

යාපනය, කොළඹ, ගම්පහ දිස්ත්‍රික්කවල වැඩසටහන් පවත්වා ඇත. වැඩසටහන සඳහා රු.මි. 0.299 ක් වැය වි ඇත.

**2.3. විවාහයට පෙර විවාහ අපේක්ෂිතයින් සඳහා පූර්ව විවාහ උපදේශනය ලබා දීම සඳහා විවාහ රෙජිස්ටාර්වරුන් හා උපදේශන නිලධාරීන් / උපදේශන සහකාරවරුන් බලගැන්වීමේ වැඩසටහන**

විවාහයෙන් පසුව ඇතිවන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැලැක්වීම සඳහාත්, විවාහය තුළදී මතුවන ගැටළුකාරි තත්ත්වයන්ට මුහුණ දෙමින් සාර්ථක විවාහ ජීවිතයක් පවත්වාගෙන යාම සඳහාත්, විවාහ අපේක්ෂිත යුවලක් විවාහ වීමට ප්‍රථම අවබෝධයකින් යුතුව, විවාහ ජීවිතයට පිවිසීම ඉතා සුදුසු වන අතර, පූර්ව විවාහ උපදේශනය ඒ සඳහා සාධනීය විසඳුමක් ලෙස පෙන්වා දිය හැකිය.

ඒ අනුව, විවාහය ලියාපදිංචි කිරීමට පෙර විවාහ රෙජිස්ටාර්වරුන් වෙත විවාහ වීමට නම් ලබා දීමට පැමිණෙන විවාහ අපේක්ෂිත යුවල් වෙත පූර්ව විවාහ උපදේශනය ලබා දීම සඳහා උපදේශන නිලධාරින්/උපදේශන සහකාරවරුන් හා විවාහ රෙජිස්ටාර්වරුන් බල ගැන්වීම සහ ඔවුන් අතර සම්බන්ධීකරණයක් ඇති කිරීම මෙහි අරමුණයි.

බදුල්ල, ගාල්ල, මාතලේ, මඩකලපුව, මන්නාරම, කිළිනොච්චිය, වව්නියාව, මුලතිව්, පුත්තලම, නුවරඑළිය, පොළොන්නරුව සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කයන්හිදි වැඩසටහන් 11 ක් පැවැත්වීම සඳහා රු. මි. 1.106 ක ප්‍රතිපාදන බැදිම් පත්‍ර මඟින් යොමු කර ඇත. බදුල්ල, මාතලේ, මඩකලපුව, මන්නාරම, පොළොන්නරුව සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල වැඩසටහන් පවත්වා ඇත. එම වැඩසටහන් ක්‍රියාත්මක කිරිම සඳහා රු.මි. 0.534 ක් වැය වී ඇත.

**2.4. කාන්තාවන්ට හා ළමයින්ට සිදුවන හිංසනය වැළැක්වීම පිළිබඳ සේවා ස්ථානයන්හි කාර්යය මණ්ඩල දැනුවත් කිරිම, ආකල්ප සංවර්ධනය සහ නීති සම්බන්ධය පිළිබඳව දැනුම වැඩිදියුණු කිරිම සඳහා වැඩසටහන් පැවැත්විම.**

රැකියා ස්ථානයන්හි කාන්තා හිංසනය අවම කිරිම පිළිබඳ දැනුවත් කිරීම වැඩසටහනින් අරමුණු කෙරේ. කොළඹ, ගම්පහ, ගාල්ල යන දිස්ත්‍රික්කයන්හිදි වැඩසටහන් 06 ක් පවත්වා ඇත. මේ සඳහා රු.මි. 0.194 ක් වැය වී ඇත.

**2.5. ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව රජරට විශ්ව විද්‍යාලයේ සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨයේ සමාජීය විද්‍යා අධ්‍යනාංශයේ විශේෂවේදී සහ සාමාන්‍යවේදි උපාධි හදාරනු ලබන විද්‍යාර්ථයින් සඳහා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා ඒ ආශ්‍රයෙන් සිදුවන හිංසනය වැළැක්විම සහ මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරිමේ වැඩසටහන.**

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා ඒ ආශ්‍රයෙන් සිදුවන හිංසනය සහ සයිබර් අපරාධවලින් කාන්තාවන් හා දරුවන් මුදවා ගැනීම සඳහා විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින් දැනුවත් කිරිම මෙහි අරමුණ වේ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ රජරට විශ්වවිද්‍යාලයේදී වැඩසටහන් පවත්වා අවසන් කර ඇත. මෙම වැඩසටහන සඳහා රු.මි. 0.497 ක් වැය වී ඇත.

**2.6. පළාත් මට්ටමින් පවත්වන කාන්තාවන් දේශපාලනය සඳහා බලගැන්වීමේ නායකත්ව පුහුණු වැඩමුළුව.**

දේශපාලනයට අවතීර්ණ වීම සඳහා අවශ්‍ය දැනුම, කුසලතා හා ආකල්පවලින් හෙබි කාන්තා නායිකාවන් බිහිකිරීම හා දේශපාලනයට අවතීර්ණ වීම සඳහා කාන්තාවන් දිරිමත් කිරීම වැඩසටහනේ අරමුණු වේ.

මහනුවර, කුරුණෑගල, අනුරාධපුරය යන දිස්ත්‍රික්කයන්හි වැඩසටහන් පැවැත්වීම සඳහා රු.මි. 0.379 ක ප්‍රතිපාදන බැදීම් පත්‍ර මඟින් යොමු කර ඇත.

**2.7. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැලැක්වීම සහ ළමා ආරක්ෂාව පිළිබඳව වතු සුභසාධන නිලධාරින් දැනුවත් කිරීම සහ උපදේශන වැඩසටහන්**

වතු ප්‍රජාව වෙත වඩාත් යහපත් ජීවන මට්ටමක් හා තෘප්තිමත් රැකියා පරිසරයක් ගොඩනැඟීම සඳහා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන හා ළමා අයිතිවාසිකම් හා ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ වතු සුභසාධන නිලධාරින් දැනුවත් කිරීම මින් අරමුණු කර ඇත. ඒ අනුව මෙම වැඩසටහන නුවරඑළිය දිස්ත්‍රික්කයේදී පැවැත්වීමට කටයුතු සැලසුම් කරමින් ඇත.

**2.8. සේවා ස්ථානවල සේවය කරන නිලධාරින් සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය වැලැක්වීම සහ ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව පනත පිළිබඳව දැනුවත් කිරිම.**

ගෘහස්ථ හිංසන පනත පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරිම, කාන්තාවන්ට රැකියා ස්ථානයේ සිදුවන හිංසනයන් අවම කිරීම, ගෘහස්ථ හිංසනය අවම වීම මඟින් පවුල තුල සාමකාමී පරිසරයක් නිර්මාණය කිරීම, නිලධාරීන්ගේ රැකියා ඵලදායිතාව ඉහල නැංවීම අපේක්ෂිත අරමුණු වේ. කොළඹ දිස්ත්‍රික්කයේ වැඩසටහන් 4 ක් පවත්වා ඇති අතර ඒ සඳහා රු.මි. 0.259 ක් වැය වී ඇත.

**2.9. රැකියා ස්ථානවල තීරණ ගැනීම සහ දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තා සහභාගීත්වය හා නියෝජනය වැඩිකිරිමේ ප්‍රවේශයක් වශයෙන් විශ්වවිද්‍යාලවල සිසු සිසුවියන් දැනුවත් කිරීම.**

දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තා සහභාගීත්වය සහ රජයේ සහ පෞද්ගලික ආයතනයන්හි තීරණ ගන්නා මට්ටම් තුළ කාන්තා සහභාගීත්වය ඉහළ නැංවිම මෙහි අපේක්ෂිත අරමුණු වේ. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ වැඩසටහන පැවැත්වීම සඳහා රු.මි 0.141 ක ප්‍රතිපාදන බැදිම් පත්‍ර මඟින් යොමු කර ඇත .

**2.10. කාන්තා හිංසනය වැළැක්වීම සඳහා වන අන්තර්ජාතික දින 16 වැඩසටහන**

කාන්තාවන්ට එරෙහි සියලු හිංසන පිටු දැකීම උදෙසා සෑම වර්ෂයකම නොවැම්බර් මස 25 සිට දෙසැම්බර් මස 10 වන දින දක්වා දින 16 ක කාල පරාසයක් තුළ අන්තර්ජාතික දින 16 නමින් වැඩසටහන් සංවිධානය කරනු ලබයි. 2025 වර්ෂයේ ද එම කාල පරාසය තුළ ජාතික කාන්තා කමිටුව මඟින් වැඩසටහන් රාශියක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

ඒ අනුව, දේශීය හා විදේශීය අරමුදල් (**එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල**) භාවිතා කරමින් ජංගම සේවා සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. එහිදී දේශීය අරමුදල් භාවිතා කරමින් මඩකලපුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජංගම සේවාවක් පැවැත්වීමට රු.මි. 0.225 ක මුදලක් වෙන් කර ඇත. මේ සඳහා ප්‍රතිලාභීන් 1000 ක පමණ සහභාගීත්වයක් අපේක්ෂා කරන අතර, එහිදී උපදේශන සේවා, නීති සේවා, සෞඛ්‍ය සායන, ඇස් කණ්නාඩි ලබා දීම සහ ස්වයං රැකියා පුහුණු වැඩසටහන් ආදී වැඩසටහන් ප්‍රතිලාභීන් සඳහා පැවැත්වීමට නියමිතව ඇත.

විදේශීය අරමුදල් භාවිතා කරමින් අන්තර් ජාතික දින 16 ආරම්භක උත්සවය කොළඹ දී පැවැත්වෙන අතර, ඒ සඳහා රු.මි.0.296 ක මුදලක් වෙන් කර ඇත. එමෙන්ම අන්තර්ජාතික දින 16 වැඩසටහනට සමගාමීව පූර්ව විවාහ උපදේශන පිළිබඳ දැනුවත් කිරීම, උසස් අධ්‍යාපනය ලබන සිසුන් සඳහා සයිබර් අපරාධ වැළැක්වීම සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන් සහ රැකියා ස්ථානයේ සිදුවන හිංසනයන් අවම කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ද පැවැත්වීමට නියමිතය.

**2. 11. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා මැදිහත් වීම**

ජාතික කාන්තා කමිටුවේ කාර්යභාර්ය තවදුරටත් කාර්යක්ෂමව හා ඵලදායිතාවයෙන් යුතුව ඉටු කිරීමට භාෂා ත්‍රිත්වයෙන්ම පැය 24 පුරාම ක්‍රියාත්මක වන ගාස්තු රහිත 1938 කාන්තා උපකාරක දුරකතන සේවාව හා පැමිණිලි මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබයි. 2025 වර්ෂයේ සැප්තැම්බර් මස 30 වන විට 1938 කාන්තා උපකාරක දුරකතන සේවාව සඳහා පැමිණිලි 1689 ක් ලැබී ඇති අතර පැමිණිලි මධ්‍යස්ථානය සඳහා ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව 372 කි.

**2.12. විදේශීය ප්‍රතිපාදන - (සාක් සංවර්ධන අරමුදල ) සාර්ක් සාමාජික රටවල කාන්තාවන් සහ ළමුන් සඳහා ගාස්තු රහිත උපකාරක දුරකතන සේවාව ශක්තිමත් කිරීම සඳහා වන ව්‍යාපෘතිය - 4 වන දිගුව**

මෙම ව්‍යාපෘතිය සඳහා සාක් සංවර්ධන අරමුදල මඟින් ප්‍රතිපාදන සපයයි. ව්‍යාපෘති කාල සීමාව 2024.08.02 සිට 2025.08.01 වේ. මෙහි පළමු කාර්තුව සඳහා මිලියන 14.40 ක් (ඇමරිකානු ඩොලර් 45,712 ) ලබා දී ඇති අතර ඊට අදාළ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.


- පැය 24 පුරා ක්‍රියාත්මක වන ඇමතුම් මධ්‍යස්ථානය සහ මැදිහත්වීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.
- ආයතන ධාරිතාව ගොඩනැඟීම.
- උපදේශනය හා මහජනතාව දැනුවත් කිරීම.

(2024 දෙවන කාර්තුව වන විට මූල්‍ය ප්‍රගතිය රු.මි. 13.65 කි.)

උක්ත ක්‍රියාකාරී සැලසුමෙහි පහත උප ක්‍රියාකාරකම් යටතේ දිවයිනම ආවරණය වන ආකාරයට ක්‍රියාකාරකම් සිදු කෙරේ.

- 1938 උපකාරක දුරකතන සේවාව පිළිබඳ හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ආදී කරුණු පිළිබද අමාත්‍යාංශ සහ දිස්ත්‍රික් මට්ටමින් (ප්‍රධාන නිලධාරීන්) දැනුවත් කිරීමේ වැඩසටහන් 5 ක් සම්පූර්ණ කර ඇත.
- ජංගම සේවා දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වීම මේ වන විට සැලසුම් කර ඇත.
- 1938 උපකාරක දුරකතන සේවාව පිළිබඳ දිස්ත්‍රික්ක/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමේ උපදේශන නිලධාරින් සහ පාර්ශ්වකරුවන් (වෙනත් නිලධාරීන්) දැනුවත් කිරීම. මේ වන විට දැනුවත් කිරීමේ වැඩසටහන් 4 ක් සම්පූර්ණ කර ඇත.
- 1938 උපකාරක දුරකතන සේවාව සහ පැමිණිලි මධ්‍යස්ථානයට ලැබෙන පැමිණිලි පිළිබඳව පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම සහ අමාත්‍යාංශ නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් අතර සහයෝගීතාවය ගොඩ නැංවීමේ වැඩසටහන් පැවැත්වීම. මේ වන විට වැඩසටහන් 4 ක් සම්පූර්ණ කර ඇත.
- තෝරාගත් බිහිරි, ගොළු මධ්‍යස්ථානවල අය සඳහා සයිබර් අපරාධ පිළිබඳව සංඥා භාෂාවෙන් දැනුවත් කිරීම. මේ වන විට එක් වැඩසටහනක් සම්පූර්ණ කර ඇත.
- පෞද්ගලික අංශයේ (ආයෝජන කළාප සහ වෙනත් පෞද්ගලික සමාගම්/ඇඟලුම්) ආයතනවල 1938 උපකාරක දුරකතන සේවාව පිළිබඳ, ප්‍රජනන සෞඛ්‍ය, සේවා ස්ථානයේ ලිංගික හිංසනය වැලැක්වීමේ හා ලිංගාශ්‍රිත රෝග/එච්.අයි.වී වැළැක්වීම සහ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැලැක්වීම යන වැඩසටහන් 11 ක් මේ වනවිට සම්පූර්ණ කර ඇත.
- සමාජ පර්යේෂණ, 1938 උපකාරක දුරකතන සේවාව පිළිබඳ බස් රථ නාමකරණය, බස් මගී ආවරණ තුල 1938 හා 1929 උපකාරක දුරකතන සේවා පිළිබද ප්‍රචාරණ නාම පුවරු සවි කිරීම, ප්‍රචාරණ ද්‍රව්‍ය මුද්‍රණය මේ වන විට සැලසුම් කර ඇත.
- පැය 24 පුරා ක්‍රියාත්මක වන ඇමතුම් මධ්‍යස්ථානයේ දත්ත කළමනාකරණ පද්ධතිය ශක්තිමත් කිරීම. මේ වන විට ප්‍රසම්පාදනය අවසන් අදියරේ පවතී.
- නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය.මේ වන විට නිලධාරීන් 30 ක් සඳහා පුහුණු වීම් වැඩසටහන් 2 ක් පවත්වා ඇත. නිලධාරින් 13 දෙනෙකු නීති හා උපදේශනය පිළිබද ඩිප්ලෝමා සඳහා යොමු කර ඇත.
- වින්දිත කාන්තාවන්ට ආධාර කිරීම. මන්නාරම දිස්ත්‍රික්කයේ කාන්තාවන් 600 ක් සඳහා ආධාර ලබා දී ඇති අතර සමගාමී ක්‍රියාකාරකම් මේ යටතේ සිදු කෙරේ.
- 1938 ගාස්තු රහිත දුරකතන සේවාව ඔස්සේ පැමිණෙන සේවාලාභී ගැටළු සම්බන්ධ සිද්ධි කළමනාකරණය කිරීම පිළිබඳව නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහනක් ගම්පහ දිස්ත්‍රික්කයේ පවත්වා ඇත.

ප්‍රස්ථාර - 2


දිස්ත්‍රික් අනුව 1938 කාන්තා උපකාරක දුරකතන සේවය සඳහා ලද පැමිණිලි, ජනගහනයෙන් 10,000කට අනුපාතිකව - 2025.09.30
අනුරාධපුර
මුලතිව්
පොළොන්න...
රත්නපුර
හම්බන්තොට
ගාල්ල
කොළඹ
මොනරාගල
කළුතර
පුත්තලම
ගම්පහ
කුරුණෑගල
අම්පාර
මාතර
ත්‍රිකුණාමලය
කෑගල්ල
මන්නාරම
මහනුවර
මාතලේ
වව්නියාව
මඩකලපුව
බදුල්ල
නුවරඑළිය
කිළිනොච්චි
යාපනය
දිස්ත්‍රික්කය
0.0
1.0
2.0
3.0
4.0
5.0
6.0
පැමිණිලි සංඛ්‍යාව - ජනගහනයෙන් 10,000 අනුපාතිකව

## 3.0 වැඩසටහන් කිහිපයක විශේෂ අවස්ථා




අමාත්‍යාංශ සහ දිස්ත්‍රික් මට්ටමින් ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම




පෞද්ගලික අංශය දැනුවත් කිරීමේ වැඩසටහන්




උපදේශන නිලධාරින් සහ පාර්ශ්වකරුවන් (වෙනත් නිලධාරීන්) දැනුවත් කිරීම




පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම

## 4.0 ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්හි 2025.09.30 දිනට ප්‍රගතිය

| අනු අංකය | ව්‍යාපෘතිය/ කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය (%) | භෞතික ප්‍රගතිය (%) | ප්‍රතිලාභීන්/ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | ස්ත්‍රී | පුරුෂ |
| 1. | කාන්තා අයිතීන් සම්බන්ධීරකණය සහ සුරක්ෂිත කිරීම | | | | | | |
| 1.1 | උසස් අධ්‍යාපන ආයතන ළමුන් දැනුවත් කිරීම (සයිබර් අපරාධ, පොදු ප්‍රවාහනයේ දී සිදුවන හිංසනය, ප්‍රජනන සෞඛ්‍ය අධ්‍යාපනය | 0.500 | 0.258 | වැඩසටහන් 5 | වැඩසටහන් 3 | 157 | 200 |
| 1.2 | ජාත්‍යන්තර කාන්තා දින වැඩසටහන් (ලිංගික සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවය පදනම් කර ගත සයිබර් ප්‍රචණ්ඩත්වය සහ මිනිස් ජාවාරම වැලැක්වීම) | 0.500 | 0.497 | වැඩසටහන් 2 | වැඩසටහන් 2 | 250 | 100 |
| 1.3 | කාන්තා හිංසනය වැලැක්වීමේ අන්තර් ජාතික දින 16 වැඩසටහන් (ජංගම සේවා සහ දැනුවත් කිරීමේ වැඩසටහන්) | 0.500 | - | - | - | - | - |
| 1.4 | විවාහයට පෙර විවාහ අපේක්ෂකයින් සඳහා පූර්ව විවාහ උපදේශනය ලබා දීම සඳහා විවාහ රෙජිස්ට්‍රාර්වරුන් හා උපදේශන නිලධාරීන් දැනුවත් කිරීම. | 1.100 | 0.914 | වැඩසටහන් 12 | වැඩසටහන් 7 | 325 | 233 |
| 1.5 | පූර්ව විවාහ උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 0.900 | 0.913 | වැඩසටහන් 10 | වැඩසටහන් 9 | 660 | 196 |
| 1.6 | රැකියා ස්ථානයේ සිදුවන හිංසනය අවම කිරීම සඳහා කාර්මික ක්ෂේත්‍රයේ සේවයේ නියුතු සේවක සේවිකාවන් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් පැවැත්වීම | 0.500 | 0.166 | වැඩසටහන් 12 | වැඩසටහන් 7 | 464 | 310 |
| 1.7 | ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය හා ළමා ආරක්ෂාව පිළිබඳ වතු සුභසාධන නිලධාරීන් දැනුවත් කිරීම සහ උපදේශන වැඩසටහන් | 0.150 | - | වැඩසටහන් 3 | නොවැම්බර් | | - |
| **එකතුව** | | **4.150** | **2.748** | | | **1,856** | **1,039** |

| අනු අංකය | ව්‍යාපෘතිය/ කාර්යය | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන්/ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | ස්ත්‍රී | පුරුෂ |
| 1.8 | සේවා ස්ථාන වල සේවය කරන නිලධාරින් සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය වැලැක්වීම සහ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පනත පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන. | 0.375 | 0.259 | වැඩසටහන් 5 | වැඩසටහන් 4 | 227 | 98 |
| 1.9 | මැතිවරණය සඳහා ඉදිරිපත් වූ පලාත් මට්ටමේ කාන්තා සභිකයින් සහ කාන්තා නියෝජිත මන්ත්‍රීවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් | 1.800 | 0.211 | වැඩසටහන් 4 | | | |
| 1.10 | කාන්තාවන් පිළිබඳ කොමිෂන් සභාවක් පිහිටුවීම | 0.100 | - | - | - | - | - |
| 1.11 | තීරණ ගැනිම සහ දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තා සහභාගීත්වය හා නියෝජනය වැඩිකිරීමේ ප්‍රවේශයක් වශයෙන් විශ්වවිද්‍යාල වල සිසු සිසුවියන් දැනුවත් කිරීම. | 0.450 | 0.300 | වැඩසටහන් 3 | - | | |
| 1.12 | වෙනත් | 0.025 | 0.011 | වැඩසටහන් 56 | 43 | | |
| **එකතුව** | | **2.850** | **0.781** | | | **227** | **98** |
| **මුළු එකතුව** | | **7.000** | **3.529** | | | **2085** | **1137** |




දුරකථන |தொலைபேசி | Telephone : 011-2186057

ෆැක්ස් | பெக்ஸ் | Fax : 011-2187249

වෙබ් අඩවිය | இணையத்தளம் | Website : https://www.childwomenmin.gov.lk

ඊමේල් | மின் தபால் | E- mail : secretary@childwomenmin.gov.lk